# නගර සභා ආදර්ශ අතුරු ව්‍යවස්ථා

# පටුන


I. අපද්‍රව්‍ය ඉවත්කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

II. ආහාර පාන විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

III. කටු පදුරුවලින් හා කුවණු කසළ වලින් තොරව ඉඩම් පවත්වා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

IV. ජල සම්පාදනය හා ජල කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

V. මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

VI. කිරි පට්ටි හා කිරි විකිණීම පිළිබඳ අතුරු ව්‍යස්ථාව

VII. පදිකයන්ගේ සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

VIII. පුස්තකාල පිලිබඳ අතුරු ව්‍යවස්ථාව

IX. පෞද්ගලික ඉඩම් වල ලිං පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

X. භෝජනශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

XI. වසංගත රෝග සහ ස්පර්ශක රෝග පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

XII. පෞද්ගලික වැසිකිළි සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

XIII. පොදු වෙළඳපොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

XIV. නගර සභා බල ප්‍රදේශය තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

XV සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

XVI ගෙවල් සහ වාසස්ථාන ශුද්ධ පවිත්‍ර කිරීම සහ ඒවාට නිසි වාතාශ්‍රය ලැබීමට සැලැස්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

## I.අපද්‍රව්‍ය ඉවත්කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (13) උප වගන්තිය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට නගර සභාවලට බලය ලැබී ඇත.

2. නගර සභා බල ප්‍රදේශය තුළ අපද්‍රව්‍ය ඉවත්කිරීම විධිමත් කිරීම සඳහා ද, ඒ සම්බන්ධයෙන් ගාස්තු පනවා අයකිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස ද මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව "අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. නගර සභා බල ප්‍රදේශය තුළ සෑම කසළ ජනනය කරන්නෙක්ම, එක් රැස්වන කසළ බහාලීම සඳහා, ජෛවහායනය වන (දිරන) හා ජෛවහායනය නොවන (නොදිරන) අපද්‍රව්‍ය වෙනුවෙන් යටත් පිරිසෙයින් බහාලුම් දෙකක් තබාගත යුතුය. එකී බහාලුම් පියන් සහිත විය යුතු අතර, ඒවා දෛනිකව එක් රැස්වන අපද්‍රව්‍ය බහාලීම සඳහා ප්‍රමාණවත් බඳුන් විය යුතුය.

5. කිසිඳු අපද්‍රව්‍ය ජනනය කරන්නෙකු විසින් ඉහත 4වන වගන්තිය යටතේ එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය සමග; සායනික අපද්‍රව්‍ය, විෂ සහිත අපද්‍රව්‍ය හෝ ඉදිකිරීම් හෝ බිඳහෙළීම් හේතුවෙන් ජනනය වන අපද්‍රව්‍ය, ගස් අතු කපාදැමීමෙන් එක් රැස්වන අපද්‍රව්‍ය මිශ්‍ර නොකළ යුතුය.

6. අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් විශේෂයෙන්ම තත්කාර්ය සඳහා

වෙන් කර ඇති බඳුනකට හෝ වෙනත් වැසිය හැකි ඒ හා සමාන බහාලුමකට හැර වෙනත් කවර හෝ පෞද්ගලික දේපළකට හෝ පොදු මෙම අපදේපළකට මෙම අපද්‍රව්‍ය විවෘතව බැහැර කිරීම නොකළ යුතුය.

7. අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් තම අසල්වාසීන්ට පීඩාවිය හැකි ආකාරයට පරිශ්‍රය තුළ අපද්‍රව්‍ය එක්රැස් කිරීමක් නොකළ යුතුය.

8. අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් ස්වකීය පරිශ්‍රය තුළ අපද්‍රව්‍ය විවෘතව පිළිස්සීමක් නොකළ යුතුය.

9. ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ඉදිකිරීම් කඩා ඉවත් කිරීමෙන් හෝ ගස් අතු කපා හෙලි පෙහෙලි කිරීමෙන් හටගනු ලබන අපද්‍රව්‍ය, අයිතිකරු හෝ පදිංචිකරු විසින් පරිශ්‍රයෙන් බැහැර පොදු ස්ථානයක හෝ පෞද්ගලික ස්ථානයක එක් රැස් කර තිබෙන්නට හැරීම නොකළ යුතුය.

10. නගර සභාවක් විසින් ජෛවහායනය වන සහ ජෛවහායනය නොවන අපද්‍රව්‍ය අවම වශයෙන් සතියකට දෙවරක් පරිශ්‍රයෙන් පරිශ්‍රයට එකතු කිරීම කළ යුතු අතර, ඒ සඳහා නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන පිළිබඳ සියළුම අයිතිකරුවන් හා පදිංචිකරුවන් දැනුවත් කළ යුතුය.

11. යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන අපද්‍රව්‍ය පරිශ්‍රයෙන් පරිශ්‍රයට එක්රැස්කිරීමේ සේවාවට අනුගත වෙමින්, ජෛවහායන හා ජෛවහායන නොවන පරිදි වෙන් වෙන්ව එක් රැස් කළ අපද්‍රව්‍ය, නගර සභාවේ කසළ එක්රැස්කරන්නන්ට භාර දිය යුතු අතර, ඒ තාක් කිසි විටෙකත් එසේ එක් රැස් කරන ලද අපද්‍රව්‍ය ඒවා දමා තිබෙන බඳුන් තුළින් බාහිර පරිසරයට මුදාහැරීමක් නොකළ යුතුය.

12. එසේවුවද යම් පරිශ්‍රයක එක් රැස්කළ ජෛවහායන සහ ජෛවහායන නොවූ අපද්‍රව්‍ය, නගර සභාවේ කසළ එක්රැස්කරන්නන්ට පහසුවෙන් ලබාගත හැකි

ආකාරයට සංවෘත භාජන තුළ බහා ස්වකීය පරිශ්‍රයේ තබා තිබීම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන නිවැරදි අපද්‍රව්‍ය භාරදීමක් වශයෙන් සැලකිය හැකිය.

13. යම් පරිශ්‍රයක ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ඉදිකිරීම් කඩා ඉවත් කිරීමෙන් හෝ ගස් හෝ අතු කපා දැමීමෙන් හෝ නිෂ්පාදන ක්‍රියාවලියක අතුරු ප්‍රතිඵල වශයෙන් බැහැරලන අපද්‍රව්‍ය හා, වාණිජ ව්‍යාපාරයක ව්‍යාපාර කාර්යයන් යටතේ එක්රැස්වන අපද්‍රව්‍ය ද නගර සභාව විසින් බැහැර කිරීම සඳහා භාරගත හැකි අතර, ඒ සඳහා අයකළ යුතු නියමිත ගාස්තු නගර සභාව විසින් කළින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කර ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

14. ඉහත සඳහන් පරිදි 13වන වගන්තිය යටතේ අයවිය යුතු නියමිත ගාස්තු අය කර ගැනීමෙන් පසු කිසියම් පරිශ්‍රයක එක්රැස්වන ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ඉදිකිරීම් කඩා ඉවත්කිරීම් හෝ ගස් හෝ අතු කපා දැමීමෙන් එක් රැස්වන අපද්‍රව්‍ය හෝ නිෂ්පාදන ක්‍රියාවලියක අතුරු ප්‍රතිඵල වශයෙන් බැහැර කරන ලද අපද්‍රව්‍ය හා වාණිජ ව්‍යාපාරයක ව්‍යාපාර කාර්යයන් යටතේ හටගන්නා අපද්‍රව්‍ය ද බැහැර කිරීම සඳහා භාරගැනීම, නගර සභාව විසින් කළ යුත්තේය.

15. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වීම පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයා හෝ ඔහු විසින් නිශ්චිතව ඒ සඳහා බලය පැවරූ නිලධරයෙකු පරිශ්‍රයකට ඇතුල් වීම නීත්‍යානුකූල වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම, එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසුව 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ

දඬුවමකට යටත් විය යුතුය.

17. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ -

"අපද්‍රව්‍ය" යන්නෙන් යම් පරිශ්‍රයක සිදුවන ගෘහ ක්‍රියාකාරකම් හේතුවෙන් බැහැර කිරීම සඳහා එක්රැස්වන දේ හෝ පරිශ්‍රය අතුගෑමෙන් ඉවතලන කුණුරොඩු ආදී දේ ද;

"පරිශ්‍රය" යන්නෙන් නිවසක්, නිවෙස් සමූහයක්, සාප්පුවක්, කර්මාන්තශාලාවක්, වැඩපළක්, ආපනශාලාවක්, වෙනත් යම් ව්‍යාපාරයක් හා ඒවාට අනුබද්ධිත භූමියක් ද;

සභාපති" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තාද;

"බලයලත් නිලධාරියා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු ද;
අදහස් වේ.

## II.ආහාර පාන විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (9) (ක) ඡේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට නගර සභාවලට බලය ලැබී ඇත.

2. නගර සභා බලප්‍රදේශය තුල හෝටල්, සාප්පු හා පොදු වෙළදපලවල් නොවන ස්ථානවල සංචාරක වෙළදුන් විසින් ආහාර පාන විකිණීම විධිමත්කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම උදෙසා මෙම අතුරු ව්‍යස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ආහාර පාන විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ

4. නගර සභාව සතු පොදු වෙළඳපලක, නගර සභා බල ප්‍රදේශයේ බලපත්‍ර ලත් හෝටලයක හෝ සාප්පුවක හැර වෙනත් යම් ස්ථානයක හෝ භාජනයක, පෙට්ටියක හෝ වෙනයම් ආධාරකයක, මැස්සක, පාපැදියක, යතුරු පැදියක, කරත්තයක, අත් කරත්තයක හෝ වාහනයක තබාගෙන තැනින් තැනට යමින් හෝ යම් ස්ථානයක නතර වී හෝ ආහාර පාන විකිණීම, එසේ විකිණීම සඳහා තබාගැනීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කරනු ලබන සෑම තැනැත්තකුම මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 24 වන වගන්තියෙහි දැක්වෙන නියමිත ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතුය.

5. සංචාරක වෙළදාමේ ඇතුලුව යම් ස්ථානයක ආහාර පාන විකිණීම, විකිණීම සඳහා තබා ගැනීම හෝ ප්‍රදර්ශනය කිරීම කරන සෑම තැනැත්තකුම පහත සඳහන් නියමයන් පිළිපැදිය යුතුය.

(1) සියලුම ආහාර ද්‍රව්‍ය දුහුවිල්ලෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් රෝග කාරක කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි ස්ථිර ද්‍රව්‍යයකින් සාදන ලද පෙට්ටියක, අල්මාරියක හෝ භාජනයක අසුරා තබා ගැනීම ;

(2) ආහාර ද්‍රව්‍ය බහාලන පෙට්ටිය, අල්මාරිය හෝ භාජනය වසා තැබිය හැකි ස්ථිර පියන් පත් වලින් යුක්ත විය යුතු අතර, සෑම විටකම පියන් පත් වසා තැබීම;

(3) ආහාර ද්‍රව්‍ය විකිණීම කරන යම් ස්ථානයක් වැස්සෙන් අව්වෙන් හා දුහුවිල්ලෙන් ආරක්ෂිත වූ කැලිකසල වලින් තොර නිරන්තරයෙන් පවිත්‍ර කරන ලද ස්ථානයක් වීම;

(4) ආහාර ද්‍රව්‍ය විකිණීම සංචාරක වෙළදාම මගින් කරනු ලබන්නේනම්, එසේ ආහාර පාන සහ අලෙවි කරන ස්ථානය නගර සභාවේ අතුරු ව්‍යවස්ථා අනුව රථවාහන නවතා තැබීමේ ගාස්තු අය කෙරෙන ස්ථානයක් වන්නේනම්, ඒ සඳහා නියමිත රථවාහන නවතා තැබීමේ ගාස්තු ගෙවීම;

(5) ආහාර පාන විකිණීම සංචාරක වෙළෙදාම මගින් සිදු කරන විටක බස් හෝ දුම්රිය නැවතුම් පලක නවතා ඇති හෝ මහා මාර්ගයේ ධාවනය වන මගී ප්‍රවාහන රථයක් තුල වෙළෙදාම් කරන්නේ නම් අදාල පරිදි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ හෝ බස් රථ හිමිකරුගේ අවසර ලබා තිබීම;

(6) යම් වීදියක මංමාවතක පොදු ස්ථානයක හෝ ඒ අසල ආහාර පාන වෙළඳාමෙහි යෙදී සිටින යම් තැනැත්තෙකුට එකී ස්ථානයෙන් ඉවත්වන ලෙස නගර සභාවේ බලයලත් නිලධාරියකු, කවර හෝ පොලිස් නිලධාරියකු නියම කරන්නෙනම් එකී තැනැත්තා වහාම එම ස්ථානයෙන් ඉවත් වීම;

(7) ආහාර ද්‍රව්‍ය විකිණීමේ දී ගනුදෙනුකරුවන්ට ආහාර පාන පිරිනැමීම උදෙසා මල නොබැදෙන ලෝහයෙන් තැනූ පිරිසිදු බන්දේසියක් හෝ පිඟන් මැටියෙන් හෝ වීදුරු වලින් නිර්මිත පිගන් කෝප්ප හා වීදුරු භාජන භාවිතා කිරීම;

(8) ආහාර ද්‍රව්‍ය ඉවතට රැගෙන යාම සඳහා විකිණීමේදී පිරිසිදු දවටනයක හෝ කවරයක බහා අලෙවි කිරීම;

(9) පාරිභෝගිකයන්ට ඒ අවස්ථාවේදීම පරිභෝජනය සඳහා ආහාර පාන පිරිනමන්නේ නම් ඒ සඳහාම වෙන් වූ පිරිසිදු භාජන භාවිතා කිරීම;

(10) පරිභෝජනයෙන් පසුව, භාවිතා කර ඉතිරි කරන ආහාර කොටස් බැහැර කිරීම සඳහා තැන්පත් කොට තැබීමට, ඝණ අපද්‍රව්‍ය බහාලීම සඳහා වෙන්වූ පියන් පතක් සහිත භාජනයක් තිබිය යුතු අතර, එහි එකතු වන අපද්‍රව්‍ය නගර සභාවේ නියමයන් අනුව බැහැර කිරීම;

(11) ආහාර පාන පරිභෝජනයට පෙර හා පසුව අත් සේදීම සඳහා පිරිසිදු ජලය හා සබන් සපයා තිබීම; සහ

(12) ආහාර පාන විකිණීම සඳහා 4 වන වගන්තිය යටතේ ලබාගත් බලපත්‍රය වෙළදාම්කරන සෑම අවස්ථාවකම තමා සන්තකයෙහි තබා ගැනීම.

6. නගර සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද සංචාරක වෙළදාම සඳහා වන වලංගු බලපත්‍රයක් ලබාගෙන ඇති කිසිම තැනැත්තකු විසින් සංචාරක බලප්‍රදේශය තුල සංචාරක වෙළදාමේ යෙදීමේ දී, හෝටලයක, සාප්පුවක, වෙළදපොලක, පදික වේදිකාවක හෝ වෙනත් බලපත්‍රලත් ව්‍යාපාරික, කර්මාන්ත හෝ වෙළඳ ස්ථානයක සංචාරක වෙළදාම නොකළ යුත්තේය.

7. විධිමත් බලපත්‍රයක් ලබා ඇත්තේ වුවද, කිසිම තැනැත්තකු විසින් මංමාවතක ධාවනය කෙරෙන රථවාහනවලට හෝ මංමාවතක, පදික වේදිකාවක, පිවිසුම් මාර්ගයක, පයින් ගමන් කරන්නන්ට අවහිර බාධා හෝ අනතුරු සිදුවන ආකාරයට වෙළදාම් නොකළ යුතුය.

8. කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙලෙන හෝ මෑතකදී පෙලෙමින් සිටි හෝ එවැනි අයකුට සාත්තු කළ අයකු හෝ එකී රෝග ආසාදන හා බීජ පෝෂණ කාල සීමා ඉකුත්ව ඇත්තේ නම් මිස ආහාර පාන වෙළදාමෙහි නොයෙදිය යුත්තේය.

9. ආහාර පාන වෙළදාමෙහි යෙදෙන කිසිම තැනැත්තකු ආහාර පාන විකිනීම සඳහා -

(1) බලපත්‍ර ලත් ස්ථානයෙන් හෝ ප්‍රදේශයෙන් බැහැර ස්ථානයකට හෝ,

(2) පාසල්, රෝහල්, රජයේ කාර්යාල, නිල නිවාස, අධිකරණ පරිශ්‍රයන් තුලට හෝ

ඇතුලු නොවිය යුතුය.

10. ආහාර පාන විකිණීමේ යෙදී සිටින කිසිදු තැනැත්තකු විසින්, එකී ආහාර පාන ඒ තත්ත්වයෙන්ම තබා ගැනීම හෝ ආකර්ශනීය ලෙස සැකසීම උදෙසා එකී ආහාර පාන සෞඛ්‍යයට අහිතකර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් හෝ දියරයක් සමග මිශ්‍ර කිරීම, පාට කිරීම, පෙඟවීම, එන්නත් කිරීම, ඉසීම හෝ කුඩු කිරීම නොකළ යුතු අතර එසේ කරන ලද ආහාර පාන අලෙවි නොකළ යුතුය.

11. කල් ඉකුත් වූ හෝ නරක් වූ හෝ මිනිස් පරිභෝජනයට නුසුදුසු වූ ආහාර පාන ශීතකරන වල තබා ගැනීම, ප්‍රති සැකසුම් කිරීම, හොඳ තත්ත්වයේ ඒවා සමග මිශ්‍ර කිරීම හෝ ලඟ තබා ගැනීම නොකළ යුතුය.

12. ආහාර පාන අලෙවිකරන ස්ථාන වල හා ඒ අවට බල්ලන්, බළලුන්, ඌරන්, එළුවන්, ගවයන්, මීයන් හෝ වෙනත් සතුන්ට ගැවසීමට ඉඩ නොදිය යුතුය.

13. ආහාර පාන විකිණීමෙහි සංචාරක වෙළෙන්දකු ලෙස යෙදෙන කිසිම තැනැත්තකු විසින් පාපැදියක, යතුරු පැදියක, හිසමත හෝ දෑත් මත තබාගෙන යනු ලබන ආහාරපාන බහාලූ පෙට්ටියේ හෝ භාණ්ඩයේ පැත්තක දිග මීටර් 0.75 කට වැඩි නොවිය යුතුය.

14. ආහාර පාන විකිණීමෙහි යෙදී සිටින්නෙකු කිසිදු විටක සිය වෙළෙඳ ප්‍රචාරය උදෙසා මෙගා ෆෝන්, ලවුඩ්ස් පීකර්, ශබ්ද විකාශන යන්ත්‍ර, ඇම්පිලි පයර්, දීප්තිමත් ආලෝක විහිදුවන විදුලි උපාංග භාවිතා නොකළ යුතුය.

15. ආහාර පාන විකිණීමෙහි යෙදී සිටින කවර හෝ තැනැත්තකු සුරා බදු ආඥා පනත යටතේ ගැනෙන මත් පැන් ලඟ තබා ගැනීම හෝ විකිණීම නොකළ යුතුය.

16. ආහාර පාන විකිණීම සම්බන්ධයෙන් මහජනතාවගෙන්, සිවිල් සංවිධාන වලින් හෝ වෙනත් ඕනෑම අයකුගෙන් ලැබෙන පැමිණිලි නගර සභාව විසින් ලේඛනගත කළයුතු අතර, එකී පැමිණිලි සඳහා නිසි පියවර ගැනීම නගර සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

17. වසංගත රෝග හෝ වෙනත් බෝවන රෝග තත්වයක් පැතිර යාමේ අවදානමක් ඇති බවට ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් වාර්තා කර ඇති අවස්ථාවකදී -

(1) ආහාර පාන විකිණීමට යම් අයකුට දී ඇති බලපත්‍රය අවලංගු කිරීමට හෝ නිශ්චිත කාලයකට අත්හිටු වීමට; හෝ

(2) බල ප්‍රදේශයෙහි කිසියම් කොට්ඨාසයක ආහාර පාන අලෙවිය තහනම් කිරීමට හෝ

නගර සභාවේ සභාපතිවරයාට බලය ඇත්තේය.

18. ඉහත කී 17 වන වගන්තිය යටතේ ක්‍රියා කිරීම හේතු කොට ගෙන යම් තැනැත්තකුට වන අලාභ හෝ පාඩු පියවීමෙහි වගකීමෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා සහ සභාපතිවරයා නිදහස් වන්නේය.

19. ආහාර පාන විකිණීමෙහි යෙදී සිටින ඕනෑම අයකුගෙන් අලෙවිය සඳහා තබා ඇති ආහාර පාන වලින් යම් ප්‍රමාණයක් නගර සභාවේ සභාපතිවරයා හෝ

බලයලත් නිලධාරියකු විසින් එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යනුකූල වන්නා සේම එකී භාණ්ඩ අලෙවි කිරීම යමෙකු විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

20. ආහාර පාන වෙළඳාමෙහි නියුක්ත ඕනෑම ස්ථානයකට ඇතුලු වී මෙම අතුරු ව්‍යවස්ථාවෙහි විධිවිධාන පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියකුට බලය ඇත්තේය.

21. ඉහත කී 20 වන වගන්තිය යටතේ පරීක්ෂණයට භාජනය කරන ලද යම් ආහාර පාන වර්ගයක් මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බව පෙනී ගියහොත් එය තහනමට ගෙන ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා වෙත යැවීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය ඇත්තේය.

22. ඉහත කී 21වන වගන්තිය යටතේ තහනමට ගෙන තමා වෙත ඉදිරිපත් කරන ලද ආහාර පාන මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා සහතික කරන ලද්දේනම්, එම ආහාර පාන තොගය තහනමට ගෙන එහි හිමිකරුට හෝ අලෙවිකරුට අලාභ හෝ වන්දි ගෙවීමකින් තොරව ඒවා විනාශ කරන ලෙසට සභාපතිවරයා විසින් නියෝග කරනු ලැබිය යුතුය. එවන් නියෝගයක් ලද වහාම එකී ද්‍රව්‍ය තොගය අදාල බලධාරීන් ඉදිරියේ දී විනාශ කිරීමට හිමිකරු හෝ අලෙවිකරු කටයුතු කළ යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ ආහාර පාන විකිණීමේ බලපත්‍රයක් ලබා ගැනීමට අයදුම් කරන සෑම තැනැත්තකුම, නගර සභාව විසින් යෝජනා සම්මතයකින් තීරණය කර වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රයෙහි පලකරන ලද බලපත්‍ර ගාස්තුව නගර සභාවට ගෙවිය යුත්තේය.

24. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම එය කලින් අවලංගු කරනු නොලැබුවහොත් එය නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනයෙන් අවසන් වන්නේය.

25. ඉහත 24 වන වගන්තියේ කුමක් සඳහන් වුවද, මහජනයා ඒකරාශීවන පෙරහැරක්, ආගමික හෝ සංස්කෘතික උත්සවයක්, සංදර්ශනයක්, ක්‍රීඩා උළෙලක් පැවැත්වෙන කාල සීමාවකට සීමා වන සේ තාවකාලික සංචාරක ආහාරපාන වෙළෙඳාමට බලපත්‍ර නිකුත් කිරීමට නගර සභාවේ සභාපතිවරයාට බලය ඇත්තේය.

26. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරද කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසුව 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේනම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ -

"සභාපති" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තාද;

"ආහාරපාන" යන්නෙන් මස්, මාලු, කුකුළු මස්, එලවලු, පිසින ලද ආහාර, තිරිඟු පිටි, සහල් පිටි, හෝ වෙනත් පිටිවර්ගයකින් සාදන ලද ආහාර ද්‍රව්‍ය, රස කැවිලි හෝ පැනිරස කැවිලි, බදිනලද ආහාර,

පලතුරු, සකස්කළ පලතුරු, ලෙලි ගසන ලද, පොතු ගලවන ලද හෝ අන්‍යාකාරයකින් පරිභෝජනයට සකස් කළ පලතුරු හෝ එලවලු, සරුවත්, කොළකැද, පැණි බීම, කිරි, යෝගට්, මීකිරි හෝ මනුෂ්‍ය ආහාරයට ගනු ලබන සේ සකස් කළ නරක්වන සුලු සියළුම ආහාර පාන වර්ග ද; සහ

"බලයලත් නිලධාරියා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු ද;
අදහස් වේ.

## III.කටු පදුරුවලින් හා කුවණු කසළ වලින් තොරව ඉඩම් පවත්වා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 157 (9) (ඩ) ජේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථා සෑදීමට නගර සභා වලට බලය ලැබී ඇත.

2. නගර සභා බල ප්‍රදේශය තුල පවත්නා සියලුම ඉඩම් කටුපදුරුවලින් හා කුණු කසල වලින් තොරව පවත්වාගෙන යාම විධිමත් කිරීම හා පාලනය කිරීම උදෙසා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව කටු පදුරුවලින් සහ කුණු කසල වලින් තොරව ඉඩම් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හදුන්වනු ලැබේ.

4. නගර සභා බල ප්‍රදේශය තුල පවත්නා සියලුම ඉඩම්වල අයිතිකරුවන්, භාරකරුවන් හෝ පදිංචි කරුවන් විසින් තම තමන්ගේ ඉඩම් කටු පදුරුවලින් හා කුණු කසල වලින් තොරව පවත්වාගෙන යාමටද එකී ඉඩම්වල තිබෙන වාසස්ථාන සහ මිදුල් පිරිසිදුව හා සෞඛ්‍ය ආරක්ෂිතව පවත්වා ගැනීමටද කටයුතු කළ යුතුය.

5. කිසියම් ඉඩමක් කටු පදුරුවලින් හා කුණු කසල වලින් යුක්ත වන්නේද යන්න තහවුරු කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර කාලයේදී සභාපතිවරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුට එකී ඉඩමට ඇතුළත්වී පරික්ෂා කිරීමට බලය වන්නේය. එවැනි කිසියම් පරීක්ෂා කිරීමකට කවර හෝ තැනැත්තෙකු විසින් බාධා නොකළ යුතුය.

6. කිසියම් ඉඩමක් කටු පදුරුවලින් හා කුණු කසල වලින් යුක්ත වන බවට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා සෑහිමකට පත්වී ඇති කවර හෝ අවස්ථාවක දී එකී ඉඩම් කටුපදුරුවලින් හා කුණු කසලවලින් තොරව තබාගන්නා ලෙසට එකී ඉඩමේ අයිතිකරුට, භාරකරුට හෝ පදිංචිකරුට ලිඛිතව දැන් වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

7. ඉහත 06 වන වගන්තියේ සඳහන් ආකාරයේ කිසියම් දැන්වීමක් ලැබුණු කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ දින සිට දින දහ හතරක් ගතවීමට මත්තෙන් එකී ඉඩමේ කටුපදුරු හා කුණු කසල ඉවත් කිරීම කළ යුතු ය.

8. කෙසේ වුව ද අයිතිකරු හෝ පදිංචිකරු විසින් පිළිගතහැකි හේතු ඉදිරිපත් කෙරෙන ලිඛිත ඉල්ලීමක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක එකී කාර්යය සඳහා නියම කරන ලද

කාලය ඉහත කී දැන්වීමේ දින සිට දින 30ක උපරිමයකට යටත්ව දීර්ඝ කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් කරනු ලැබිය හැකිය.

9. කිසියම් ඉඩමකින් ඉවත් කරනු ලැබූ කටුපදුරු හෝ කටුපදුරුවල කොටස් හෝ කුණු කසළ පොදු ස්ථානයකට හෝ මාර්ගයකට දැමීම නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තකුට අයත් ඉඩමකට එකී තැනැත්තාගේ අවසරයකින් තොරව දැමීම ද නොකළ යුතු ය.

10. තම ඉඩමේ ප්‍රමාණවත් ඉඩකඩක් පවතින්නේනම් එහි කිසියම් ඉඩමකින්ඉවත් කරනු ලබන කටු පදුරු හෝ කුණු කසළ මීටර් එකකට නොඅඩු ගැඹුරින් යුතු වලක වැළලිය යුතුය.

11. කිසියම් ඉඩමකින් ඉවත් කරනු ලබන කටු පදුරු හෝ කුණු කසල නගර සභාව විසින් බැහැර කිරීම සඳහා භාරගත හැකි අතර, ඒ සඳහා අයකළ යුතු නියමිත ගාස්තු නගර සභාව විසින් කළින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කර ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

12. ඉහත සඳහන් පරිදි 11වන වගන්තිය යටතේ අයවිය යුතු නියමිත ගාස්තු අය කර ගැනීමෙන් පසු කිසියම් පරිශ්‍රයකින් ඉවත් කරනු ලබන කටු පදුරු හෝ කුණු කසළ බැහැර කිරීම සඳහා භාරගැනීමද, නගර සභාව විසින් කළ යුත්තේය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවන ආකාරයෙන් කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එසේ වරද කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක්

විසින් වරදකරු කිරීමෙන් පසු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මේ අතුරු ව්‍යවස්ථාවේ

"සභාපති" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තා ද,

"අයිතිකරු හෝ පදිංචිකරු" යන්නෙන් නගර සභා බලප්‍රදේශය තුළ ඇති කිසියම් ඉඩමක නිත්‍යානුකූල අයිතිකරු, භාරකරු හෝ එකී ඉඩමේ පදිංචිය යම් තැනැත්තෙකු හෝ එම ඉඩමේ පිහිටි ආයතනයක් පවත්වාගෙනයන තැනැත්තන් ද අදහස් වන අතර රජයට අයත් යම් ඉඩමක්,ගිවිසුමක් යටතේ බද්දට හෝ කුලියට ගෙන සිටින යම් තැනැත්තෙකු ද;

'කටුපඳුරු' යන්නෙන්, අලංකාරය පිණිස වවනු ලබන කිසියම් මල් පඳුරක් හෝ ආර්ථික හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා වවනු ලබන හෝ ඉබේ වැවෙන කිසියම් තැනැත්තකුගේ පාලනයකින් තොරව පොළොව මට්ටමෙන් සෙන්ටිමීටර් 20 කට වඩා උසින් යුතුව ඉබේ වැවෙන කිසියම් ශාකයක් හෝ ශාක වර්ගයක්; ද,

"පොදු ස්ථානය" යන්නෙන් කිසියම් මාර්ගයක්, මංමාවතක්, විථියක්, පටු මගක්, දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක් මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසානභූමියක්, බස්නැවතුම්පොලක්, දුම්රිය ස්ථානයක්, ඇලක්, දොලක්, වැවක්, පොකුණක්, කළපුවක්, දිය කඩිත්තක්, දිය පාරක්, වැසි ජල කාණුවක්, මුහුදු වෙරලක්, සභාව සතු යම්

ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන් කර ඇති රජය සතු යම් ඉඩමක් හෝ මහජනයාගේ පොදු පරිහරණයට වෙන් කළ වෙනත් ඕනෑම ස්ථානයක්; ද;

“බලයලත් තැනැත්තා” යන්නෙන් තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති නගර සභාවේ නිලධාරියකුව,
“සභාව” යන්නෙන්,අදාල නගර සභාව ද,

අදහස් විය යුත්තේය

## IV.ජල සම්පාදනය හා ජල කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157වන වගන්තියෙහි (12) (ඌ) ඡේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථා සෑදීමට නගර සභා වලට බලය ලැබී ඇත.

2. පොදු ජනතාවගේ සැප විහරණය සැප පහසුව හා සුභ සාධනය ප්‍රවර්ධනයෙහිලා නගර සභාව සතු කාර්ය භාරය සාක්ෂාත් කරනු පිණිස නගර සභාව විසින් පිහිටුවන ලද හෝ නඩත්තු කරනු ලබන ජල කර්මාන්තයකින් ජල සම්පාදනය, විධිමත් කිරීම, පාලනය කිරීම, නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීමද, ජලය අපතේ යෑම, අපවිත්‍රවීම හා අනිසි භාවිතය වැලැක්වීමද, ජල සැපයුමට භාවිත කරනු ලබන ද්‍රව්‍ය හා උපාංගවල හා සවිකිරීම් වල ප්‍රමිතීන් නිශ්චය කිරීම ද, ජල සැපයුම සඳහා ගෙවිය යුතු ගාස්තු

නියම කිරීම සහ ජල කර්මාන්තයට අදාල වූ සියලු අනුශංගික විධිවිධාන පැනවීම ද සදහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ජල සම්පාදනය හා ජල කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හදුන්වනු ලැබේ.

## පෞද්ගලික ජල සේවා

4. නගර සභාව විසින් පිහිටුවන ලද හෝ නඩත්තු කරනු ලබන ජල කර්මාන්තයකින් පෞද්ගලික ජල සේවාවක් ලබාගැනීමට අපේක්ෂාකරන සෑම තැනැත්තෙකුම, සභාව විසින් නියම කර ඇති විධිමත් අයදුම්පත්‍රයක් සම්පූර්ණ කොට සභා ලේකම් වරයා වෙත භාර දිය යුතුය.

5. පෞද්ගලික ජල සේවය ලබාගැනීමට අපේක්ෂිත ස්ථානයෙහි පහත සඳහන් නියමයන් අනුව ජල පරිහරණ විධිවිධාන අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

(1) පෞද්ගලික ජල සේවයක් ඉදිකිරීම සඳහා එකී ස්ථානයෙහි භාවිතා කරන සියලුම ජලනල, පී.වී.සී. ද්‍රව්‍ය වලින් තනන ලද, ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලත් වර්ගයක හා බලය ලත් නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ ඇති ජල නල වර්ගයක ඒවා විය යුතුය.

(2) භාවිතා කරනු ලබන ජල කරාම, විරාම කරාම හා අනෙකුත් සියලු උපාංග පිළිගත් ප්‍රමිතියකින් යුත් අනුමත වර්ගයේ ඒවා විය යුතුය.

(3) සෑම ජල කරාමයකම අපමුඛය විවෘතවූද පැහැදිළිව පෙනෙනවූද එකක් වියයුතු අතර එය ජලය වැස්සෙන

ටැංකියක, බේසමක හෝ මොනයම් භාජනයක හෝ ඉහළම ජල මට්ටමට උඩින් පිහිටන සේ සවිකර තිබිය යුතුය.

(4) ජල සේවයට සවිකර ඇති උපාංග හා ජලනල වල වැද්දුම්, සන්ධි කිරීම් හෝ පෑස්සුම් ජලය කාන්දු නොවන සේ තාක්ෂණික නියමයන්ට අනුව සකසා තිබිය යුතුය.

(5) සෑම නාන භාජනයක, වැසිකිළි බේසමක, සේදුම් හෝ සොරොව් බේසමක ප්‍රවේශ මුඛය හා අප මුඛය හොඳින් පෙනෙන තැනක තිබිය යුතු අතර ප්‍රවේශ මුඛය එකී භාජනයෙහි ඉහළම ජල මට්ටමට උඩින් පිහිටිය යුතුය.

(6) සභාවේ ජල කර්මාන්තයෙන් සැපයෙන ජලය යම් ජල ටැංකියකට හෝ භාජනයකට එක්රැස් වන පරිදි නිර්මිතයන් කර ඇත්තේ නම් එකී ටැංකියෙහි හෝ භාජනයෙහි විරාම කරාමයක්ද, සමතුලිත හා බෝල් වැල්වයක්ද සවිකර තිබිය යුතු අතර, එකී ටැංකියෙහි හෝ භාජනයෙහි පිටාර මට්ටමට සෙන්ටි මීටර 5 ක් තිබියදී ජල සැපයුම නවත්වන ආකාරයට බෝල් වැල්වය සවිකර තිබිය යුතුය.

(7) සෑම ජල ටැංකියකම හෝ ජල භාජනයකම පිටාර නලය ගොඩනැගිල්ලේ පිටතින් තිබිය යුතු අතර ජලය උතුරායාම පැහැදිළිව පෙනෙන තැනක එය සවිකර තිබිය යුතුය.

(8) නාන බේසම්, සේදුම් හෝ සොරොව් බේසම් සහ නාන කාමර වල අප ජලය, පිටත කානුවකට ගලා යන පරිදි පිටාර නල වෙන් වෙන්ව සවිකර තිබිය යුතුය.

(9) ගෘහස්ථ කාර්යය සඳහා සපයන ජලයෙන් යම් පරිමාවක් රැස්කර තබාගැනීමට, ජල ටැංකි හෝ ජල භාජන සවිකරන්නේ නම් එකී ජල ටැංකියෙහි හෝ ජල භාජනයෙහි ධාරිතාව ලීටර් 600 කට අඩු විය යුතුය.

(10) සෑම පෞද්ගලික ජල සේවාවකටම, සභාවේ ජල සම්පාදන ක්‍රමයෙහි ප්‍රධාන නලයෙන් ජල සම්බන්ධය ලබා දීමට හැකිවන සේ;

I. ඝණ පතුලකින් සමන්විත ශක්තිමත් පිත්තල හෝ අනුමත ලෝහයකින් තැනූ විරාම කරාමයක් හෝ
II. බුරුල් වැල්වයක් සහිත ශක්තිමත් ඉස්කුරුප්පු විරාම කරාමයක් හෝ
III. විශ්කම්භය සෙන්ටිමීටර් 5කට වැඩි නළයකින් ජලය සැපයෙන අවස්ථාවක ජල සොරොව්වක් හෝ ඝර්ෂණ කපාටයක් හෝ

සපයා සවිකර තිබිය යුතුය.

(11) ඉහත (10) හි සඳහන් විරාම කරාමය හෝ කපාටය සවි කිරීමේ දී පදික වේදිකාවක් ඇත්නම් ඊට යටින් සේවා සපයන ස්ථානයට හැකි තරම් ආසන්නව සවිකල යුතු අතර, සභාපති වරයා විසින් අනුමත කර ඇති වර්ගයක විරාම කරාමයක් හෝ කපාටයක් විය යුතුය.

(12) ඉහත (10) හි සඳහන් විරාම කරාමය පහසුවෙන් ලඟාවිය හැකි තැනක පිහිටුවන ලද අනුමත ලෝහයකින් තැනූ වැසුම් පෙට්ටියකින් සමන්විත විය යුතුය.

6. සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය කලින් ලබා නොගෙන: -

(1) නගර සභාවේ ප්‍රධාන ජල සැපයුම් නල වලින් හෝ ජල කර්මාන්ත වලින් යම් ස්ථානයකට ජලය සැපයෙන සේවා නලයක් සවිකිරීම හෝ ඊට අදාල කටයුතු කිරීම; හෝ

(2) නගර සභාවේ ජල නල වලට හෝ ජල කර්මාන්ත වලට දැනටමත් සම්බන්ධ කර ඇත්තා වූ සේවා නලයක් දීර්ඝ කිරීම, වෙනස් කිරීම, හෝ අලුත් කිරීම ද;
කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

7. ඉහත 6 වන වගන්තිය යටතේ සභාපතිවරයා විසින් අනුමත කරන ලද යම් කාර්යයක් සඳහා ඔහුගේ පූර්ව අනුමැතිය ලබා නොගත් යම් උපාංගයක්, උපකරණයක් හෝ සවිකිරීමක් භාවිතා නොකළ යුතුය.

8. යම් ස්ථානයක ජලය රැස් කර තබා ගැනීමේ කාර්යය සඳහා ඉදිකරනු ලබන ජල ටැංකිය හෝ ජල භාජනයේ සැලසුම් හා ප්‍රමිතිය සඳහා සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ඇත්නම් මිස, එවැනි ජල ටැංකියක් හෝ ජල භාජනයක් ඉදිකිරිම හෝ සවි කිරීම නොකළ යුතුය.

9. යම් ස්ථානයක භාවිතා කරන මොනම ආකාරයේ හෝ ජල පරිහරණ භාවිතයකින්, උපාංගයකින් පිටතට ගලායන ජලය යම් මලාපවාහන නලයකට හෝ සනීපාරක්ෂක උපකරණයක පිටාර නලයකට හෝ වෙනත් යම් ජල භාජනයක පිටාර නලයකට සම්බන්ධ නොකළ යුතුය.

10. කිසියම් ස්ථානයක ජල සැපයුම සඳහා ඉදිකර ඇති සේවා නල, ජල ටැංකි හෝ ජල භාජන වෙනත් යම් ස්ථානයක සේවා නල, ජල ටැංකි හෝ ජල භාජන වලට

හෝ පාසල්, ආගමික ස්ථාන සහ පොදු ස්ථානව සඳහා ස්ථාපනය කර ඇති ජල සැපයුමකට සම්බන්ධ නොකළ යුතුය.

11. ගෘහස්ත කාර්යය සඳහා ලබාගත් ජල සේවාවක් හෝ එහි කොටසක් යම් බොයිලේරුවකට, කන්ඩෙන්සරයකට හෝ යාන්ත්‍රික හෝ කාර්මික උපකරණයකට කෙලින්ම සම්බන්ධ නොකළ යුතුය.

12. සභාපතිවරයාගේ ලිඛිත අනුමැතියකින් තොරව, යම් ස්ථානයකට අලුතින් ඉදිකර ඇති ජල සේවාවක කොටසක් වන නල කපාට හෝ සවි කිරීම්, ඉවත් කිරීම්, වසා දැමීම නොකළ යුතුය.

## පොදු ජල කණු හා කරාම

13. මහජනතාවගේ සහ මගී ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ජලය සම්පාදනය කිරීම උදෙසා මංමාවතක් අසල හෝ මංසන්ධියක් අසල හෝ පාසල් ,ආගමික ස්ථාන සහ පොදු ස්ථානවල ස්ථාපනය කර ඇති ජල කණු හා කරාම වලින් -

    (1) තනි අතකින් උසුලාගෙන යා හැකි භාජනයක් නොවන භාජනයකට ජලය ලබා ගැනීම හෝ
    (2) හෝස් පයිප්ප, නල, තහඩු, පීලි ආදිය හෝ වෙනයම් උපක්‍රමයක් සම්බන්ධකොට ජලය ලබා ගැනීම හෝ

    නොකළ යුතුය.

14. කිසිදු තැනැත්තකු විසින් -

    (1) පොදු ජල කණු වලින් සැපයෙන ජලය අපතේ යන්නාවූ යම් ක්‍රියාවක් හෝ

    (2) පොදු ජල කණුවකට සවිකර ඇති ස්වයංක්‍රිය වැල්වයක් කරාමයක් හෝ වෙනත් ස්වයංක්‍රීය ජල පාලන උපකරණයක්

අක්‍රිය වන්නා වූ තාවකාලික ක්‍රියාකාරීත්වය නතර කරන්නා වූ ක්‍රියාවක් හෝ

නොකළ යුතුය.

15. ගෘහස්ත කාර්යයක් නොවන කාර්යයකට පොදු ජල කණු වලින් ජලය ලබා නොගත යුතුය.

16. පොදු ජලකණු වලින් හෝ ඒ අසල හෝ ස්නානය කිරීම, ශරීරය සේදීම, රෙදි පිළි, බඳුන් හෝ ගෘහ භාණ්ඩ සේදීම, සතුන්, වාහන ,කරත්ත නෑවීම හෝ සේදීම, ආහාර. මස් මාලු සහ එළවලු සේදීම නොකළ යුතුය.

17. යම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙලෙන කිසිම තැනැත්තකු හෝ එවැනි අයකුට සාත්තු කල කිසිම අයකු පොදු ජල කණු වලින් ජලය ලබා ගැනීම නොකළ යුතුය.

## නගර සභාවේ බලතල හා කාර්ය

18. ගෘහස්ත කාර්යයන් සඳහා හෝ ගෘහස්ත නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම නගර සභාවේ අභිමතය පරිදි ජලමාපකයක් මගින් හෝ වෙනත් ආකාරයකින් කරනු ලැබිය හැකිය.

19. සභාවේ ජල සම්පාදන ක්‍රමයක් මගින් ජලය සපයා ඇති කවර හෝ ස්ථානයකට කවර හෝ අවස්ථාවක ජල මාපක සවිකිරීම නගර සභාවට කල හැක්කේය.

20. ගෘහස්ත නොවන කාර්යයන් සඳහා ජලය සපයාගෙන තිබීම හේතුකොට ගෙන යම් ගෘහස්ත කාර්යයක් සඳහා ජල සැපයුමට බාධා ඇති වීමට ඉඩ

ඇත්නම් ජල සැපයුමට අත්සන් කල ගිවිසුමෙහි කුමක් සඳහන් වුවද, වන්දි අලාභ හෝ දණ්ඩන ගෙවීමකට යටත් නොවී එකී ජල සැපයුම අත්හිටුවීමට හෝ අඩු කිරීමට සභාපතිවරයාට බලය තිබේ.

21. පහත සඳහන් සිද්ධින් එකක් හෝ එකකට වැඩි ගණනක් සිදුවන අවස්ථාවලදී, යම් ස්ථානයකට සපයන ජලය නතර කිරීම, අත්හිටුවීම, අඩු කිරීම හෝ විසන්ධි කිරීම සභාපතිවරයා විසින් කල හැකි වන්නේය.

(1) ස්ථානයේ අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරුගේ ඉල්ලීම මත,

(2) ස්ථානයෙහි අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කර ඇති විට,

(3) ජල සම්පාදනය වෙනුවෙන් සභාවට ගෙවිය යුතු ජල ගාස්තු දින 21 කට වඩා හිඟ තබා ඇති විට, සහ

(4) ජල කර්මාන්ත වලට අලාභ කිරීම, ජලය අපවිත්‍ර කිරීම, නාස්ති කිරීම සහ අයුතු ලෙස පාවිච්චි කිරීමට අදාලවන්නා වූ යම් ක්‍රියාවක් ස්ථානයේ අයිතිකරු, බදුකරු හෝ පදිංචි කරු විසින් කර ඇති විට.

22. ජල සේවයක් සපයනු ලැබ ඇති ස්ථානයක අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු විසින් එකී සේවයෙහි කොටසක් වන කරාමයකින් , නලයකින්, මාපකයකින් හෝ වෙනයම් උපාංගයකින් ජලය අපතේ යාමක් සිදු වන බව අනාවරනය කරගත් වහාම එම දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. තමාට වහාම එසේ නිවැරදි කල නොහැකිවන විටෙකදී, ඒ බව අප්‍රමාදව  නගර සභාවේ සභාපතිවරයාට හෝ නිලධාරියකුට දැනුම් දිය යුතුය.

23. ඉහත 22 වන වගන්තිය පරිදි දැනුම් දීමකින් හෝ වෙනයම් අයුරකින් ජලය අපතේ යන බව දැනගත් වහාම සභාපතිවරයා විසින් බලය දෙනු ලැබූ නිලධාරියකු විසින් නගර සභා ජල සම්පාදයෙන් එකී ජල සේවය විසන්ධි කලයුතු අතර, එකී ස්ථානයේ පදිංචිකරු විසින් එකී අපතේ යාමට හේතු වූ දෝෂය නිවැරදි කරන තුරු ජල සම්බන්ධතාව නැවත සැපයීම නොකළ යුතුය.

24. ඉහත 23 වන වගන්තිය පරිදි විසන්ධි කරන ලද ජල සේවයක් නැවත සම්බන්ධ කිරීම සඳහා නගර සභාවට දැරීමට සිදුවන වියදම අයිතිකරු, පදිංචිකරු හෝ බදුකරු විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය.

25. ජල සම්පාදන සේවාව යටතේ යම් පාරිභෝගිකයකුගෙන් අය වීමට ඇති ජල බදු, මාපක ගාස්තු, කුලී හෝ ජල ගාස්තු අයකර ගැනීමට යටත්ව, යම් ප්‍රධාන ජල නලයක, බෙදුම් නලයක, වතුර මලක, පොදු ජල කණුවක හෝ සේවා නලයක ජල සම්පාදනය අත්හිටුවීමට, අඩු කිරිමට, වසා දැමීමට හෝ හැරවීමට පහත සඳහන් අවස්ථාවලදී සභාපතිවරයාට බලය තිබේ:

(1) ජල යෝජනා ක්‍රමයෙහි ජල පරිමාව ප්‍රමාණවත් නැති විටක;

(2) අලුත්වැඩියා කිරීම්, දිර්ඝ කිරීම් හෝ වෙනස් කිරීම් කල යුතු අවස්ථාවල;

(3) ජල සම්පාදනයෙහි යම් කනුවකට හෝ නලයකට සිදුවූ හානියක් මත ජලය අපතේ යාම වැලැක්විය යුතු අවස්ථාවල සහ

(4) ගින්නක්, නායයෑමක් හෝ වෙනත් සිද්ධියක් මත ජල කර්මාන්තයට හානියක් සිදුවන අවස්ථා වල.

26. ඉහත 25 වන වගන්තිය යටතේ ජල සැපයුම අත්හිටුවන, අඩු කරනු ලබන, වසා දැමීමට හෝ හැරවීමට හෝ සිදුවන අවස්ථාවල දී ජලය සැපයීමට අපොහොසත් වීම මත අලාභ හෝ වන්දි ගෙවීමට ප්‍රාදේශිය සභාව යටත් නොවන්නේය.

27. පෞද්ගලික ජල සේවාවක විරාම කරාමය හෝ වැල්වය ද, එකී විරාම කරාමය හා වැල්වයේ සිට ප්‍රධාන නලයේ සම්බන්ධතා සන්ධිය දක්වා වන සේවා නලයද, පොදු ජල කණු හා ඒවායෙහි උපාංගද, ජල මාපක හා ඒවාට අනුග්‍රහක උපාංගද ප්‍රාදේශිය සභාවේ දේපල වන අතර ඒවා නඩත්තුව හා අලුත්වැඩියාව සඳහා වන වියදම් සභා අරමුදලින් දැරිය යුතුය.

## පෞද්ගලික ජල සේවා ලබා දීම

28. මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය යටතේ පෞද්ගලික ජල සේවයක් සඳහා විධිමත් අයදුම් පත්‍රයක් ඉදිරිපත් කල විට එය සභාව විසින් ප්‍රමුඛතා ලේඛනයක සටහන් කොට අයදුම් පත්‍රය ඉදිරිපත් කොට සති තුනක් ඇතුලත දී බලය ලත් නිලධාරියකු විසින් කෙරෙන ක්ෂේත්‍ර විමර්ෂණ වාර්ථාවක් මත, සභාපතිවරයා විසින් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කලයුතු අතර ඒ බව ලිඛිතව අයදුම්කරුට දන්වා යැවිය යුතුය.
29. ඉහත කී 28 වන වගන්තිය යටතේ පෞද්ගලික ජල සේවයක් සඳහා ජල සැපයුම සභාපතිවරයා විසින් අනුමත කරනු ලැබූ පසු අයදුම්කරු විසින් -

(1) විධිමත් පරිදි තක්සේරු කරන ලද ජල සම්බන්ධතා ගාස්තු;

(2) ජලය සැපයීම වෙනුවෙන් නියමිත ආරක්ෂක ඇප තැන්පතු මුදල්; සහ

(3) නගර සභාව විසින් තීරණය කොට ඇති වෙනත් අතිරේක හෝ විශේෂ ගාස්තු ද;

නගර සභාව වෙත ගෙවා විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය

30. ඉහත 29 වන වගන්තිය යටතේ ගෙවිය යුතු සම්බන්ධතා ගාස්තු, ආරක්ෂක ඇප තැන්පතු, අතිරේක හෝ විශේෂ ගාස්තු හා මාසිකව පරිභෝජනය කෙරෙන ජල පරිමාව මත ගෙවිය යුතු ජල ගාස්තු යනාදිය නගර සභාව විසින් විධිමත් යෝජනා සම්මතයක් මගින් තීරණය කොට වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ගාස්තු ප්‍රමාණයන්ට අනුරූපී විය යුතුය.

31. ඉහත 30 වන වගන්තිය යටතේ යම් අයදුම්කරුවකු විසින් සභාව වෙත ගෙවන ලද ජල සම්බන්ධතා ගාස්තු එකී ජල සේවාව සැපයීම සඳහා යම් සුවිශේෂි හේතුවක් මත ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී ඒ සඳහා අතිරේක සම්බන්ධතා ගාස්තුවක් නගර සභාවට ගෙවන ලෙස නියම කල හැකි වන අතර එය අයදුම්කරු විසින් සභාව වෙත ගෙවිය යුතුය.

32. ඉහත 30 හා 31 යන වගන්ති යටතේ ගෙවිය යුතු සියලු මුදල් නිසි ලෙස නොගෙවන ලද හෝ සභාව සමග විධිමත් ගිවිසුමකට අත්සන් නොතබන ලද අයදුම්කරුවෙකු වෙනුවෙන් ජල සම්බන්ධතාව ලබා නොදිය යුතුය.

33. යම් ස්ථානයකට ජලය සැපයීම සඳහා ජල සම්පාදන ක්‍රමයට අයත් නල වලින් සේවා නලයට සම්බන්ධතාවය ලබා දිය යුත්තේ සභාවේ බලයලත් නිලධාරියකු විසින් පමණකි.

34. ජල මාපකයක් හරහා ජලය සපයනු ලබන සෑම ස්ථානයක් වෙනුවෙන්ම මාසයකට වරක් ජල මාපකයේ සටහන් වන ජල ප්‍රමාණයට අනුව සකසන ලද

ජල බිල්පතක් නගර සභාව විසින් ජල පාරිභෝගිකයා වෙත නිකුත් කල යුතුය.

35. අලුත්වැඩියා කිරීමක් හෝ වෙනත් මාපකයක් යෙදීමට ජල මාපකය ඉවත් කරනු ලබන විට, එහි අවසාන ගණනය කිරීමද සමග ජල බිල්පතක් පාරිභෝගිකයා වෙත නිකුත් කල යුතු අතර ජල මාපකය ඉවත් කල බවට දැන්වීමක් එම ස්ථානයේ ප්‍රදර්ශනය කල යුතුය.

36. ජල මාපකයක් ඉවත් කර ඇති කාලසීමාව තුල මාපකයක් රහිතව ජලය සැපයීම උදෙසා ගාස්තු අයකල යුත්තේ ඊට පෙර මාස 3ක ජල පරිභෝජනයෙහි සාමාන්‍ය දෛනික ගාස්තු මත පදනම්ව මාපක රහිතව ජලය සපයන ලද දින ගණන ගණනය කිරීම මතය.

37. ජල මාපකයෙහි නිරවද්‍යතාවය ගැන යම් පාරිභෝගිකයකු පරික්ෂා කිරීමක් අයදුම් කරන්නේ නම් ඒ පිලිබඳව සභාව විසින් අනුමත කොට ගැසට් පත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති පරීක්ෂණ ගාස්තු ජල පාරිභෝගිකයා විසින් සභාවට ගෙවිය යුතුය.

38. ඉහත 37 වගන්තිය පරිදි පරීක්ෂණ ගාස්තු සභාවට ගෙවීමෙන් පසුව බලයලත් නිලධාරියකු මගින් ජල මාපකය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳ වාර්තාවක් සභාපති විසින් ජල පාරිභෝගිකයාට ලබා දිය යුතුය.

39. ඉහත 38 වන වගන්තියේ සඳහන් පරීක්ෂණ වාර්තාව අනුව, මාපකයේ සඳහන් ජල ප්‍රමාණය හා සත්‍ය වශයෙන් පරිහරණය කල ජල ප්‍රමාණය අතර කිසියම් වෙනසක් වාර්තා වන්නේ නම් අදාල මාපකය නිවැරදි කරවීමට හෝ නව මාපකයක් සවිකරවීමට ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියා කලයුතුවේ. එසේ වාර්තාවන වෙනස සියයට තුනකට වැඩි වන්නේ නම් එකී වෙනසට අනුරූපව දැනටමත් පාරිභෝගිකයා වෙත නිකුත් කර ඇති අවසන් බිල්පත සංශෝධනය

කොට ඒ අනුව ජල බිල්පත් ගාස්තු අයකල යුතු අතර, පාරිභෝගිකයා විසින් ගෙවන ලද පරීක්ෂණ ගාස්තුව ද ඔහුට ආපසු ගෙවිය යුතුය.

40. ඉහත 39 වගන්තියේ විධිවිධාන අනුව මාපකයේ සඳහන් ජල ප්‍රමාණය හා සත්‍ය වශයෙන්ම පරිහරණය කල ජල ප්‍රමාණය අතර වෙනස සියයට තුනකට අඩු වන්නේනම්, නිකුත් කල ජල බිල්පත් සංශෝධනය කිරීම හෝ පරීක්ෂණ ගාස්තු ආපසු ගෙවීම අදාල නොවන්නේය.

41. මෙහි 21වන වගන්තිය පරිදි ජල සම්බන්ධයක් විසන්ධි කරන ලද අවස්ථාවකදී මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි දැක්වෙන මුදල් ගෙවීමෙන් අනතුරුව, නැවත ජල සේවා සම්බන්ධයක් ලබා දීමේ දී 29(1) වගන්තියේ සඳහන් සම්බන්ධතාවය යලි ලබා දීමට තීරණය කිරීමට සභාපතිවරයාට බලය තිබේ.

42. යම් ස්ථානයක ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පෙර එකී ඉදිකිරීම් කාර්යය සඳහා භවිතා කිරීමට තාවකාලික ජල සේවා සැපයුමක් ලබා ගත හැකි අතර, ඒ සඳහා 18 වන වගන්තියේ සිට 41 වන වගන්තිය දක්වා වන නියමයන් අදාල වන්නේය.

## භූගත ජල සේවා සැපයුම්

43. වෝල්ට් 500ක් හෝ එයට වැඩි ධාරිතාවයක් ඇති යම් ට්‍රාන්ස්පෝමරයක හෝ වෙනත් විදුලි බල උපකරණයක ආවරණයට සම්බන්ධවන සේ ජල සම්පාදන හෝ ජල සේවා කොටසක් වන නලයකට හෝ එම ජල පද්ධතියෙහි උපාංගයකට භූගත යම් සම්බන්ධයක් සවිකිරීම නොකළ යුතුවේ.

44. ඉහත 43 වන වගන්තියේ සඳහන් විදුලි උපකරණයක භූ තහඩුව හෝ භූගත සම්බන්ධකයෙහි යම් කොටසක සිට මීටර් හැටකට නොඅඩු දුරකින් ජල සම්පාදන හෝ ජල සේවා නලයක් භූමිය තුල නොපිහිටුවිය යුතුය.

45. ගුවන් විදුලි හෝ විද්‍යුත් උපකරණයකට හෝ උපාංගයක සම්බන්ධ භූගත සම්බන්ධක සවිකරනු ලබන අවස්ථාවක දී ජල සම්පාදනයෙහි හෝ ජල නලයෙහි සිට යම් කොටසක් වන උපකරණයකට හෝ උපාංගයකට සෙන්ටිමීටර් හැටකට නොඅඩු දුරකින් එය ස්ථාපනය කල යුතුය.

46. ප්‍රදේශීය සභාවේ ජල සම්පාදනයට සම්බන්ධ ජල මාපකයක් සවිකර ඇති ස්ථානයෙහි භූගත සම්බන්ධකයක් සවිකරන යම් තැනැත්තකු, මාපකයේ ඇතුලු පැත්තේ හෝ මාපකය හරහා දිවෙන විද්‍යුත් නැම්මක් සහිතව එය සවිකල යුතුය.

47. දුරකථන, විදුලි බල ගුවන් විදුලි හෝ රූපවාහිනී හෝ තොරතුරු තාක්ෂණික උපාංග හා උපකරණ වලට සම්බන්ධිත භූගත තහඩු, නල, කේබල් හෝ වයර් වලට ආසන්නව හෝ එකී භූගත උපාංග හා උපකරණ සමග සමාන්තරව හෝ ඒවා සමග ගැටෙන පරිදි ජල සම්පාදන හෝ ජල සේවා නල ස්ථාපනය නොකළ යුතුය.

48. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වු දඩුවමකට යටත් විය යුතුය.

49. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුර ව්‍යවස්ථාවේ -

"සභාපති" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තාද;

"බලයලත් නිලධාරියා" යන්නෙන් සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියකු ද;

අදහස් වේ.

# V.මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157වන වගන්තියෙහි (9) (ඍ) ඡේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට නගර සභාවලට බලය ලැබී ඇත.

2. මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම, සැප විහරන ක්‍රම ප්‍රවර්ද්නය හා ඊට අදාලව පීඩා වැලැක්වීමෙහිලා නගර සභාව සතු කාර්ය භාරය යටතේ මදුරුවන්ගෙන් බෝවන රෝග මර්ධනය කිරීම හා මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම ද පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි සෑම ස්ථානයකටම අයිතිකරු, බදුකරු, පදිංචිකරු හෝ එකී ස්ථානය පරිහරණය කරන්නන් විසින් මදුරුවන් හා රෝගකාරක කෘමීන්ගෙන් බෝවන රෝග මර්ධනය හා වැළැක්වීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ මතු දැක්වෙන නියමයන් පිලිපැදිය යුතුය.

5. සියලු ටින්, බෝතල්, පෝච්චි, පෙට්ටි, ප්ලාස්ටික් හෝ වෙනත් නොදිරන ද්‍රව්‍ය වලින් තැනූ බහාලුම් සහ කවර, ටයර්, පොල්ලෙලි, පොල්කටු, තැඹිළි සහ පොල් කෝම්බ, වළං කැබළි, කිරි හට්ටි හෝ ජලය රඳා පැවතීමට ඉඩ ඇති වෙනත් සියලුම භාණ්ඩ හා ඉවත දමන ලද අපද්‍රව්‍ය ඉවත් කරවීමට, විනාශ කරවීමට හෝ අන්‍යාකාරයකින් සාර්ථක ලෙස අපහරණය කිරීමට සැලැස්විය යුතුය.

6. සියලු වැහි පිහිලිවල, පහතට වැසි ජලය වැටෙන පයිප්පවල සහ කාණුවල ජලය ගලායාමට පවත්නා සියලු අවහිරතා ඉවත් කළ යුතුය.

7. සියලු ලිං, ජල ටැංකි හා ජල තටාක මනා පවිත්‍රතාවයෙන් හා ප්‍රතිසංස්කරණය කළ මට්ටමකින් පවත්වාගෙන යායුතු අතර, මදුරුවන් බෝවීම වළක්වාලන උපාය මාර්ග යොදා තිබිය යුතුය.

8. ජල බඳුන්, ජලටැංකි, සහ ජලය රැස්කරන්නා වූ සියලුම භාජන මදුරුවන්ගෙන් ආරක්ෂාවන පරිදි ආරක්ෂිත පියන්පත් වලින් වසා තැබීමට හෝ මදුරුවන් බෝ නොවන තත්ත්වයකින් පවත්වාගෙන යාමට ක්‍රියාකළ යුතුය.

9. කෘතිම පොකුණු හා අලංකාරය සඳහා ජලය රඳවා තබන සියලු නිර්මිතයන්වල අවම වශයෙන් දින 3 කට වරක්වත් ජලය හිස් කිරීමට කටයුතු කළ යුතුය.

10. ගල් වලවල්, පතල් වලවල්, අපජලය රැස් කරන වලවල් ඇතුලුව සියලුම ජලය රඳා පවතින ස්ථානවල ජලය එක් රැස්වීම වලක්වාලන විධිවිධාන යොදා තිබිය යුතුය.

11. කිසියම් ස්ථානයක් හරහා ගලා බස්නා සියලුම ගංගා, ජලමාර්ග, ඇලවල්, කාණු හා ජල මාර්ගවල, ජලය එක්රැස්වී පවතින දිය කඩිති ඇති වීම වලක්වාලීමට, එම ස්ථානය අයිතිකරු, භාරකරු හෝ පදිංචිකරු විසින් පියවර ගෙන තිබිය යුතුය.

12. වගා කටයුතු හෝ කෘෂි කාර්මික කටයුතු සහ අලංකරණය පිණිස වවන ලද පැළෑටි සහ ගස් කොලන් හැර සියලු ලදු කැළෑ, වල් පැලෑටි සහ නිෂ්ප්‍රයෝජන ගස් වැල් හා පැලෑටි ද තම භූමියෙන් ඉවත්කර විනාශකර තිබිය යුතුය. එසේ වුවද වගාව කෘෂිකර්මය හෝ අලංකාරය පිණිස වවන ලද පැළෑටියක හෝ ගසක ජලය එක් රැස් වන්නේ නම් එබඳු පැළෑටි ඉවත් කිරීමට හෝ එසේ ජලය එක් රැස්වීම වැළැක්වීමට පියවර ගෙන තිබිය යුතුය.

13. දිය පරඬැල්, කොළපාසි, තෙල් පාසි, ජපන් ජබර, බරවා පාසි වැනි සියලුම ගණයේ ජල මතුපිට පාවෙන ජලජ පැළෑටි හෝ මදුරුවන් බෝවීමට ඉඩ ඇති වෙනත් පැළෑටි විනාශ කළ යුතු අතර ඒවා ජල මාර්ග දිගේ පාවීයාම නතර කිරීමටද පියවර ගෙන තිබිය යුතුය.

14. වැසිකිළි වලවල්, දිය උරන වලවල් ඇතුලු සියලුම ස්ථාන මදුරුවන් බෝවීමට ඉඩ නොතැබෙන සේ පවත්වාගෙන යා යුතුය.

15. පොල්ලෙලි වලවල්, කාර්මික නිෂ්පාදන හෝ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා ඇතිකරන ලද සියලුම ආකාරයේ වලවල් මදුරුවන් බෝවීම වලක්වාලන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතුය.

16. සභාපතිවරයාගේ ලිඛිත අවසරය හා සභාවේ බලය ලත් නිලධාරියකු විසින් අනුමත කරන ලද සැලැස්මකට ද අනුකූලව සහ මදුරුවන් බෝවීම වැලැක්වීම පිළිබඳව ලබා දෙනු ලබන උපදෙස් වලට අනුකූලව මිස කිසිම තැනැත්තකු විසින් ළිඳක් හෑරීම, ජලටැංකි, පොකුණු, වතුරමල්, මාලු ටැංකි හෝ ජලය රඳවා තබන වෙනත් කිසිදු ආකාරයේ ඉදිකිරීමක් නොකළ යුතුය.

17. මංමාවත්, ගොඩනැඟිලි හා පොදු ස්ථාන වලටයාව පිහිටි ජලය බැස යාම සඳහා ඉදිකර ඇති කාණු, භූගතජල කාණු, ජලමාර්ග හෝ වෙනත් ජලාපවහන පද්ධතිවල ජලය ගලායාම අවහිර සේ කැළිකසල, අපද්‍රව්‍ය, අතුරිකිලි හෝ වෙනත් කිසිම ද්‍රව්‍යයක් ඒවාට විසි කිරීම හෝ බහාලීම නොකළ යුතුය.

18. නගර සභාව හෝ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ වෙනත් බලයලත් අධිකාරියක් හෝ බලයලත් නිලධාරියකු විසින් මැලේරියා හා ඩෙංගු වැනි රෝග මර්ධනය හා ව්‍යප්තිය වැළැක්වීම, සහ මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැලැක්වීම ද උදෙසා ගනු ලබන ක්‍රියාමාර්ගයකට කිසිදු බාධා කිරීමක් හෝ එකී කටයුතු වල කාර්යක්ෂමතාව හීන කරන්නා වූ කිසිදු ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් නොකළ යුතුය.

19. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකයකු, මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගැනීම උදෙසා යම් ස්ථානයකට ප්‍රවේශ වීම, පරීක්ෂා කිරීම, උපදෙස් දීම හා නියමයන් පැනවීම කෙරෙහි කිසිදු තැනැත්තකු බාධා නොකළ යුතය.

20. නගර සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් පෙරවරු 6 සිට පස්වරු 6 දක්වා අතර කාලය තුල යම් වේලාවකදී යම් ස්ථානයකට ඇතුලු වී මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පිළිපැද තිබේද, යන්න පරීක්ෂා කර බැලිය හැකිය.

21. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් ඉහත 20වන වගන්තිය යටතේ කරනු ලබන පරීක්ෂණයකින් අනතුරුව නියම කරනු ලබන කාල සීමාවක් තුල පහත දැක්වෙන කාර්යන් එකක් හෝ ඊට වැඩි ගණනක් ක්‍රියාත්මක කරන ලෙස පදිංචි කරුට නියම කරනු ලැබිය හැකිය -

(1) වහල,වැහිපිහිළි, වැසි ජලය පහතට වැටෙන නල, කාණු හා පියසි අලුත්වැඩියාව;

(2) ජල ටැංකි, පොකුණු හා ජල තටාක කලින් කළ හිස් කළ හැකි පරිදි ප්‍රතිනිර්මාණය කිරීම;

(3) ළිං, ජලටැංකි, පොකුණු පිරිසිදු කිරීම හෝ වසා දැමීම;

(4) වලවල්, අභාවිත ළිං, වැසිකිළි වලවල්, හෝ ජලය එක් රැස්වන ස්ථානයන් පස් පුරවා වසා දැමීම හෝ ජලය බැහැරව ගලායන සේ සැකසීම;

(5) වගුරු බිම් , ජලය පිරෙන ස්ථාන පිරවීම හෝ මදුරුනාශක හෝ කෘමිනාශක යොදා මදුරුවන් හෝ වෙනත් රෝග කාරක කෘමීන් මර්ධනය කිරීම;

(6) ජලය රැඳෙන හෝ මදුරුවන් බෝවන ජලජ පැළෑටි විනාශ කිරීම, ජලමාර්ග දිගේ පාවී යාම නතර කිරීම;

(7) මදුරුවන් හා කෘමීන් බෝවීම වළකාලන වෙනත් යම් නිෂ්චිත කාර්යයක් ඉටු කිරීම.

22. ස්වකීය රුධිරයෙහි මැලේරියා, බරවා හෝ ඩෙංගු රෝග කාරක පරපෝෂිතයන් හෝ වෛරසයන් ඇති බව සොයා දැනගත් යම් තැනැත්තකුට, නියම කරනු ලැබ ඇති රෝහලක හෝ චිකිත්සාගාරයක බලධාරීන් නියම කරනු ලබන කාලසීමාවක් නිවාරණ ප්‍රතිකාර ලබාගත යුතු බවට ලිඛිත දැන්වීමක් මඟින් සභාපතිවරයා විසින් නියම කළ හැකිය.

23. සභාපතිවරයාගේ විධිමත් අනුමැතියක් නොමැතිව, යම් අලුත් ලිදක්, පොකුණක්, ජල ටැංකියක්, තටාකයක්, වතුර මලක් හෝ වෙනත් ජලය රඳා තිබෙන යම් ආකාරයක නිර්මිතයක් ඉදිකරනු ලැබූ අවස්ථාවකදී එය වසා දැමීම, පුරවා දැමීම, කඩා ඉවත් කිරීම නිෂ්චිත කාලයක් තුල කරන ලෙස එම ස්ථානයේ අයිතිකරුට, පදිංචිකරුට, බදුකරුට නියම කළ හැකිය. එකී නියමය ලිඛිත දැන්වීමක් මඟින් එම ස්ථානයෙහි පදිංචි ඕනෑම අයෙකුට භාර දීම හෝ එකී ස්ථානයෙහි හොඳින් පෙනෙන සේ අලවා තැබීමෙන් දැන ගැනීමට සැලැස්විය හැකිය.

24. ඉහත 22 වන වගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ ස්ථානයක අයිතිකරුවන්, බදුකරුවන් හෝ පදිංචිකරුවන් විසින් දැන්වීමේ නියම කර ඇති කාලය තුළ එහි සදහන් නියමයන් ඉටු කිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී, සභාපතිවරයා හෝ බලය ලත් නිලධාරියෙකු විසින් පෙරවරු 6 සිට පස්වරු 6 දක්වා කාලය අතර ඕනෑම වේලාවක අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ හා සේවකයන් සමග එකී ස්ථානයට ඇතලු වී, දැන්වීමෙහි නියම කර ඇති කාර්යය ක්‍රියාත්මක කිරීම නිත්‍යානුකූල වන්නේය.

25. ඉහත 24 වන වගන්තිය පරිදි ක්‍රියා කිරීම වෙනුවෙන් සභාවට දැරීමට සිදුවන්නා වූ වියදම් ස්ථානයේ අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු විසින්

සභාවට ගෙවිය යුතුය. සභාපතිවරයා විසින් ලිඛිත දැනුම් දීමක් කිරීමෙන් අනතුරුව දින දහහතරක් ඇතුලත එකී වියදම් ගෙවීමට ස්ථානයේ අයිතිකරු, බදුකරු, පදිංචිකරු අපොහොසත් වුවහොත්, නගර සභාවට ලැබිය යුතු බද්දක් සේ සලකා එකී මුදල අය කර ගනු ලැබිය යුතුය.

26. මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාගේ නිර්දේශයන් මත අවශ්‍ය කරන්නාවූ පවිත්‍ර කිරීම්, හෙළි පෙහෙළි කිරීම්, බිම් මට්ටම් කිරීම්, ජලය රැඳෙන ස්ථාන පිරවීම්, කසල ඉවත් කිරීම්, සහ මේ පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම් කිරීමටද ඊට අනුශංගික වූ මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාල කටයුතු කිරීමටද සභාපතිවරයාට බලය ඇත්තේය.

27. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයා විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ -

> "සභාපති" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තා ද;
>
> "බලයලත් නිලධාරියා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු ද;

“ස්ථානය” යන්නෙන් යම් ඉඩමක් නිවසක් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් ඇතුලත් වන අතර එහි පිහිටියා වූ පොකුණක්, ටැංකියක්, වැවක්, ජල මාර්ගයක්, කාණුවක් හෝ වතුර මතුපිට ඇත්තා වූ හෝ නොමැත්තා වූ බෝට්ටුවක් ද;

“ මදුරුවන්ගෙන් බෝවන රෝග යන්නෙන් “ මැලේරියාව, ඩෙංගු, බරවා, මොළේ උණ (ජැපනීස් එන්සෙපලයිටීස්) සහ මදුරුවන්ගෙන් බෝවන වෙනත් සියලුම රෝග ද;

අදහස් වේ.

## VI.කිරි පට්ටි හා කිරි විකිණීම පිළිබඳ අතුරු ව්‍යස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (9)(ඒ) ඡේදය; යටතේ මෙම අතුරු ව්‍යවස්ථා සැදීමට නගර සභා වලට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි පවත්වාගෙන යාම හා කිරි විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරික්ෂා කිරීම, පාලනය කිරීම ද සඳහා විධිවිධාන සැලසීම පිණිස වන අතුරු ව්‍යවස්ථාවකි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හදුන්වනු ලැබේ.

4. කිරි පට්ටියක් පවත්වාගෙන යාම සහ කිරි විකිණීම සඳහා ප්‍රාදේශිය සභාවේ

සභාපතිවරයා විසින් එම කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේනම් මිස කිසිම තැනැත්තෙකු විසින් එම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටියක් පවත්වාගෙන යාම හෝ කිරි විකිණීම නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බල පත්‍රයක්ම සභාපතිවරයා විසින් කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බල පත්‍රය නිකුත් කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන්වන පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන්නේ නම් මිස සභාපතිවරයා විසින් කිසිදු තැනැත්තෙකුට කිරි පට්ටියක් පවත්වාගෙන යාම සඳහා බල පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(1) කිරි පට්ටියේ සත්වයින් රඳවා තබන ස්ථානය -

I. සත්වයන් රඳවා තබා ගැනිම සඳහා ප්‍රමාණවත් ගොඩනැගිලි සංඛ්‍යාවක් ඉදිකර තිබිය යුතුය. එක් සත්වයෙකුට අවම වශයෙන් වර්ග මීටර් 3ක් බැගින් වන සේ එකී ඉඩකඩ වෙන්කොට තැබිය යුතුය.

II. සත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල වහලය කිසියම් කල්පවතින ද්‍රව්‍යකින් සෙවිලිකර තිබිය යුතු අතර වහලය සඳහා ශක්තිමත් දැව දඬු යොදාගෙන තිබිය යුතුය. වහල කෙලවර පොළව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.14ක් උසින් යුක්ත විය යුතුය.

III. සත්වයින් රඳවා තබන ගොඩනැගිලි ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන්

හෝ ශක්තිමත් ලෙස බැඳ තිබිය යුතු අතර සිමෙන්තියෙන් කපරාදු කර තිබිය යුතුය. බිත්තියේ දෙපසම සිමෙන්ති මැද තිබිය යුතු අතර ගොඩනැගිලි බිත්තිවල උස මීටර් 1.83 කට වඩා නොඅඩු විය යුතුය.

IV. ගොඩනැගිල්ල තුළට හොදින් වාතාශ්‍රය හා ආලෝකය ලැබිය යුතුය.

V. සත්වයින් රඳවා තබන ගොඩනැගිලි වල බිත්තියේ ඉහළ කෙලවර සිට වහලය දක්වා ඉදිකර ඇති කණු ශක්තිමත් ලෙස සකසා තිබිය යුතු අතර ඒවා දැව, යකඩ හෝ කොන්ක්‍රීට් වලින් සකසා තිබිය යුතුය. වහලයේ වඩාත් උසින් පිහිටි පැත්තේ කණු වල උස පොළව මට්ටමේ සිට මීටර් 3 ක් විය යුතු අතර ඒවා ඉතා පිරිසිදුව තීන්ත ආලේප කොට පවත්වාගෙන යා යුතුය.

VI. සත්වයින් රඳවා තබන ගොඩනැගිල්ලේ බිම සිමෙන්ති දමා තිබිය යුතුය.

VII. සත්වයින් රඳවා තබන ගොඩනැගිල්ල මනා ලෙස අලුත් වැඩියා කොට පවත්වාගෙන යා යුතුය.

VIII. තීන්ත ආලේප කර තිබිය යුතුයැයි මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති සෑම කොටසකම

අවම වශයෙන් සෑම වර්ෂයකටම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතුය.

IX. කිරි දොවා ගැනීමට, කිරි තැන්පත් කිරීමට සහ කිරි ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා භාජන ඔප දැමූ මැටි, ගැල්වනයිස් කළ යකඩ හෝ ටින්, එනැමල් ආලේපිත යකඩ, මතුපිට සුමට කළ ඇලුමිනියම්, විදුරු හෝ පෝසිලේන් යන කවර හෝ වර්ගයක භාජන විය යුතු අතර එකී භාජන සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ ගබඩා නොකළ යුතුය.

X. කිරිපට්ටිය සහ එහි වටපිටාව ද, කාණු, ලීබඩු හා උපකරණද පිරිසිදුව හා මනා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

XI. සත්වයින් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට යටත් පිරිසෙයින් මීටර් කට නොඅඩු දුරකින් රෝගීවන සතුන් රඳවා තැබීම සඳහා වෙනම ගොඩනැගිල්ලක් තනා තිබිය යුතු අතර සත්වයින් රඳවා තබන ගොඩනැගිල්ලේ නියමයන්ට අනුකූලව මේ ගොඩනැගිල්ලද ගොඩනගා තිබිය යුතුය.

XII. රෝගී සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට ගලා යන අප ජලය අනෙකුත් සතුන් රඳවා තබන ගොඩනැගිල්ල හෝ කිරි කාමර දෙසට

ගලා නොයන සේ කාණු නිර්මාණය වී තිබිය යුතුය.

(2) කිරි පට්ටියේ කිරි දොවන ස්ථානය සහ කිරි ගබඩාකර තිබෙන ස්ථානය

I. කිරි දොවන ස්ථානය හා කිරි ගබඩා කර තබන ස්ථානය, සතුන් රදවා තබන ස්ථානයෙන් අවම වශයෙන් මීටර් 7.62 කට නොඅඩු දුරකින් පිහිටුවා තිබිය යුතුය.

II. කිරි දොවන ගොඩනැගිල්ල ඉතා පිරිසිදු තත්ත්වයෙන් පවත්වාගෙන යායුතු අතර ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් බැද දෙපස බිත්ති සිමෙන්තියෙන් මැද තිබිය යුතුය. බිත්තිවල උස අවම වශයෙන් මීටර් 2.14 ක් වියයුතු අතර බිත්තියේ ඉහල කෙලවරේ සිට වහලය දක්වා ඉදි කෙරෙන කණු ශක්තිමත් දැවයෙන් හෝ යකඩ වලින් හෝ කොන්ක්‍රීට් වලින් තනා තිබිය යුතු අතර ඒවායේ තීන්ත ආලේප කර තිබිය යුතුය.

III. කිරි දොවෙන ගොඩනැගිල්ලේ බිම සිමෙන්ති දමා තිබිය යුතු අතර බිම හා බිත්ති සම්බන්ධ වන ස්ථාන කවාකාර හැඩයට සකස් කර තිබිය යුතුය. ගොඩනැගිල්ලේ පියසි කෙලවර පොළව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 2.14 ට

ඉහලින් තිබිය යුතුය.

IV. කිරි දොවන ගොඩනැගිල්ලේ, මතුපිට පිඟන් ගඩොලින් හෝ වෙනත් යම් අනුමත කරන ලද්දා වූ දිය සීරාව උරා නොගන්නා වූ ද්‍රව්‍යකින් අතුරා තැනූ මේසයක් තිබිය යුතුය.

V. කිරි දොවන ස්ථානය තුළ කසල භාජනයක් තබා තිබිය යුතුය.

VI. කිරි දොවන ගොඩනැගිල්ල කිසියම් කසල වලකින් වැසිකිලියකින්, පොහොර ගොඩකින්, පොහොර වලකින් හෝ විවෘත කසල කාණුවකින්, යටත් පිරිසයින් මීටර් 30.5 ක් දුරින් පිහිටා තිබිය යුතුය.

VII. කිරි රැස්කර ගන්නා භාජන ඉතා පිරිසිදු තත්ත්වයෙන් විය යුතු අතර දිනපතා ජීවානුහරණය කල යුතුය.

VIII. කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේනම් එකී යන්ත්‍ර දිනපතා ජීවානුහරණය කලයුතු අතර ඊට අවශ්‍ය උපකරණ සපයා තිබිය යුතුය.

(3) කිරි පට්ටි පවත්වාගෙන යාමට බලපත්‍රයක් නිකුත් කිරීම

සඳහා වූ පොදු අවශ්‍යතා -

I. සත්වයින්ගේ වසුරු, ඉතිරිවන තණකොළ ඇතුලු ආහාර කොටස් ඉවත් කිරීම සඳහා වෙනමම ස්ථානයක් සකසා තිබිය යුතුය. එම ස්ථානය සතුන් රඳවා තබන ගොඩනැගිලි, කිරි දොවන ස්ථාන සහ කිරි රඳවා තබන ස්ථාන වල සිට යටත් පිරිසෙයින් මීටර් 30.5 ක දුරින් පිහිටුවා තිබිය යුතුය. එසේම එම ස්ථානය සතුන් සඳහා ජලය ලබා ගන්නා ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 12ක ඈතින් පිහිටුවා තිබිය යුතුය.

II. රඳවා තබන සත්වයින්ට පානය කිරීමට, නෑවීමට හා ගොඩනැගිලි සේදීමට, පිරිසිදු ජල පහසුකම් ප්‍රමාණවත් ලෙස සපයා තිබිය යුතුය.

III. සත්වයින් සඳහා පරිහරණය කරන ලද ජලය ඉන් අනතුරුව පහසුවෙන් උරා ගන්නා වලකට බැහැර කළ යුතු අතර මුත්‍රා හා වසුරු කොටස් ද එලෙස පහසුවෙන් උරා ගන්නා වලකට බැහැර කළ යුතුය. එලෙස අපිරිසිදු වන ජලය බැහැර කිරීම සඳහා ඒවා පහසුවෙන් ගලායන හැකිවන පරිදි සිමෙන්තියෙන් තැනු කාණු පද්ධතියක් විය යුතුය.

7. (1) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු, හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාධන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර ලත් ස්ථානයක කිසිදු ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත කර වීමද, යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් එවන් කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ එවන් කාර්යයක නියුක්ත වීමට ඉඩ දීම ද නොකළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර ලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්තවන අයවලුන් හොඳින් සෝදා පිරිසිදු කල ඇඳුම් ඇඳ ඇත්තේ නම් මිස, එවන් ස්ථානයක කිසිදු කාර්යයක නියුක්ත නොවිය යුතු අතර, එලෙස නියුක්ත වීමට ඉඩ දීම ද නොකළ යුතුය.

(3)මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර ලත් ස්ථානයේ සේවයේ යොදවා ඇත් සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් වෛද්‍ය පරීක්ෂනයට භාජනය කරවීම බලපත්‍ර ලාභියාගේ කාර්යය විය යුතුය.

8. කිරි පට්ටියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍යය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබිමත්, එකී සේවකයන් කිරිපට්ටියේ සේවයේ නියුක්තවන සෑම අවස්ථාවකම අවස්ථාවෝචිත පරිදි එකි ආරක්ෂිත පැලදුම් පැළද සිටින

බවටත්, කිරි දෙවීමේ කාර්යයන්හී නියුක්ත වීමට පෙර හොදින් ඇග සෝදා පිරිසිදු වී සිටින බවටත් සහතික වීම බලපත්‍ර ලාභියාගේ කාර්යය විය යුතුය.

9. සතුන් රදවනු ලැබ ඇති ස්ථානයේ රැස්වන වසුරු සහ ඉතිරි වන තණකොල කොටස් යටත් පිරිසෙයින් දිනකට එක් වරක් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී ස්ථාන දිනපතා ජලයෙන් සෝදා හැරීම කල යුතුය.

10. සතුන් රදවා තබන ගොඩනැගිලි හා කිරි දොවන කාමරයේ බිම සහ මේසය මතු පිට යටත් පිරිසෙන් දිනකට එක් වරක් බැගින් සෝදාහැරීමට සැලැස්විය යුතුය.

11. බලපත්‍රලත් ස්ථානයේ කිරි දෙවීම යන්ත්‍රාණුසාරයෙන් කරනු ලබන්නේනම්, ඒ සඳහා පාවිච්චියට ගන්නා සියලුම භාජන හා උපකරණද යටත් පිරිසෙන් දිනකට එක් වරක් බැගින් ජීවාණුහරණය කලයුතු අතර වෙනත් භාණ්ඩ හා උපකරණ දිනපතා පිරිසිදු කරවීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්ය විය යුතුය.

12. බලපත්‍ර ලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා භාජන, ඒවාට නියමිත කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා නොගැනීමට බලපත්‍රලාභියා වගබලා ගතයුතුය.

13. කිරි දොවා ගැනිම ආරම්භ කිරීමට පෙර -

(1) කිරි දෙනගේ බුරුල්ල පිරිසිදු ජලයෙන් සේදිම කර ඇත්තේ නම් ද;

(2) කිරි දොවන්නා සබන් හෝ සබන් දියර යොදා තම දෑත්

සෝදාගෙන ඇත්තේ නම් ද; සහ

(3) යන්ත්‍රානුසාරයෙන් කිරි දෙවීම කරනු ලබන අවස්ථාවක එකී උපකරණ ජීවාණුහරණය කර ඇත්තේ නම් ද;

මිස කිරි දෙවීමට ඉඩදීම නොකළ යුතුය.

14. කිරි පට්ටියේ ඇති කරන සෑම සතෙකුම යටත් පිරිසෙයින් වර්ෂයකට තුන්වතාවක් පශු වෛද්‍යවරයාගේ හෝ ඔහු විසින් නම් කරනු ලබන ඔහුගේ කවර හෝ නියෝජිතයෙකුගේ අධීක්ෂණයට ලක්කර අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සහ එකී උපදෙස් අනුව ක්‍රියා කිරීම බලපත්‍ර ලාභියාගේ කාර්යය වන්නේය.

15. කිරි පට්ටියේ කවර හෝ සතෙකුට කිසියම් රෝගයක් වැළදී ඇති බව දැනගන්නට ලැබුණු වහාම එකී සතා සතුන් රඳවන ගොඩනැගිල්ලෙන් ඉවත් කර, රෝගී සතුන් රදවන ගොඩනැගිල්ලේ රැඳවීමට ක්‍රියා කිරීම සහ ඒ පිළිබදව අදාල ප්‍රදේශය භාර පශු වෛද්‍ය නිළධාරියා දැනුවත් කිරීමට ද ක්‍රියා කිරීම බලපත්‍ර ලාභියාගේ කාර්යය වන්නේය.

16. කිරි බුරුල්ලේ හෝ අන් තැනක ඇතිවන ක්ෂය රෝගයෙන්, තීව්‍ර ස්තන ප්‍රදාහයෙන්, කුර හා මුඛ රෝගයෙන්, ඇන්ත්‍රැක්ස් රෝගයෙන් හෝ කිරි බුරුල්ලේ ඇක්ටිනෝමයිකෝසිස් රෝගයෙන් පෙලෙන හෝ බෘසෙල්ලෝසිස් රෝගයෙන් පෙලෙන බවට පශු වෛද්‍ය නිළධාරියා තිරණය කරන ලද, යම් සතෙකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩදිම හෝ මනුෂ්‍ය පරිභෝජනයට ඇති යම් වෙනත් සතුන්ගේ කිරි වලට එකතු කිරීම හෝ එසේ කිරීමට ඉඩ දිම, කවර හෝ තැනැත්තෙකු විසින් කරනු නොලැබිය යුතුය.

17. බලපත්‍ර ලත් ස්ථානයේ ප්‍රයෝජනය සඳහා ඇති තණකොළ හා පිදුරු හැර

සියලුම සත්ව ආහාර මීයන්ට හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකිවන සේ සුදුසු භාජනවල තබා තිබිය යුතුය.

18. කිරි ගබඩා කර තැබීමේ සහ සකස් කිරිමේ කාර්යය හැර වෙනත් කවර හෝ කාර්යයක් සදහා කිරි කාමරය යොදා ගැනිම හෝ යොදා ගැනිමට ඉඩ දීම නොකිරීමට බලපත්‍ර ලාභියා වගබලා ගත යුතුය.

19. ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කිරීමෙන් කිරි බාල කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

20. (1) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

I. ජෛවහායනීය අපද්‍රව්‍ය;
II. වීදුරු;කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;
III. පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;
IV. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
V. නිෂ්පාදනය සදහා යොදාගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්; සහ
VI. අන්තරායකර අප ද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරිමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලිමට පිලියෙල කර ඇති වෙන් වෙන් වු භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍ර

ලාභියාගේ කාර්යය විය යුතුය.

(2) (1) ඡේදයේ සදහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය නගර සභාවේ අප ද්‍රව්‍ය කලමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේනම් මිස සභාපතිවරයා විසින් නියමකරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කල යුතුය.

(3) (2) ඡේදයේ කුමක් සඳහන්ව තිබුනද (1) ඡේදයේ (i) උප ඡේදයේ සදහන් වන ජෛවහායන අප ද්‍රව්‍ය අතරට ගැනෙන සත්ව වසුරු සහ ඉතිරිවන තණකොල කොටස් පොහොර වශයෙන් යොදා ගැනිමට එකී නියමය බාධාවක් නොවිය යුතුය. කෙසේ වුවද එකී අප ද්‍රව්‍ය කිරි පට්ටියෙන් බැහැරට ප්‍රවාහනය කරනු ලබන්නේ නම් ආවරණයක් සහිතව ප්‍රවාහනය කරන්නේ නම් මිස කිරි පට්ටිය පිහිටා තිබෙන පරිශ්‍රයෙන් බැහැරට ප්‍රවාහනය කිරිම නොකළ යුතුය.

21. දොවා ගන්නා කිරි තැන්පත් කර තැබිමට ඒ සදහාම වෙන්වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහ ආලෝකය සහිත වුද කිසිදු කෘමියෙකුට හෝ වෙනත් සතෙකුට ඇතුල් විය නොහැකි ලෙස ආරක්ෂා කර ඇත්තා වූද කාමරයක් විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර ලත් කවරහෝ ස්ථානයක, කිසිදු හෝ තැනැත්තෙකු නිදා ගැනිම නොකළ යුතු අතර කිරි පට්ටියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබිම හෝ ගබඩා කර තැබිම හෝ නොකළ යුතුය. එසේ වුවද කිරි පට්ටියේ සේවයේ නියුක්ත තැනැත්තන් සදහා විවේක ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් ඉඩකඩ සහිත කාමරයක් සහ ආහාර ගැනීමේ කාමරයක් මෙම පරිශ්‍රය තුළ පිහිටුවා තිබිය යුතුය.

23. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සේවකයන් සදහා යටත් පිරිසෙයින් සෑම දස දෙනකු වෙනුවෙන් එකක් බැගින් වන සේ කාන්තාවන් සහ පිරිමි සඳහා වෙන වෙනම වැසිකිළි සකස් කර තිබිය යුතුය; එසේම එකී වැසිකිලි කිරි පට්ටියේ සතුන් රදවා තිබෙන ගොඩනැගිලි, කිරි දොවන ස්ථානය සහ කිරි තැන්පත් කරන කාමර වල සිට අවම වශයෙන් මීටර් 15 ක දුරින් ස්ථාන ගතකර තිබිය යුතුය.

24. කිරිපට්ටියේ කාර්යය සදහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 15 කට අඩු දුරකින් කසළ වලක් හෝ පොහොර වලක් හෝ අලු වලක් හෝ ස්ථාන ගත කර නොතිබිය යුතුය.

25. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සදහාම මනා ලෙස පිරිසිදු වීමට අවශ්‍ය පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු හා සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතුය. එසේම ඒ සඳහා අවශ්‍ය කරන පිරිසිදු වීමේ කාමර ප්‍රමාණවත් පරිදි සපයා තිබිය යුතුය.

26. කිසියම් කිරි පට්ටියකින් ලබා ගන්නා කිරිවලට දූවිලි, විෂබීජ හෝ වෙනත් අප ද්‍රව්‍ය ඇතුල් විය නොහැකි වන සේ ආවරණය කල භාජන යොදා ගන්නේනම් මිස, ඒ කිරි බලපත්‍රලත් ස්ථානයෙන් බැහැරට ගෙන යාම නොකළ යුතුය.

27. සෑම බලපත්‍ර ලාභියෙකුම තමාගේ නමද "බලපත්‍රලත් කිරිපට්ටිය" යන වචන ද සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් පැහැදිලිව ලියා ඇත්තාවූ පුවරුවක් කිරිපට්ටිය පවත්වාගෙන යන ස්ථානයේ පිටත හොඳින් පෙනෙන සේ සවිකර තැබිය යුතුය.

28. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින්ම කිරිපට්ටිවලට අදාළ මේ අතුරු

ව්‍යවස්ථාවල පිටපතක් සහ සිය බලපත්‍රය සිය කිරිපට්ටිය පවත්වාගෙනයන ස්ථානයේ පරික්ෂා කිරීමට හැකියාව ලැබෙන අයුරින් තබා තිබිය යුතුය. තවද කිරිපට්ටිය තුළ සේවයේ යොදවා ඇති සියලු සේවකයින්ගේ නම් හා ලිපිනයන් ලයිස්තුවක් සභාපතිවරයා හෝ ඔහුගේ බලය ලත් නිළධාරියාට ඕනෑම යුක්ති සහගත වේලාවක පරික්ෂා කිරීමට හැකි වන පරිදි කිරි පට්ටියේ තබා තිබිය යුතුය.

## පිටතින් ලබා ගන්නා කිරි විකිණීම

29. නගර සභා බල ප්‍රදේශයක් තුළ පිටතින් ලබා ගන්නා කිරි විකිණීමට අදහස් කරනු ලබන තැනැත්තෙක් විසින් ඒ සඳහා ප්‍රදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් 4වන වගන්තියේ පරිදි බලපත්‍රයක් ලබා ගත යුතුය

30. සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හිමි තැනැත්තෙකු නොවන වෙනත් කිසිම තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ වූ කිසිම තැනක පිටතින් ලබා ගන්නා කිරි විකිණීම නොකළ යුතුය.

31. කිරි ලබා ගැනීමට අදහස් කරන කිරි පට්ටිය පිහිටි පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා හෝ නගරාධිපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ අදාල බල ප්‍රදේශයේ පශු වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා ඇති කිරිපට්ටියකින් මිස, එසේ පිටතින් ලබා ගන්නා කිරි විකිණීම සඳහා, 29 වන අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

32. වලංගු බලපත්‍රයක් මත නගර සභා බල ප්‍රදේශය තුළ කිරි විකිණීමට බලය ලබා ඇති තැනැත්තකු විසින් තමාගේ කිරි විකිණීම සඳහා යොදා ගන්නා සේවකයින් හෝ නියෝජිතයින් නගර සභාවේ ලියාපදිංචි කර ලියාපදිංචි පත්‍රයක් ලබාගෙන තිබිය යුතුය.

33. එකී ලියා පදිංචි කිරීමේ පත්‍රයේ පහත සඳහන් කරුණු අඩංගු විය යුතුය -

(1) සේවා යෝජකයාගේ නම සහ ලේඛනගත අංකය; සහ

(2) සේවකයාගේ හෝ නියෝජිතයාගේ නම හා අත්සන හෝ මහපට ඇඟිලි සළකුණ.

34. නගර සභා බල ප්‍රාදේශය තුළ කිරි විකිණීමට භාරදුන් නියෝජිතයකු හෝ විකිණීම පිණිස ගෙන යන හෝ තැනින් තැන ගොස් විකුණන කිසිවකු වෙතින් ඒ නගර සභාවේ සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිළධාරියකු එකී ලියාපදිංචි කිරීමේ පත්‍රය පරික්ෂාකර බැලීම සඳහා ඉදිරිපත් කරන ලෙස නියමකරන ඕනෑම විටක, අදාල පුද්ගලයා විසින් එය සභාපතිවරයා හෝ ඔහුගේ බලය ලත් නිළධාරියා වෙත ඉදිරිපත් කිරීමට බැදී සිටිය යුතුය.

35. සභාපතිවරයා හෝ බලය ලත් නිළධාරියෙකු විසින් කිසියම් කිරි පට්ටියක නිෂ්පාදනය කරනු ලබන හෝ විකිණීමට තබා ඇති කිරිවලින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනිම නිත්‍යානුකූල විය යුතුය. කිසිදු බලපත්‍ර ලාභියෙකු විසින් එවන් මිලදී ගැනිම ප්‍රතික්ෂේප කිරිම හෝ ඊට බාධා කිරිම නොකළ යුතුය.

36. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කිරිපට්ටියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 6වෙන වගන්තියේ සදහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුව හොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ වෙනත් කිසියම් නියමයකට පටහැනිවුවහොත් එවන් අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍යය සියලු දේ ඉටු කරන ලෙස බලපත්‍ර ලාභියාට නියම කරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී

බලපත්‍රලාභියා වෙත භාර දෙනු ලැබිමට සැලැස්විය යුතුය. එවන් දැන්වීමක් කිරිපට්ටි ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ අලවා තැබුවහොත් හෝ එය බලපත්‍රලාභියා විසින් ඒ ස්ථානයේ සේවයේ යොදවා ඇති තැනැත්තකු වෙතභාර දෙනු ලැබුව හොත් එය බලපත්‍රලාභියා වෙත නිසි ලෙස භාර දුන්නා සේ සලකනු ලැබිය යුතුය.

37. 36වෙන වගන්තියේ සදහන් ආකාරයේ දැන්විමක් ලැබුණු කවර හෝ බලපත්‍ර ලාභියෙකු විසින් එකි දැන්විමේ නිශ්චිතව සදහන් දිනයට පෙර ඒ දැන්විමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කල යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරිමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්විමෙහි නිශ්චිතව සදහන් දිනය දිර්ඝ කිරිමට සභාපතිවරයාට බලය ඇත. එසේ වුවද ඒ ආකාරයෙන් දිර්ඝ කරනු ලබන කාලය දින තිහකට නොවැඩි විය යුතුය.

38. 36වෙන වගන්තියේ සදහන් ආකාරයේ දැන්විමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකි දැන්විමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දිර්ඝ කරනු ලැබු දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරිම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබු බල පත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබිම නිත්‍යානුකූල විය යුතුය.

39. මෙම අතුරු ව්‍යවස්ථාවේ සදහන් වගන්තිවලින් කියවෙන යම් කරුණක් පරික්ෂා කිරීමට සභාපතිවරයා හෝ බලය ලත් නිළධාරියකු වෙත බලය හිමිවන අතර ඒ සදහා යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම කිරි පට්ටියකට ඇතුලු වී එය පරික්ෂා කිරීමට ඔහුට හැකියාව ඇත. මෙහිදී ‘‘යුක්ති සහගත ඕනෑම වේලාවක්‘‘ යනුවෙන් බලපත්‍රලත් එම ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරගෙන යනු ලබන ඕනෑම වේලාවක් අදහස් වේ.

40. බලපත්‍රයලාභියා විසින් සිය කිරිපට්ටිය එලෙස පරික්ෂා කිරීම සදහා සභාපතිවරයාට හෝ ඔහුගේ බලය ලත් නිළධාරියාට අවශ්‍ය සෑම සහයක්ම

ලබා දීමට බැඳී සිටිය යුතුය.

41. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය.

42. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ -

‘‘සභාපති‘‘ යනුවෙන් නගර සභාවේ සභාපතිවරයාද;

“කිරි පට්ටිය " යන්නෙන්, කිරි ලබා ගැනීමේ හා කිරි විකිණීමේ කාර්යය ක්‍රියාත්මක කිරීමට එක් වර්ගයක සත්වයන් හෝ වර්ග එකකට වැඩි සත්වයන් රඳවා තබා ගන්නා ගොඩනැගිලි ද, ඒ පරිශ්‍රය ද එකී සත්වයන්ද;

‘‘යුක්ති සහගත ඕනෑම වේලාවක්‘‘ යනුවෙන් බලපත්‍රලත් එම ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරගෙන යනු ලබන ඕනෑම වේලාවක්ද;

‘‘බලය ලත් නිළධාරියකු‘‘ යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද සභාවේ නිළධාරියකුද ;

“පශු වෛද්‍ය නිළධාරීවරයා" යන්නෙන්, අදාල බල ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය නිළධාරියා ද; සහ

“සත්වයා" යන්නෙන්, එළ ගවයන්, මී ගවයන්, බැටලුවන් සහ එලුවන් යන වර්ග වලට අයත් සත්වයන්ද;

අදහස් වේ.

## VII.පදිකයන්ගේ සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු, එකී ආඥා පනතේ 157 (15) උප වගන්තිය යටතේ මෙම අතුරු වස්ථාව සෑදීමට නගර සභාවට බලය ලැබී ඇත.
2. මෙම අතුරු වස්ථාව නගර සභා බල ප්‍රදේශයේ ප්‍රධාන මංමාවත්හි ඇවිදීමේදී පදිකයන්ගේ සුරක්ෂිතතාවය උදෙසා විධිවිධාන සැළසීම පිණිස පනවනු ලබයි.

3. මෙම අතුරු වස්ථාව පදිකයන්ගේ සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු වස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. නගර සභා බල ප්‍රදේශයක ප්‍රධාන පාරවල්හි පදිකයන් සඳහා වෙන්කර ඇති මංතීරුවක් ඇත්තේනම්, එකී මංතීරුවේ හැර මාර්ගයේ වෙනත් කවර හෝ කොටසක්, පදිකයින් විසින් ඇවිදීම සඳහා භාවිතා නොකළ යුතුය.

5. නගර සභා බල ප්‍රදේශය තුළ යම් ප්‍රධාන පාරක, පදිකයින් සඳහා නිශ්චිත මංතීරුවක් වෙන් කර නොමැත්තේ නම්, අදාළ පාරෙහි පදිකයාගේ වමත් දිසානතියෙහි පාර පිහිටන සේ, වාහන ගමනාගමනය සඳහා වන මංතීරුවෙන් පිටත කොටසෙහි මිස කිසිදු අයෙකු ඇවිද නොයා යුතුය.

6. අන්‍යයන් පැහැදිලිව හඳුනාගත හැකි ආලෝකයක් සහිත දල්වන ලද විදුලිපන්දමක් හෝ අලෝකය දැල්වීමට හැකි වෙනත් උපකරණයක් දල්වාගැනීමකින් තොරව, කිසිවෙකු ප්‍රධාන පාරවල්හි රාත්‍රී කාලයේදී ඇවිදයාම නොකළ යුතුය.

7. තමාගෙන් විමසන විටකදී පිළිගත හැකි හේතු සහිත විස්තරයක් කියන්නට නොහැකිව, කිසිවකු ප්‍රධාන පාරක නිකරුණේ ඇවිදීම නොකළ යුතුය.

8. යම් තැනැත්තෙකු විසින් මෙම අතුරු වස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඩුවමකට ඔහු යටත් විය යුතුය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු වස්ථාවේ -

> ''ප්‍රධාන පාරවල් යන්නෙන්" නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ පෞද්ගලික පාරවල් නොවන්නා වූ වාහන ගමනාගමනය සඳහා පිළියෙල කරනු ලැබුවා වූ, නගර සභාව හෝ මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු සියළුම පාරවල් අදහස් වේ.

## VIII.පුස්තකාල පිලිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (13) උප වගන්තිය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට නගර සභාවලට බලය ලැබී ඇත.

2. නගර සභා බල ප්‍රදේශය තුළ, පුස්තකාල සේවාවන් පවත්වාගෙන යාම සඳහා, නගර සභාව විසින් මෙම අතුරුව්‍යවස්ථාව පනවනු ලබයි.

3. මෙම අතුරුව්‍යවස්ථාව නගර සභා පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හැඳින්වේ.

4. නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල පහත සඳහන් අංශ වලින් සමන්විත විය හැකිය -

(1) බැහැර දෙන අංශය;

(2) ආශ්‍රය අංශය;

(3) කියවීම් ශාලාව;

(4) ළමා අංශය; සහ

(5) විද්‍යුත් අංශය.

5. පුස්තකාලය -

(1) අධීක්ෂණය හා පරිපාලනය කිරීම නගර සභාවේ පුස්තකාල කමිටුවක් වෙත පැවරෙන අතර, එම කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වේ -

(I) නගර සභාවෙහි සභාපතිවරයා;

(II) සභාව විසින්, තීරණය කරන පරිදි සභිකවරුන් දෙදෙනෙකුට නොවැඩි සභිකයන් සංඛ්‍යාවක්;

(III) සභා රැස්වීමක දී සභාව විසින් නම් කරනු ලබන බල ප්‍රදේශය තුළ පදිංචි විශිෂ්ඨ තැනැත්තන් දෙදෙනෙකු;

(IV) අදාළ පුස්තකාලයෙහි පාඨක සමාජයක සභාපතිවරයෙක්; සහ

(V) අදාළ පුස්තකාලයෙහි පුස්තකාලයාධිපති.

(2) නගර සභාවේ සභාපතිවරයා පුස්තකාල කමිටුවෙහි සභාපතිවරයා වන්නේය.

(3) පුස්තකාලය භාරව සිටීම සඳහා නිසි පත්වීම් බලධාරීත්වය විසින් පුස්තකාලයාධිපතිවරයෙකු පත් කරනු ලැබිය හැකි අතර, පුස්තකාලයේ ක්‍රමවත්භාවය පවත්වාගෙන යාම සඳහා පුස්තකාලයේ වත්කම් සම්බන්ධයෙන් පුස්තකාලයාධිපතිවරයා හා ඔහුගේ කාර්ය මණ්ඩලය වගකිව යුතු වේ.

6. සභාපතිවරයා පුස්තකාල කමිටුවක මූලාසනය දැරිය යුතු අතර, යම් රැස්වීමකට අදාළ සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින කමිටුවේ සාමාජිකයන් අතරින් තෝරා පත් කර ගන්නා සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.කවර හෝ රැස්වීමක මූලාසනය දරණ තැනැත්තාට එක් මූලික ඡන්දයක් ද, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත් තීරක ඡන්දයක් ද ඇත්තේය.

7. මෙම කමිටුවේ ගණ පූර්ණය සාමාජිකයන් තිදෙනෙකු වන අතර එම ගණ පූර්ණය සම්පූර්ණ වී ඇත්තේනම් මිස, කමිටුවේ යම් රැස්වීමක දී කිසිදු කටයුත්තක් නොකළ යුතුය.

## බැහැර දෙන අංශය

8. යම් තැනැත්තෙක් -

(1) වයස අවුරුදු 12 ට අඩු පුස්තකාල සමාජිකයෙකුවේ නම් ළමා පාඨකයෙක් වශයෙන්ද, අවුරුදු 12 ට වැඩි පුස්තකාල සමාජිකයෙකු වේ නම් වැඩිහිටි පාඨකයෙක් වශයෙන් ද

සලකනු ලබයි.

(2) (I) නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි වී සිටී නම් හෝ බල ප්‍රදේශය තුළ ආයතනයක, කාර්යාලයක, පාසලක, ව්‍යාපාරයක හෝ මහජන සංවිධානයක සාමාජිකත්වය ඇතිව සිටී නම්; සහ

(II) නගර සභාව විසින් තීරණය කර නියම කරනු ලැබ ඇති පුස්තකාල සාමාජික ගාස්තු ගෙවා සාමාජිකයෙකු වශයෙන් පිළිගෙන ඇත්තේනම් මිස පුස්තකාලයෙහි බැහැරදෙන අංශය සඳහා අවසර ඇති අයකු වශයෙන් නොසැළකිය යුතුය.

(3) බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයකු ලෙස ඇතුලත්වීමට අපේක්ෂා කරන්නේ නම් පුස්තකාලයාධිපතිගෙන් ලබාගත හැකි පුස්තකාල කමිටුව අනුමතකර ඇති අයදුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

(4) පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරනු ලබන ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් අවශ්‍යතා එලෙසින්ම සම්පූර්ණ කර, පුස්තකාල සාමාජිකත්වය සඳහා ගෙවිය යුතු ගාස්තු වශයෙන් නගර සභාව තීරණයකර ඇති අදාළ ගාස්තු ගෙවා ඇති, අයකු නොවන්නේ නම් පුස්තකාල සාමාජිකත්වය ලබා නොදිය යුතුය.

9. පුස්තකාලයක සාමාජිකයකු ලෙස ඇතුළත් කර ගන්නා සෑම තැනැත්තෙකුට ම පුස්තකාලයාධිපති විසින් අනන්‍යතාවය සහිත කාඩ්පතක් නිකුත් කළ යුතු අතර, එම කාඩ්පත යටතේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයන් ගෙන් බැහැරදෙන

අංශයෙන් පොත් ලබා ගැනීමට ඔහුට හැකියාව ඇත්තේය.

10. පුස්තකාල සාමාජිකයෙකුට නිකුත් කරන ලද කාඩ්පත් යටතේ සාමාජිකයකු විසින් ලබාගන්නා සෑම පොතක් සම්බන්ධයෙන්ම සාමාජිකයා පෞද්ගලිකව වගකිවයුතු වන්නේය.

11. පුස්තකාලයෙහි බැහැර දෙන අංශයේ සාමාජිකයෙකුට ඉහත 8 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සාමාජික කාඩ්පතක්, ඔහු අතින් නැති වූ අවස්ථාවක එම නැතිවීම ගැන ඔහු විසින් පුස්තකාලයාධිපති හට දැනුම් දිය යුතුය. එම කාඩ්පතට බැහැර දෙන පුස්තකාලයෙන් පොතක් ලබා ගෙන නොමැති බවට පුස්තකාලයාධිපති සෑහීමකට පත් වුවහොත්, සාමාජිකයාට නව කාඩ්පතක් නිකුත් කළ හැකිය. කාඩ්පතක් නැති වූ බව දැනුම් දෙනු ලැබූ දිනයේ සිට යටත් පිරිසෙයින් දින 30 ක කාල සීමාවක් ඉකුත් වී ඇත්නම් මිස, පුස්තකාලයාධිපති විසින් නව කාඩ් පතක් නිකුත් නොකළ යුතුය.

12. බැහැර දෙන අංශයේ සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් එය ලබා ගත් දින සිට දින 14 ක කාලයක් තුළ පුස්තකාලයාධිපති වෙත ආපසු භාරදිය යුතුය. එවැනි යම් පොතක් වෙනත් සාමාජිකයකු විසින් ඉල්ලා නොමැති නම් හා භාරගත් අය එම පොත නැවත භාර දීම සඳහා තවදුරටත් කාලය ඉල්ලා සිටී නම්, ඒ සඳහා අමතර දින 14 ක කාලයක් ලබා දීමට පුස්තකාලයාධිපතිවරයා විසින් කටයුතු කළ හැකිය.

13. බැහැරදෙන අංශයෙන් ලබාගත් කිසියම් පොතක් නිශ්චිත කාලයෙන් පසු හෝ ලබා ගන්නා ලද අතිරේක කාලයෙන් පසු තවදුරටත් භාර නොදී සිටී නම්, එවැනි අවස්ථාවක අදාළ පොත නැවත භාරදීම දක්වා වන කාලසීමාවට, සභාව විසින් තීරණය කර ඇති පරිදි දඩයක් අයකිරීම නීත්‍යානුකූල වන්නේය.

14. බැහැර දෙන පුස්තකාලයෙන් තමා විසින් ලබා ගන්නා ලද පොතක් දින 30 ක්

ඇතුළත ආපසු භාරදීම යම් සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ පොත නැති වුවා සේ සලකනු ලැබිය යුතුය.

15. සාමාජිකයකු විසින් ලබා ගන්නා ලද පොතක් නැති වූ විට හෝ නැති වුවායැයි සැලකෙන අවස්ථාවක, එම පොත ආපසු සපයා ගැනීමේ වියදම හා පොතේ වර්තමාන වටිනාකමෙන් 25%ක දෙපාර්තමේන්තු ගාස්තුවක් ද, ඒ සාමාජිකයා විසින් ගෙවිය යුතුය. නැති වූ පොත බැඳුම්කරණ ලද පොතක් නම් බැඳුම් ගාස්තුව වෙනම අය කළ යුතුය.

16. යම් කිසි සාමාජිකයකු විසින් බැහැර දෙන අංශයෙන් ලබා ගත් පොතකට හානි කිරීම හෝ කවර හෝ ආකාරයකින් එය විරූප කිරීම නොකළ යුතුය.

17. බැහැර දෙන අංශයෙන් තමා ලබා ගැනීමට අපේක්ෂා කරන පොතකට සිදු වී ඇති හානියක් හෝ විරූප වීමක් පිළිබඳව, එම පොත තමා විසින් භාර ගන්නා අවස්ථාවේ දී පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම සෑම සාමාජිකයෙකුගේම වගකීම වන්නේය. එවැනි හානියක් හෝ විරූප වීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිට දැනුම්දීම යම් සාමාජිකයකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක ඒ පොත හානියකින් හෝ විරූප වීමකින් තොරව නිකුත් කරන ලද සේ සැලකිය යුතුය.

18. සාමාජිකයකු විසින් ආපසු භාර දෙන පොතක් තවදුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට සාමාජිකයා විසින් හානි කර හෝ විරූපී කර ඇති බවට පුස්තකාලයාධිපතිවරයා සෑහීමකට පත් වන්නා වූ අවස්ථාවක, ඒ පොත නැවත සපයා ගැනීමේ වියදම දැරීමට ඒ සාමාජිකයා බැඳී සිටින්නේය. ඒ පොත නැවත සපයා ගැනීමෙන් පසුව හානි වූ පොත "මහජන පුස්තකාලය හානි වූ පොතක් විකුණන ලදී" යනුවෙන් මුද්‍රාව තබා ඒ සාමාජිකයාට දෙනු ලැබිය යුතුය.

19. බැහැර දෙන අංශයෙන් ලබා ගත් පොතක් හෝ කාඩ්පතක් කිසිම සාමාජිකයෙකු විසින් අන්සතු නොකළ යුතුය.

20. ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන කිසියම් තැනැත්තෙකු විසින් පාවිච්චි කළ බව දන්නා පොතක්, කිසිම සාමාජිකයකු විසින් බැහැර දෙන පුස්තකාලයට භාර නොදිය යුතු අතර, ඒ පොත නැවත සපයාගැනීමේ වියදම සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

21. කිසියම් පොතක් ලැබිය යුත්තේ සාමාජිකයන් කිහිපදෙනෙකු අතරින් කවර සාමාජිකයාට ද යන්න සම්බන්ධයෙන් යම් මතභේදයක් ඇති වූ අවස්ථාවක දී, ඒ මතභේදය සම්බන්ධයෙන් පුස්තකාලාධිපතිගේ තීරණය අවසාන තීරණය වන්නේය.

22. වෙනත් සාමාජිකයෙකු විසින් ලබා ගෙන ගොස් ඇති යම් පොතක් ලබා ගැනීමට යම් සාමාජිකයෙකු අපේක්ෂා කරන විට, ඔහු තමාගේ නම සහ පොතේ නම එම කාර්ය සඳහා තබා ඇති ලේඛණයක සටහන් කළ යුතුය. ඒ පොත ඒ වන විටත් ලබා ගෙන ඇති සාමාජිකයා එය ආපසු භාර දුන් විට පුස්තකාලයාධිපතිවරයා විසින් එම ලේඛණයේ නම සටහන් කර ඇති සාමාජිකයාට නිකුත් කළ යුතුය. යම් පොතක් සඳහා සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ලේඛණයේ නම් සටහන් කර ඇති අවස්ථාවක ඔවුන් ලේඛණයේ නම සටහන් කර ඇති අනුපිළිවෙලට අනුව, ඒ පොත ඔවුන්ට නිකුත් කළ යුතුය.

23. බැහැරදෙන අංශයෙහි සාමාජිකත්වය දැරීමට අවශ්‍ය සුදුසුකම් වලින් මිදෙන යම් සාමාජිකයෙකු, ස්වකීය සාමාජිකත්වය අවසන් කරගැනීම සඳහා අදාළ සාමාජික කාඩ්පත පුස්තකාලයාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

24. බැහැර දෙන අංශය ක්‍රියාත්මක වන දින හා කාල වේලාවන් සභාව මඟින්

කලින් කළ තීරණය කළ හැකි අතර, ඒ සඳහා පුස්තකාල කමිටුවෙහි නිර්දේශ ලබාගත යුතුය. තවද, ඊට අදාළව සියළුම සාමාජිකයින් සුදුසු පරිදි දැනුවත් කර තිබීම පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යය විය යුතුය.

25. යම් කිසි තැනැත්තෙකු විසින් ලබා ගන්නා ලද පොතක් පහත සඳහන් හේතු මත ආපසු භාර දී නොමැති විට, එම පොත පිළිබඳ අයකර ගැනීම හෝ ලේඛණයෙන් ඉවත් කර ගැනීම පිළිබඳ තීරණය ගැනීමට පුස්තකාල කමිටුවේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා ගත යුතුය -

(1) සාමාජිකයා මිය ගිය විට;

(2) ජල ගැලීම්, ගිනි ගැනීම්, නාය යෑම්, සුළි සුළං වැනි ස්වාභාවික හේතු මත පොත අස්ථානගත වී ඇති විට; සහ

(3) සාමාජිකයන් විසින් ලබාගෙන මෙතෙක් ආපසු භාරදී නොමැති, එහෙත් ස්ථිර පදිංචිය වෙනස් කොට, සාමාජිකයා ආ ගිය අත පිළිබඳ කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි එමෙන්ම ඒ පොත ආපසු ලබා ගැනීම සඳහා ගත යුතු සියලු ක්‍රියා මාර්ගයන් ගැනීමට නොහැකි බව තහවුරු වී ඇති විට.

## ආශ්‍රේය අංශය

26. ආශ්‍රේය අංශය විවෘත කර තබනු ලබන වේලාවන් පුස්තකාල කමිටුවේ නිර්දේශ පරිදි නගර සභාව විසින් තීරණය කළ යුතු අතර, එය ප්‍රකටවන පරිදි නිවේදනය වී තිබිය යුතුය. ආශ්‍රේය අංශය පාවිච්චි කිරීම සඳහා පුස්තකාලයාධිපතිගේ අවසරය ලබාගෙන ඇත්නම් මිස සහ ආශ්‍රේය අංශයේ තබා ඇති රෙජිස්ටරයේ අත්සන් කර ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු විසින් ආශ්‍රේය අංශය පාවිච්චි නොකළ යුතුය.

27. කියවීම සඳහා තමා වෙත නිකුත් කරන ලද කිසිම පොතක් කිසිම තැනැත්තෙකු විසින් ආශ්‍රේය අංශයෙන් පිටතට ගෙන නොයා යුතුය.

28. ආශ්‍රෙය අංශය සඳහා පහත සඳහන් ගණයන්ට අයත් පොත් ඇතුලත් විය යුතුය -

(1) ආශ්‍රේය අංශය සඳහා සුදුසු යැයි දැනටමත් පුස්තකාල සේවා මණ්ඩල විසින් නිර්දේශිත පොත්;

(2) නවකතා හා කෙටි කතා පොත් හැර වැඩි වටිනාමක් ඇති දුර්ලභ ගණයේ පොත්;

(3) වෘත්තීය හා උසස් අධ්‍යාපන විෂයන්ට හා විශේෂිත විෂයන්ට අයත් පොත්; සහ

(4) ආශ්‍රේය අංශයට ඇතුලත් කළ යුතු යැයි පුස්තකාලයාධිපති විසින් නිර්දේශ කරන ලද පුස්තකාල කමිටුවේ අනුමැතිය ලත් පොත්

## කියවීම් ශාලාව

29. වයස අවුරුදු අටට නොඅඩු ඕනෑම කෙනෙකුට කියවීම් ශාලාව භාවිතා කිරීම සඳහා අවසර ලබා දිය හැකිය. එසේ වුවද කිසිම තැනැත්තෙකු විසින් තත් කාර්යය සඳහා පුස්තකාලයාධිපතිවරයාගේ හෝ බලයලත් නිලධරයකුගේ අවසරය ලබා ගෙන කියවීම් ශාලාවේ තබා ඇති රෙජිස්ටරයේ අත්සන් තබා ඇත්නම් මිස කියවීම් ශාලාව ප්‍රයෝජනයට නොගත යුතුය.

30. කියවීම් ශාලාවේ තබා ඇති හෝ කියවීම් ශාලාවට අයිති කිසිම පුවත්පතක්, වාර ප්‍රකාශයක්, සඟරාවක්, සිතියමක්, ගැසට් පත්‍රයක් හෝ කොටසක් හෝ

වෙන යම් ලියවිල්ලක් කිසිම තැනැත්තෙකු විසින් කියවීම් ශාලාවෙන් ඉවත් කර ගෙන නොයා යුතුය.

එසේ වුව ද, කියවීම් ශාලාවේ තබා ඇති යම් ලේඛණයක ඡායා පිටපතක් ලබා ගැනීමට යම් පාඨකයකු ඉල්ලා සිටී, නම් ඒ සඳහා සභාව විසින් තීරණය කර ඇති ගාස්තුවක් අය කර එම ඡායා පිටපත් ලබා දිය හැකිය.

## ළමා අංශය

31. වයස අවුරුදු 12 ට අඩු ළමුන් සඳහා කියවීමට ළමා අංශයක් වෙනම පවත්වාගෙන යා හැකිය.

32. ළමුන්ගේ කියවීමේ රුචිය ඇතිවන පරිදි ළමා පොත පත මෙම අංශය තුළ සපයා තිබිය යුතුය.

33. ළමා අංශයේ සංවර්ධනය සඳහා පුස්තකාල කමිටුවේ නිර්දේශයන් මත විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිය.

## විද්‍යුත් අංශය

34. පුස්තකාලයේ විද්‍යුත් පුස්තකාලසේවා පහසුකම් පවත්වාගෙන යාම හා නියාමනය කිරීම සඳහා පුස්තකාල කමිටුවේ නිර්දේශය මත, නගර සභාව විසින් සුදුසු යැයි සලකන පරිදි කළින් කලට විධිවිධාන සළසාලිය හැකිය.

35. සභාව විසින්, නියම කරනු ලැබිය හැකි ගාස්තුවකට යටත්ව පාඨකයින්ට තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් අන්තර්ජාල පහසුකම් සලසා ගැනීම, තොරතුරු සපයා ගැනීම හා වෙනත් පහසුකම් සලසා දීමට ද හැකියාව ඇත්තේය.

# ජංගම පුස්තකාලය

36. නගර සභාව විසින් ප්‍රජා මණ්ඩල අරමුණුකර ගනිමින් ජංගම පුස්තකාල සේවාවක් පවත්වාගෙන යා හැකිය.

37. නගර සභාවක් විසින් ජංගම පුස්තකාල සේවාවන් පවත්වා ගැනීම සම්බන්ධයෙන් පුස්තකාල කමිටුවෙහි නිර්දේශයන්ට යටත් විය යුතු අතර, එය ප්‍රජා මණ්ඩල මූලික හා විද්‍යුත්, ආශ්‍රිත වශයෙන් විය හැකිය.

38. ප්‍රජා මණ්ඩල මූලික ජංගම පුස්තකාල සේවාවන් පවත්වාගෙන යාමේදී ප්‍රජා මණ්ඩලයේ අධීක්ෂණය යටතේ කටයුතු කරන, ප්‍රජා මණ්ඩලය විසින් පත්කරනු ලබන පුස්තකාල භාරකරුවෙක් සිටිය යුතුය.

39. ජංගම පුස්තකාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්ෂික වාර්තාව සහ පොත් පත් නිකුත් කිරීම සහ භාරගැනීම පිළිබඳ වාර්තා පුස්තකාල කමිටුව වෙත ඉදිරිපත් කිරීම පුස්තකාල 777භාරකරුගේ කාර්යය විය යුතුය.

40. සෑම වර්ෂයක් පාසා ම පුස්තකාලයේ වත්කම් පිළිබඳ සමීක්ෂණයක් අදාළ පළාත් පාලන ආයතනය විසින් සිදු කල යුතුය.

41. සමික්ෂණ මණ්ඩලය සඳහා සාමාජිකයින් පත් කිරීම හා සමීක්ෂණය පවත්වා වාර්ථා ඉදිරිපත් කිරීම 1988 නගර සභා (මූල්‍ය හා පරිපාලන) රීතීවලට අනුකූලව සිදුකල යුතුය.

42. සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව ලැබීමෙන් පසුව එය සභා අනුමැතියට යොමු කොට අනතුරුව මාස 03ක් ඇතුළත සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කොට, පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වෙත වාර්තා කිරීම පුස්තකාලාධිපතිගේ කාර්යය වන්නේය.

43. ස්පර්ෂක හෝ බෝවන රෝගයකින් හෝ වසංගත රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නා වූ හෝ ළඟදී පෙළුනා වූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ලඟදී සාත්තු කළා වූද, කිසිවකු විසින් ඒ රෝගය බෝවීමට හා රෝග බීජයක් මේරීමට ගතවන කාල පරිච්ඡේදය පසුවන තෙක් පුස්තකාලයට අයිති ස්ථානයකට ඇතුළත් නොවිය යුතුය.

44. කිසිවකු විසින් -

(1) පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළත හෝ ඒ අසල නොමනා අන්දමින් හැසිරීම හෝ ගැහැටක් ඇතිවන කිසිවක් කිරීම;

(2) පුස්තකාලය තුළ හෝ ඒ අසළ වූ නගර සභාවෙහි ගොඩනැඟිල්ලෙහි කිසිම කොටසක හෝ දේපළකට පළුද්දක් හෝ හානියක් හෝ මොන අන්දමකින් වත් විරූපී කිරීම;

(3) තමා ගැන පිළිගත හැකි විස්තරයක් කියන්නට නැතිව ඒ පුස්තකාලය වැසූ පසු ඒ පුස්තකාලයට අයිති ස්ථානයෙහි නතරවී සිටීම හෝ ඔබ මොබ හැසිරීම;

(4) පුස්තකාල පරිශ්‍රය තුලදී මත් පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතය, දුම්බීම හෝ කෙළගැසීම;

(5) පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළතදී දාදු කෙළීම;

(6) කඩදාසි කොළ වලින් සූදු කෙළීම හෝ වෙනත් කිසියම් ක්‍රීඩාවක් කිරීම;

(7) පුස්තකාලය ඇතුළතදී කෑගැසීමෙන් හෝ සින්දු කීමෙන් හෝ

වෙනයම ඝෝෂාවක් කිරීමෙන් පුස්තකාලය පාවිච්චි කරන්නන්ට කරදර කිරීම;

(8) අපිරිසිදු ලෙසින් පුස්තකාලයට ඇතුල්වීම;

(9) පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළට බල්ලෙකු හෝ වෙනයම් සතෙකු ගෙන ඒම;

(10) පුස්තකාලයට අයිති ස්ථානයේ කිසිම කොටසක නිදාගැනීම හෝ කිසිම ආහාරයක් අනුභව කිරීම;

(11) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ තමා වෙත පැවරී ඇති බලතල නීත්‍යනුකූල ලෙස පාවිච්චි කිරීමට පුස්තකාලයාධිපති හට හෝ ඔහුගේ අණ පරිදි ක්‍රියාකරන අන් කිසිවකුට අවහිර කිරීම; හෝ

නොකළ යුතුය.

45. මෙම අතුරු ව්‍යවස්ථාවේ 43 වන වගන්තියේ සඳහන් කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකරු කිරීමෙන් පසු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ දඬුවමකට යටත් විය යුතුය.

46. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවෙහි -

“ පුස්තකාලය ” යන්නෙන් නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන මධ්‍යම පුස්තකාලයක්, මහජන පුස්තකාලයක් හෝ වෙනත් ඕනෑම පුස්තකාලයක් ද;

" සභාපති " යන්නෙන් නගර සභාවෙහි සභාපතිවරයා ද; සහ

" බලයලත් නිලධාරියා " යන්නෙන් පුස්තකාලයාධිපතිවරයා විසින් නිශ්චිතව බලය පවරන ලද නිලධාරියෙකු ද

අදහස් වේ.

## IX.පෞද්ගලික ඉඩම් වල ලිං පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු, එකී ආඥා පනතේ 157 (9) (ඡ) අනු ඡේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථා සෑදීමට නගර සභා වලට බලය ලැබී ඇත.

2. නගර සභා බල ප්‍රදේශය තුල පොදු සෞඛ්‍ය හා සැප විහරණය ප්‍රවර්ධනය කිරීමෙහිලා, පෞද්ගලික ඉඩම් වල ලිං ඉදිකිරීම සහ දැනට පවත්නා ලිං පරිපාලනය හා අධීක්ෂණය සඳහා පැනවෙන අතුරු ව්‍යවස්ථාවකි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව පෞද්ගලික ඉඩම් වල ලිං පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ.

4. යම් කාර්යයක් උදෙසා ජලය ලබා ගැනීමට නගර සභා බල ප්‍රදේශය ඇතුලත ලිං තැනීම, ඉදි කිරීම, පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම කරනු ලබන සෑම තැනැත්තකුම, මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් පිළිපැදිය යුතුය.

5. ලිං තැනීමට හෝ දැනටමත් තනා ඇති ලිං තවදුරටත් පවත්වා ගෙන යාමට අදහස් කරන සෑම තැනැත්තකුම, නියමිත ගාස්තුවක් ගෙවා නගර සභා කාර්යාලයෙන් ලබාගතයුතු අයදුම් පත්‍රයක් පුරවා ඉදිරිපත් කිරීමෙන්

සභාපතිවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.

6. (1) ලිඳ තැනීමට අපේක්ෂිත ඉඩමෙහි හෝ ලිඳ පවත්නා ඉඩමෙහි තිබෙන සියලු ගොඩනැගිලි, නිවාස, වැසිකිළි, ලිං, කාණු කම්හල් ආදී සියලු ඉදිකිරීම් වල පිහිටීම හා අලුතින් ලිඳ තැනීමට අපේක්ෂිත ස්ථානයෙහි පිහිටීමද සලකුණු කරන ලද මිනින්දෝරු සැලැස්මක් සහ

(2) අලුතින් ලිං තනනු ලබන ඉඩමෙහි හිමිකරු, අයදුම්කරු නොවන අවස්ථාවකදී ඉඩම් හිමිකරුගේ එකඟත්වය පල කරන ලද ලිපියක්ද අලුතින් තැනීමට අපේක්ෂිත ලිඳ සම්බන්ධයෙන්, සුදුසුකම්ලත් තාක්ෂණ නිලධාරියකු විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තු, සැලසුම් හා ප්‍රමාණ පත්‍රද;

ඉහතකී 5 වන වගන්තියේ සඳහන් අයදුම් පත්‍රය සමඟ නගර සභාවේ සභාපති වෙත ඉදිරිපත් කළ යුත්තේය.

7. පානය කිරීම, ස්නානය කිරීම හෝ වෙනත් ගෘහස්ත කාර්යයන් සඳහා ජලය ලබා ගන්නා සෑම ලිඳක් පිහිටි ඉඩමකට අයිතිකරු, භාරකරු, බදුකරු හෝ පදිංචිකරු විසින් -

(1) කවර හෝ දුරක සිට මතුපිට වැසි ජලය හෝ අප ජලය එක එල්ලේ ලිඳට ගලාගෙන ඒම;

(2) ලිඳ ගැට්ටෙහි සිට මීටර් 5ක දුරක සිට වැසි ජලය ලිඳ තුලට කාන්දු වීම; සහ

(3) ලිඳ පිහිටි ඉඩමෙහි බිම් මට්ටමේ සිට මීටර් 3කට අඩු ගැඹුරකින් ලිඳ තුලට භූගත ජලය කාන්දු වීම වැලැක්වීමට; ද,

අවශ්‍ය විධිවිධාන සැලසීම කළ යුතුය.

8. පානය කිරීම, ස්නානය කිරීම හෝ වෙනත් ගෘහස්ත කාර්යයක් නොවන කාර්මික හෝ ව්‍යාපාරික හෝ කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා ජලය ලබා ගන්නා සෑම ලිඳක්ම පිහිටා ඇති ඉඩමක අයිතිකරු, භාරකරු, බදුකරු හෝ පදිංචිකරු විසින් -

(1) කවර හෝ දුරක සිට මතුපිට වැසි ජලය හෝ අප ජලය එක එල්ලේ ලිඳට ගලාගෙන ඒම වැලැක්වීමට; සහ,

(2) ලිඳ පිහිටි ඉඩමෙහි බිම් මට්ටමේ සිට මීටර එකකට නොඅඩු උසකින් යුත්, ස්ථාවර ආරක්ෂක බැම්මක් ඉදිකර ලිඳ සම්පූර්ණයෙන්ම ආවරණය වන සේ කොන්ක්‍රිට් තට්ටුවකින් ආවරණය කිරීමට; ද,

අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය.

9. සෑම ලිඳකම සිට මීටර් 30ක දුරක් ඇතුලත පිහිටි සෑම ජල බස්නා කානුවක්ම සිමෙන්තියෙන් බැද හෝ කොන්ක්‍රිට් වලින් නිමවා, නිරන්තරයෙන් පවිත්‍රව නඩත්තු කළ යුතුය.

10. පානය සඳහා ජලය ලබාගන්නා සෑම ලිඳක්ම බිම් මට්ටමේ සිට මීටර එකකට නොඅඩු උසකින් යුත් ලිං බැම්මකින් ආවරණය කළයුතු අතර, ස්නානය සඳහා

ජලය ලබා ගන්නා සෑම ළිඳක්ම කුඩා දරුවන්ට හා සතුන්ට ළිඳ වෙත යාමට නොහැකි වන සේ ආරක්ෂිත වැටකින් හෝ බැම්මකින් ආවරණය කර තිබිය යුතුය.

11. සෑම ළිඳක්ම යටත් පිරිසෙයින් මාස 06 කට වරක් ජලය ඉස පිරිසිදු කළ යුතුය.

12. පානය කිරීම, ස්නානය කිරීම හෝ වෙනත් ගෘහස්ථ කාර්යයන් සඳහා ජලය ලබා ගන්නා සෑම ළිඳකම සිට මීටර් 15ක දුර ප්‍රමාණය ඇතුලත -

(1) කිසිම වැසිකිලි වලක්, කුණු දිය වලක්, දියබස්නා වලක්, වල වැසිකිලියක්, සත්ව ගාලක් හෝ සත්ව කොටුවක්;
(2) කාබනික හෝ රසායනික පොහොර හෝ කසල එක්රැස්වන ස්ථානයක්; හෝ
(3) පලුදු වූ හෝ කැඩීබිඳී ගිය කාණුවක්;

ඉදිකිරීම, පවත්වාගෙන යාම හෝ පවතින්නට ඉඩහැරීම නොකළ යුතුය.

13. ළිඳකින් ජලය ලබාගැනීමට අපිරිසිදු බාල්දි හෝ භාජන භාවිතා නොකළ යුතුය.

14. පානීය ජලය ලබාගන්නා කිසිදු ළිඳක සිට මීටර් 4.5ක් ඇතුලත රෙදි සේදීම, සතුන් නෑවීම හා වළං පිඟන් සේදීම නොකළ යුතුය.

15. දිරා පත්වන කොල, අතු, මල් හෝ ගෙඩි හෝ සතුන් ළිඳ තුලට නොවැටෙන සේ ආරක්ෂක දැලක් සවි කිරීමෙන් තොරව ළිං ජලය භාවිතයට නොගත යුතුය.

16. මෙම අතුරුව්‍යවස්ථාවේ 5 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු අයදුම් පත්‍රයක් නගර සභාවට ඉදිරිපත් කර දින 21ක් ඇතුලත අදාළ ස්ථානය බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂාකර බලා වාර්තා කිරීමෙන් පසු එයට අනුමැතිය දීම හෝ ප්‍රතික්ෂේප කිරීම සභාපතිවරයා විසින් කළයුතුය.

17. ජලය භාවිතයට ගන්නා ළිඳක් ඉසීම, ශුද්ධ කිරීම, අළුත්වැඩියා කිරීම හෝ වසා දැමීම කරන ලෙස ළිඳ පිහිටි ඉඩමෙහි අයිතිකරුට, භාරකරුට, බදුකරුට හෝ පදිංචි කරුවෙකුට ලිඛිත දැන්වීමක් මගින් නියම කිරීමට නගර සභාවේ සභාපතිවරයාට බලය ඇත්තේය.

18. යම් වැසිකිළිවලක, කුණු දිය වලක, දිය බස්නා වලක, සත්ව ගාලක හෝ සත්ව කොටුවක හෝ අප ජලය ගලා බස්නා අපවිත්‍ර ඇලක හෝ කාණුවක සිට මීටර් 30ක දුර ප්‍රමාණයක් ඇතුලත ළිං ඉදිකිරීමට හෝ ළිං පවත්වාගෙන යාමට ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ විශේෂ අවසරයක් රහිතව සභාපති වරයා විසින් අවසර නොදිය යුත්තේය.

19. ගංවතුර, නායයෑම්, වසංගතරෝග පැතිරීයාම හෝ වෙනයම් ආපදාකාරී ස්වභාවයක් හේතු කොටගෙන යම් ළිඳක් වසා දමන ලෙස, පවිත්‍රකරන ලෙස, ඉසින ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස, එම ළිඳ පිහිටි ඉඩමේ අයිතිකරුට, භාරකරුට, බදු කරුට, හෝ පදිංචිකරුට, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ නගර සභාවේ සභාපති වරයා විසින් විධාන කරනු ලැබිය හැකිය.

20. ඉහත 19 වන වගන්තිය යටතේ කරන ලද විධානයක් දින 7 ක් තුළ ඉටු නොකරන්නේ නම්, එම විධානයෙහි සදහන් කාර්යය නගර සභාවේ සේවකයන් යොදවා ඉටුකිරීමට ද ඒ සඳහා වන වියදම් එකී විධානය පැහැර හරින ලද තැනැත්තන්ගෙන් අයකර ගැනීමට ද නගර සභාවේ සභාපති වරයාට බලය ඇත්තේය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 5 වන වගන්තියෙහි සදහන් අනුමැතිය ලබාගැනීමට අයදුම් කරන සෑම තැනැත්තකුම කලින් කළ නගර සභාව විසින් යෝජනා සම්මතයක් මගින් පනවන ලදුව රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද පරීක්ෂණ ගාස්තුවක් නගර සභාවට ගෙවිය යුතුය.

22. රෝහල්, පාසල්, ආගමික හෝ පූජනීය ස්ථාන ඉහත කී 21 වන වගන්තියෙහි සදහන් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් නිදහස් වන්නේය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එසේ වරද කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස -

''සභාපති'' යනුවෙන් නගර සභාවේ සභාපතිවරයා; ද,

''බලය ලත් නිලධාරියකු'' යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද සභාවේ නිලධාරියකු; ද,

අදහස් කරනු ලබන්නේය.

## X.භෝජනශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (9)( උ) ඡේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථා සෑදීමට නගර සභා වලට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ භෝජනශාලා විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවකි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව භෝජනශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යාවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ භෝජනශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතුය.

6. මේ අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් කොන්දේසි ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස, සභාපතිවරයා විසින් කවර හෝ භෝජනශාලාවකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

    (1) වහලය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය.

    (2) භෝජනශාලාවෙහි බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිගන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(3) භෝජනශාලා පරිශ්‍රය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර, එකී කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් සහිත විය යුතුය.

(4) භෝජනශාලා පරිශ්‍රය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ, මතු දක්වන නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතුය.

(5) භෝජනශාලා පරිශ්‍රය තුළ පාවිච්චි කරන ගෘහ උපකරණ මනා නිමවුමක් සහිත විය යුතු අතර, මේස හා පුටු ආදීය ලීයෙන් හෝ ලෝහයෙන් තනා ඔප දමා හෝ මේස වීදුරු තහඩුවක් යොදා තිබිය යුතුය.

(6) පාරිභෝගිකයින් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතුය.

(7) ගණුදෙනු කරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා ප්‍රමාණවත් වන සේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතුය.

(8) පාරිභෝගිකයින්ගේ පාවිච්චියට වෙන් කළ කොටස තුළ, ගණුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔප දැමූ හෝ ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ

බේසම් තනා ජල පහසුකම් සපයා තිබිය යුතුය.

(9) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇති කර තිබිය යුතුය. කිසි විටකත් කාණු පොදු ප්‍රවේශයකට මුදා නොහැරිය යුතුය.

(10) ස්ථානයේ ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතුය.

(11) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිවැද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතුය.

7. භෝජනශාලා සඳහා වන සියලු ස්ථිර ඉදිකිරීම් සභාපතිවරයා විසින් අනුමත කර ඇති සැළැස්මකට අනුකූලව ඉදිකර තිබිය යුතුය.

8. ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යායුතුය.

9. ස්ථානයේ සෑම කාමරයකම බිත්ති මීටර් 2.5 කට නොඅඩු උසකින් යුක්ත විය යුතුය. එකී බිත්ති ස්ථිර ලෙස තනා තිබිය යුතු අතර දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතුය.

10. භෝජන ශාලාවෙහි අභ්‍යන්තර පරිශ්‍රයෙහි සෑම කාමරයකම සිවිලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සිවිලිම පොලොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට නොඅඩු උසකින් තිබිය යුතුය.

11. සෑම කාමරයකටම විවෘත කල හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කල විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ගඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතුය. එසේ වුවද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවකදී මෙකී විධිවිධාන එලෙසින්ම අදාල නොවිය හැකිය.

12. භෝජනශාලාව ඊට අදාල සියළු පරිශ්‍රයන් තීන්ත ආලේප කර මනා තත්වයෙන් පවත්වා ගැනීම බලපත්‍ර ලාභියාගේ කාර්යය වන්නේය.

13. බලපත්‍ර ලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කල යුතු අතර අප ජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කල යුතුය.

14. භෝජනශාල පරිශ්‍රය තුළ සුරතලය සඳහා බල්ලන් හෝ පූසන් වැනි සතුන් ඇති නොකළ යුතු අතර බාහිරින් එවැනි සතෙකු භෝජනාගාර පරිශ්‍රයට ඇතුල්වීම වැළැක්වීම සඳහා පියවරගෙන තිබිය යුතුය.

15. භෝජනශාලාවේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කල යුතු අතර දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතුය.

16. භෝජනශාලාවෙහි ආහාර රඳවනයන් හා ආහාර ඇල්ලීම සඳහා නිශ්චිත මෙවලම් පාවිච්චි කල යුතු අතර, ඒ සියල්ල මනා ලෙස පිරිසිදු කර තබා ගත යුතුය.

17. (1) භෝජනශාල පරිශ්‍රය තුළ ජනනය වන සියළුම අප ද්‍රව්‍ය -

I. ජෛවහායන අපද්‍රව්‍ය;

II. වීදුරු;

III. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රීත ද්‍රව්‍ය;

IV. පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය; සහ

V. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

වශයෙන් වෙන් වෙන්ව එක් රැස් කල යුතුය.

(2)භෝජනශාලාව තුළ ඉහත උප වගන්තියෙහි වූ ක්‍රමවේදයන් යටතේ එක්රැස්වන කසල බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන කසළ කළමනාකරණ වැඩසටහනකට අනුකූලව අවසන් බැහැර කිරීම සඳහා කටයුතු කල යුතුය.

18. (1) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙලෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙලෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙලෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, කවර හෝ භෝජන ශාලාවක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(2) පිරිසිදු කල ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස, කවර හෝ

තැනැත්තෙකු විසින් භෝජන ශාලාවේ කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(3) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍ර ලාභියාගේ කාර්යය විය යුතුය.

19. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරිමේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම වෙන වෙනම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී පිළිවැසුම් පැලඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

20. සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ බලයලත් නිලධාරියෙකු විසින් භෝජනශාලාවක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වියයුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

21. සභාපතිවරයා හෝ සභාපතිවරයා තත්කාර්ය සඳහා බලය දෙනු ලැබූ නිලධරයකු භෝජනශාලාවකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන අතර, එම ස්ථානයට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට බලපත්‍රලාභියා හෝ එය භාරව සිටින තැනැත්තා හෝ ඉඩ දිය යුතුවා මෙන්ම ඊට අවශ්‍ය සියළු සහාය ද ලබා දිය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන විධිවිධාන උල්ලංඝනය වන පරිදි

භෝජනශාලාවක් පවත්වාගෙන යාමේදී හා එකී උල්ලංඝනය පිළිබඳ සභාපතිවරයා විසින් දැනුම් දීමක් කරනු ලැබූ විටකදී, එහි දැනුම් දීම යටතේ නිවැරදි වීම සඳහා ලබා දී ඇති කාලසීමාව තුළ එසේ නිවැරදි කිරීම් කර නොමැති විටෙකදී නිකුත් කර ඇති බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එසේ වරද කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ -

"සභාපතිවරයා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා; ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව යම් කාර්යයක් සඳහා බලය පවරනලද ඕනෑම නිලධාරියෙකු; ද,

"භෝජනශාලාවක්" යන්නෙන් නගර බල ප්‍රදේශය තුළ පිහිටි නවාතැන් සැපයීමක් නොකරන පාරිභෝගිකයින් සඳහා සකස් කරන ලද ආහාර හෝ ආහාර සකස් කරමින් හෝ පරිභෝජනය සඳහා මුදල් ගෙවා ලබා ගැනීම සඳහා අවස්ථාව සලසා ඇති සියලු බත්කඩ, ආපනශාලා, තේ හා කෝපිකඩ; ද,

අදහස් වේ.

## XI.වසංගත රෝග සහ ස්පර්ශක රෝග පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (9)(න) අනු ඡේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථා සෑදීමට නගර සභා වලට බලය ලැබී ඇත.

2. පොදු මහජන සෞඛ්‍ය හා සැප විහරණ ක්‍රම ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සභාව සතු කාර්ය භාරය ඉටුකිරීමේදී වසංගත රෝග, බෝවන රෝග, ඒකදේශික රෝග සහ ස්පර්ශක රෝග වැලැක්වීම, ප්‍රහීන කිරීම සහ එකී රෝග පවත්නා අතර මියයන තැනැත්තන් ඉක්මනින් භූමදානය කිරීමට අදාල විධිවිධාන සැලැස්වීම ද උදෙසා පැනවෙන අතුරු ව්‍යවස්ථාවකි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව වසංගත රෝග සහ ස්පර්ශක රෝග පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ.

4. වසංගත හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන බවට වෛද්‍ය නිලධාරියකු විසින් සනාථ කර ඇති තැනැත්තකු, ඔහු පදිංචි නිවසින් හෝ පදිංචි ස්ථානයෙන් වහාම ඉවත්කර යම් රෝහලකට හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයකට යවන ලෙස සෞඛ්‍යය වෛද්‍ය නිලධාරියා හෝ රජයේ වෛද්‍ය නිලධාරියකු නියම කර ඇති විට එකී නිවසේ හෝ ස්ථානයෙහි පදිංචිව සිටින අය හෝ භාරකරු හෝ ගෘහමූලිකයා එම නියමය අනුව වහාම ක්‍රියාකල යුතුය.

5. ඉහත 4වන වගන්තිය යටතේ නියම කර ඇති ආරෝග්‍යශාලා හෝ ප්‍රතිකාර මධ්‍යස්ථාන, නිරෝධායනය යටතේ තැබිය යුතුය.

6. ඉහත 4වන වගන්තිය යටතේ නම් කරන ලද රෝහලකට හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයකට එහි ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයාගේ අනුමැතිය ඇතිව මිස, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ රෝහල් කාර්ය මණ්ඩලයට අයත් නොවන

කිසිදු තැනැත්තකු ඇතුල් නොවිය යුතුය.

7. වසංගත හෝ ස්පර්ශ රෝග වලින් පෙලෙන්නාවූ හෝ එයින් සුවය ලබමින් සිටින්නාවූ රෝගීන්ට වෙන්කර ඇති නාන ස්ථාන වල හැර අන් කිසිදු ස්ථානයක ස්නානය කිරීමට එකී තැනැත්තන්ට ඉඩ දෙනු නොලැබිය යුතුය.

8. වසංගත හෝ ස්පර්ශක රෝග වලින් පෙලෙන හෝ සුවය ලබමින් සිටින කිසිදු තැනැත්තකු පොදු නාන ස්ථාන වල ස්නානය කිරීම, සේදීම හෝ එහි ජලය භාවිතා කිරීම නොකළ යුතුය.

9. රෝහලක හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක ප්‍රතිකාර ලබන කිසිම තැනැත්තකු එකී රෝහලෙහි හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි වෛද්‍ය නිලධාරීවරයාගේ නිර්දේශය මත හැර එකී රෝහලෙන් හෝ මධ්‍යස්ථානයෙන් මුදාහැරීම හෝ එවැනි තැනැත්තෙකුට පිටව යාමට ඉඩදීම නොකළ යුතුය.

10. වසංගත හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙමින් සිටි තැනැත්තකු ඉවත් කරනු ලැබුවේ යම් නිවසක හෝ ස්ථානයක සිටද එම නිවස හෝ ගොඩනැගිල්ල පවිත්‍ර කිරීමේ කාර්ය සඳහා දින 7 කට නොඅඩු කාලයක් නිරෝධායනය යටතේ තැබීමට සභාපතිවරයාට හෝ ප්‍රදේශයේ සෞඛ්‍යය වෛද්‍ය නිලධාරියාට බලය හිමිවන්නේය.

11. ඉහත 10වන වගන්තිය අනුව නිරෝධායනය යටතේ තබන ලද ස්ථානයකට -

    (1) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ අවසරය රහිතව කිසිඳු තැනැත්තකු ඇතුලු නොවිය යුතුය.
    (2) යම් තැනැත්තකු ඇතුලුවීම වැලැක්වීම සඳහා එය වැටකින් ආවරනය කිරීම හෝ ඒ අසලින් වැටී ඇති මාර්ගයන් වසාදැමීමට හෝ සභාපතිවරයාට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාට බලය හිමිවන්නේය.

12. ඉහත 10වන වගන්තිය යටතේ නිරෝධායනය කරන ලද නිවාසයක හෝ ගොඩනැගිල්ලක වාසය කරන තැනැත්තන්, නිරෝධායන කාලසීමාව තුල නඩත්තු කිරීමේ පිරිවැය, සභා තීරණයක් මත නගර සභාව විසින් දැරිය යුත්තේය.

13. ඉහත 10වන වගන්තිය යටතේ හෝ 5 වන වගන්තිය යටතේ නිරෝධායනකට

යටත් කල ස්ථානයක් තුල මහජනයාට එක්රැස්වීම හෝ රැඳීසිටීම තහනම් කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

14. වසංගත හෝ ස්පර්ශක රෝගයකින් මියගිය තැනැත්තෙකුගේ මළසිරුරක් එකී පුද්ගලයා මරණයට පත්වී පැය 24 ක් තුල මිහිදන් කිරීමට හෝ අවසන් කටයුතු කිරීමට කටයුතු කලයුතුය.

15. ඉහත 14 වන වගන්තිය යටතේ මිහිදන් කරනු ලබන මළසිරුරක් මීටර් 2 කට අඩු ගැඹුරක නොවැළලිය යුතුය.

16. වසංගත හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන හෝ මෑතදී සුවය ලැබූ කිසිම තැනැත්තෙක් වෛද්‍යවරයා විසින් බැහැර නොයන ලෙස නිර්දේශිත කාල සීමාව ඉකුත් වන තෙක් පොදු නාන ස්ථානයක, හෝටලයක, වෙළඳසැලක, ආපනශාලාවක, ආගමික මධ්‍යස්ථානයක, පාසලක හෝ මහජනයා රැස්වන කිසිදු ස්ථානයක ගැවසීම, එයට ඇතුලුවීම හෝ එහි යම් කාර්යයක නිරතවීම නොකළ යුතුය.

17. වසංගත හෝ ස්පර්ශක රෝග ව්‍යාප්තිය වැලැක්වීම උදෙසා යම් ආපනශාලා, බේකරි, හෝටල්, බත්කඩ, තේ හෝ කෝපි කඩ, සකස්කල හෝ පිසින ලද ආහාර විකුණන ස්ථාන යම් නියමිත කාලයකට වසා තබන ලෙස හෝ මස්, කුකුලු මස්, මාලු හෝ යම් ආහාර වර්ගයක් අලෙවි නොකරන ලෙස සභාපතිවරයාට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාට නියම කල හැක්කේය.

18. වසංගත හෝ ස්පර්ශක රෝග පැතිරීයාම, ඒවා මර්ධනය, ප්‍රහීන කිරීම හා නිරෝධායනයට යම් යම් ස්ථාන යටත් කිරීමට ගතයුතු පියවරයන් ගැන ප්‍රජාව දැනුවත් කිරීම, ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීම, හා මහජන සෞඛ්‍යාරක්ෂාවට අදාල නියමයන් පැනවීමට සභාපතිවරයාට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාට බලය ඇත්තේය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් යම් වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එසේ වරද කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය .

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ -

‘‘සභාපති’’ යනුවෙන් නගර සභාවේ සභාපතිවරයා; ද,
“බලය ලත් නිලධාරියා’’ යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියකු; ද,

අදහස් වන්නේය.

## XII.පෞද්ගලික වැසිකිළි සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

1. 255වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය ස කියවිය යුතු එකී ආඥා පනතේ 157 වන වගන්තියෙහි (8) (ඈ) අනු ඡේදය යට මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට නගර සභාවලට බලය ලැබී ඇත.

2. නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් විසින් වැසිකිළි සාදාගැනීම භාවිතය විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස වන අ ව්‍යවස්ථාවකි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික වැසි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ගේ භාවිතය සඳහා ඉදිකරනු ල සෑම වැසිකිළියක්ම සභාපතිවරයා විසින් අනුමත සැලැස්මකට අනුකූල වූ විය යුතුය.

5. බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් විසින් ඉදිකරනු ලබන වැසිකිළි සම්බන්ධ

සැලසුම් අනුමත කිරීමේදී 1915 අංක 19 දරණ නිවාස හා නගර සංවර්ධන ආඥ
පනතේ හෝ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධා
හෝ ඒ යටතේ සාදන ලද යම් ලිඛිත නීතියක සඳහන් විධිවිධාන, මෙම අනු
ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අතිරේක වන පරිදි අවස්ථාවෝචිතව අදා
විය යුතුය.

5. බල ප්‍රදේශය තුළ සෑම පරිශ්‍රයක් සඳහාම වන වැසිකිළියක් පිරිසිදු
සෞඛ්‍යාරක්ෂිතව තබා ගැනීම පරිශ්‍රයේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ හෙ
භාරකරුගේ කාර්යය විය යුතුය.

6. සභාපති විසින් බල ප්‍රදේශය තුළ යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෙ
භාරකරු වෙත කරනු ලබන දැනුම්දීමක් මඟින් අදාළ වැසිකිළි නිසි හා යෝග
ආකාරයෙන් පවත්වාගැනීම සම්බන්ධයෙන් නියමයන් කළ හැකිය. නැතහො
අදාළ වැසිකිළි එම නියමයෙහි නිශ්චිතව දක්වා ඇති කාල සීමාවක
අලුත්වැඩියා කරන ලෙස හෝ වසා දමන ලෙස නියමයන් කළ හැකිය.

7. යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ භාරකරු පරිශ්‍රය සඳහා ව
වැසිකිළි පරිහරණය කිරීමේදී සෞඛ්‍ය ආරක්ෂිතව මෙන්ම, අවි
පදිංචිකරුවන්ට එමගින් පීඩාවක් ඇති නොවන පරිදි පවත්වාගැනීමට සෑම විට
කටයුතු කළ යුතුය.

8. යම් පරිශ්‍රයක සාදා ඇති වැසිකිළියක් -

(1) සාදා තිබෙන ආකාරය නියමානුකූල නොවන බවට; හෝ,

(2) සෞඛ්‍ය ආරක්ෂිත නොවන බවට; හෝ,

(3) අලුත්වැඩියාවන් කළ යුතු බවට; හෝ,

(4) අවට පදිංචිකරුවන්ට එමගින් පීඩාකාරී තත්ත්වයකට මුහු
දීමට සිදුවී ඇති බවට; හෝ,

සභාපතිවරයාට තහවුරුවන ඕනෑම අවස්ථාවක අදාළ වැසිකිළිය අලුත්වැඩි කිරීමට හෝ එය කඩා දමා අලුතින් ඉදි කරන ලෙසට හෝ පීඩාවන් වැලැක්වීම පියවර ගන්නා ලෙසට පරිශ්‍රයෙහි අයිතිකරුවාට හෝ පදිංචිකරුවාට හෙ භාරකරුවාට සභාපති විසින් ලිඛිතව නියමයක් මගින් දැනුම්දීම නීත්‍යානුකූ වන්නේය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් යම් වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබ නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරද වන අතර, එසේ වරද කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙ නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු නගර සභා ආඥ පනතේ 153 වගන්තිය යටතේ නියම කර ඇති දඩුවමකට යටත් විය යුතුය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාව -

"සභාපති" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා; ද,

"තැනැත්තෙකු" යන්නෙන් යම් පරිශ්‍රයක අයිතිකරුවකු, පදිංචිකරුව හෝ පරිශ්‍රයෙහි භාරකරු හෝ කළමනාකරු ; ද,

''බල ප්‍රදේශය'' යන්නෙන් නගර සභාවේ පරිපාලන සීමාව ඇතුලත ප්‍රදේශය; ද,

"වැසිකිළිය" යන්නෙන් ජල මුද්‍රිත වැසිකිළියක් හෝ දිය වැසිකිළියක් හෙ භාවිතය සඳහා වන වෙනත් ඕනෑම වැසිකිළියක්; ද,

අදහස් වන්නේය.

# XIII.පොදු වෙළඳපොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (II) උප වගන්තිය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට නගර සභාවලට බලය ලැබී ඇත.

2. සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන පොදු වෙළඳ පොළ පවත්වාගෙන යාම,විධිමත් කිරීම ඒතුල විකුණනු ලබන භාණ්ඩ අධීක්ෂණය කිරීම සහ ඒතුල විකුණනු ලබන භාණ්ඩ පරික්ෂා කිරීම සහ පාලනය කිරීම පිළිබඳව මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව පොදු වෙළඳ පොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. නගර සභාව විසින් ඉදිකර පවත්වාගෙන යන කිසියම් පොදු වෙළඳපොළක ගොඩනැගිල්ලේ-

    (1) කවර හෝ කඩ කාමරයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා ,

        I. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ නගර සභාව සමග අත්සන් කළ බදු ගිවිසුමකට එළඹ ඇති තැනැත්තෙකු හෝ

ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු විය යුතුය.

II. එකී තැනැත්තා මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාවල සහ එකී බදු ගිවිසුමේ සඳහන් නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතුය.

III. එකී තැනැත්තා සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු වේ නම් ඔහුගේ නම නගර සභා කාර්යාලයේ ලියාපදිංචි කර තිබිය යුතුය.

(2) කඩකාමරවලින් බැහැර කොටසේ තනා ඇති කිසියම් වෙළඳ මැස්සක් හෝ බිමක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා,

I. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ නගර සභාවේ අධිකාරය මත හෝ ඒ යටතේ නිකුත් කළ මෙහි 1 වන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කල වලංගු ටිකට් පතක් දරන්නෙකු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුයෝජිතයකු විය යුතුය.

II. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි හා නියමයන්ට යටත්විය යුතුය.

III. සේවකයකු හෝ අනුයෝජිතයකු වේනම් ඔහුගේ නම නගර සභා කාර්යාලයේ ලියාපදිංචි

කර තිබිය යුතුය.

5. නගර සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන පොදු වෙළඳපොළ සම්බන්ධයෙන් නගර සභාව විසින් පහත සදහන් නියමයන් පිළිපැදිය යුතුය:-

එකී පොදු වෙළදෙපොළෙහි -

(1) ස්ථිර ගොඩනැගිලි සියල්ල ම ගඩොලින් , සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර බිත්තිවල උස අවම වශයෙන් පොළව මට්ටමේ සිට මීටර් 3ක් විය යුතුය.

(2) වහලය කිසියම් ස්ථිර ද්‍රව්‍යකින් තනා තිබිය යුතුය.

(3) ඇතුලත කඩ කාමරවල වහලයට සිවිලිමක් සවිකර තිබිය යුතු අතර එකී සිවිලිම පොළව මට්ටමේ සිට මීටර් 2.85ක් උසින් පිහිටා තිබිය යුතුය

(4) ගොඩනැගිල්ල ඇතුලත කඩ කාමරවල ඉදිරිපස අවම වශයෙන් මීටර් 2.5ක පළලින් යුතු කොරිඩෝරයකින් යුක්ත විය යුතු අතර සෑම කඩ කාමරයක්ම කොරිඩෝරයට සම්බන්ධවන ස්ථානයේ අකුලන දොරකින් හෝ පලු වශයෙන් ගලවා විවෘත කල හැකි දොරකින් යුක්ත විය යුතුය.

(5) කඩ කාමර සහිත ගොඩනැගිල්ලේ බිත්තිවල පිටත මායිමේ සහ කොරිඩෝව පිටත මායිමේ අවම වශයෙන් මීටර් එකක පළලින් යුතු වේදිකා බැමි සහ වැසි ජලය ගලා යාමේ කාණු තනා තිබිය යුතුය.

(6) ගොඩනැගිල්ලේ කඩ කාමර වලින් යුතු කොටසින් බැහැරව තාවකාලික වෙළඳුන් සඳහා වෙළඳ මැහි තනා තිබිය යුතුය.

(7) ඇතුලත ඉදිකරනු ලබන සෑම වෙළඳ මැස්සක්ම ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් ඉදි කල බැම්මක් මත කොන්ක්‍රීට් තහඩුවකින් හෝ මළ නොබැදෙන ලෝහ තහඩුවකින් නිම කල තහඩුවකින් යුක්ත විය යුතුය. කොන්ක්‍රීට් තහඩුවකින් තට්ටුව නිමකර ඇති විටක එකී තට්ටුව කපරාරු කර සිමෙන්තියෙන් ඔපදමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය. ඒ ආකාරයෙන් වෙළඳ මැහි තැනීමට නොහැකිවන යම් අවස්ථාවක, පොළොව මත සමතලා ආකාරයෙන් වූ ඉඩ කොටස් තනා තිබිය යුතු අතර එකී කොටස් ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් නිම කර සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතු අතර එක් එක් කොටස වෙන් කෙරෙන ඉරි සලකුණු සුදු පාටින් ලකුණු කර තිබිය යුතුය.

(8) සෑම වෙළඳ මැස්සක ම වර්ග ඵලය අවම වශයෙන් වර්ග මීටර් දෙකකට නොඅඩු විය යුතුය.

(9) සෑම වෙළඳ මැස්සක් ම ආවරණය වන සේ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ ගැල්වනයිස් කළ යකඩ බටවලින් හෝ වැර ගැන්වූ ඇළුමිනියම් බට යෙදු කණු මත අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.25ක උසකින් යුක්ත වහළයක් තනා තිබිය යුතු අතර අගුව අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.1 ක උසකින් යුක්ත විය යුතුය. එසේම එකී කණු ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා ඇත්තේ නම් කපරාරු

කර තීන්ත ආලේප කර තිබිය යුතු අතර ගැල්වනයිස් කළ යකඩයෙන් නිම කර ඇත්තේ නම් එකී කණුවල තීන්ත ආලේප කර තිබිය යුතුය.

(10) සෑම වහළයක් ම ස්ථිර ද්‍රව්‍යකින් තනා තිබිය යුතු අතර වැහිපීලිවල රැස්වන ජලය පහළට බැසයාමට ප්‍රමාණවත් බට සවිකර තිබිය යුතුය. වැහිපීලිවල ජලය රැඳී තිබෙන ආකාරයෙන් ගස්වල කොළ හෝ වෙනත් කුණු එක් රැස්වී නොතිබීමට අවශ්‍ය විධි විධාන සභාව විසින් සලසා තිබිය යුතුය.

(11) සෑම වෙළඳ මැස්සක් වටා පොළොවේ සිට අවම වශයෙන් මීටර් එකක පළලින් යුක්ත වේදිකා බැමි තනා තිබිය යුතු අතර වැසි ජලය ගලා යාමට ප්‍රමාණවත් කාණු තනා තිබිය යුතුය.

(12) ඇතුලට එක එල්ලේ පතිතවන, වහලය මතට පතිත වන, වර්ෂා ජලය සහ මෙම වගන්තියේ 14වන උප වගන්තිය යටතේ පොදු වෙළඳපොලේ එළවළු හා පළතුරු සේදීම සඳහා වෙන්කල ස්ථානයෙන් බැහැර කෙරෙන ජලය, නිසි ආකාරයෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු පද්ධතියක් තනා තිබිය යුතු අතර එකී අපජලය බාධාවකින් තොරව ගලා යාමට සලස්වා තිබිය යුතුය.

(13) පරිශ්‍රය ඇතුලත පොදු ජල කරාම සවි කර තිබිය යුතුය.

(14) එළවළු හෝ පළතුරු සේදීම සඳහා ස්ථානයක් වෙන් කර

තිබිය යුතුය.

(15) වෙළදාමේ ස්වභාවය අනුව ජලය පාවිච්චි කරන සෑම කඩ කාමරයකටම ජල සම්බන්ධතාවක් බැගින් ලබා දී තිබිය යුතුය. එකී එක් එක් ජල සම්බන්ධතාව වෙනුවෙන් වෙන වෙනම වූ ජල මනුවක් බැගින් සවිකර තිබිය යුතු අතර පොදු ජල කරාමවල සහ එළවළු සහ පළතුරු සේදීම සදහා වෙන් කල ස්ථානයේ ජල පරිභෝජනය මැනීම සදහා වෙනම ජල මනුවක් බැගින් සවි කර තිබිය යුතුය.

(16) පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සදහා සුදුසු වන බවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතු අතර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතුය. ස්ථානයේ පාවිච්චිය සදහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතුය.

(17) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවධාන සලස්වා තිබිය යුතුය.

(18) ස්ත්‍රී හා පුරුෂ පක්ෂයට වෙන වෙනම වෙන්වූ වැසිකිළි හා කැසිකිළි ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර එකී

සෑම වැසිකිළියකම බිම ද අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් දෙකක් උසට බිත්තිවලද පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(19) පොදු වෙළඳ පොළෙහි ඇති සෑම වැසිකිළියක් හා කැසිකිළියක් ම අවම වශයෙන් දිනකට තුන් වතාවක් බැගින් විෂබීජ නාශක යොදා සෝදා හැරීමෙන් පිරිසිදු කිරීමටත් ජලය ගලා යාමට ඉදිකර ඇති සෑම කාණුවක්ම අවම වශයෙන් දිනකට දෙවතාවක් බැගින් සෝදා පිරිසිදු කිරීමටත් සැළැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

(20) සියලුම කඩ කාමරවලට, වෙළඳ මැහි අසලට, වැසිකිළි හා කැසිකිළි තුලට හා කොරිඩෝර ඇතුළුව සියළුම පොදු කොටස් වලට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා දී තිබිය යුතු අතර සෑම විදුලි පරිපථයක්ම විදුලි කුසන්නායක ද්‍රව්‍යකින් තැනූ ආවරණයකින් ආවරණය කර තිබිය යුතුය.

(21) සෑම කඩකාමරයකටම විදුලි මනුවක් බැගින් සවිකර තිබිය යුතු අතර පොදු ස්ථාන ආලෝක කරණය සඳහා වැය වන විදුලි ඒකක ගණන මැනීම සඳහා වෙනම මනුවක් සවි කර තිබිය යුතුය.

(22) ඇතුලත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙළක් සකස් කර තිබිය යුතු අතර විදුලි බලය හේතුවෙන් ඇතිවන ගිනි, ඉන්ධන මගින් ඇතිවන ගිනි හා වෙනත් ආකාරයකින් ඇතිවන ගිනි මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය කරන වෙන් වෙන්වූ වර්ගයේ ගිනි නිවීමේ උපකරණ සවිකර තිබිය යුතුය.

(23) පොදු වෙළඳ පොළෙහි සවිකර ඇති ගිණි නිවීම් උපකරණ වල ක්‍රියාකාරීත්වය නිසි පරිදි පවතින්නේද යන්න අවම වශයෙන් එක් වතාවක් බැගින් පරීක්ෂා කරවා ගැනීමත් අක්‍රීය වූ ගිණි නිවීමේ උපකරණ වෙනුවට අළුත් උපකරණ සවි කිරීමට සැලැස්වීමත් සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

(24) පාරිභෝගිකයින් විසින් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් හි බර කිරා තහවුරු කර ගැනීමට සම්මත පොදු තරාදියක් ඒ සඳහා වෙන් වූ සහ පැහැදිලිව පෙනෙන ස්ථානයක තබා තිබිය යුතුය.

(25) පොදු වෙළඳපොලෙහි කඩ කාමරවල පිහිටීම සැලකිල්ලට ගනිමින් නගර සභාව විසින් මස්,මාළු,එළවළු,පළතුරු,සිල්ලර බඩු හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය විකිණීම සඳහා වෙළඳ පොළ කොටස් වලට බෙදා වෙන් කිරීම ද ඒ ආකාරයෙන්ම වෙළඳ මැහි කොටස් වලට වෙන් කිරීමද නගර සභාවේ කාර්යය විය යුතුය.

(26) පා පැදි හා යතුරු පැදි නතර කර තැබීමට ස්ථානයක් සකස් කර තිබිය යුතුය.

(27) වෙළඳ පොලට පැමිණෙන පාරිභෝගිකයන්ගේ වාහන සහ භාණ්ඩප්‍රවාහන වාහන නතර කර තැබීමට ප්‍රමාණවත් ඉඩකඩක් වෙන් කර තිබිය යුතුය.

(28) පරිශ්‍රය තුල ජනනය වන අපද්‍රව්‍ය –

I. ජෛවහායන අපද්‍රව්‍ය
II. වීදුරු
III. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය
IV. පොළිතින් හෝ ප්ලාස්ටික් හෝ පොළිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම්
V. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ සම්මිශ්‍රණ කොටස්
VI. අන්තරායකර අපද්‍රව්‍ය

වෙන වෙනම රැස්කල හැකි බක්කි හෝ භාජන හෝ ටැංකි හෝ එකී පොදු වෙළද පොලහි වෙනම ස්ථානයක තනා තිබිය යුතු අතර ජෛවහායන අපද්රව්ය බහාලීම සඳහා තනනු ලැබූ බක්කිය හෝ භාජනය හෝ ටැංකිය මීයන්ට,මැස්සන්ට,වෙනත් කෘමීන්ට හෝ කවර හෝ පක්ෂියෙකුට ඇතුල්වීමට නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි පියනක් සවිකර තිබිය යුතුය.

(29)පොදු වෙළඳපොළට පැමිණෙන තැනැත්තන් විසින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය බහාලීම සඳහා (28) උප වගන්තිය යටතේ වර්ග කර බැහැරලීම පහසු කරවන කුඩා ප්‍රමාණයේ භාජන පොදු වෙළඳපොළෙහි ඇති කිසියම් කඩකාමරයක බදු කරු හෝ කිසියම් වෙළද මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටිකට්පතක් ලබා ගෙන ඇති කිසියම් තැනැත්තකු හෝ විසින් වෙළදාමේ නියුක්ත කඩකාමරයේ හෝ වෙළද මැස්ස මත හෝ ඒ අදාල ස්ථානයේ ජනනය වන

සියලුම අපද්‍රව්‍ය බහාලිය හැකිවන පරිදි සුදුසු ස්ථානවල තැබීමට සැලැස්වීම සභාව වෙනුවෙන් සභාපතිවරයාගේ කාර්යය විය යුතු අතර එකී භාජන ප්‍රමාණවත් කාලාන්තරයෙන් (28) ඡේදයේ සඳහන් අපද්‍රව්‍ය වලට අදාල බක්කියට හෝ භාජනයට හෝ ටැංකියට දැමීමට සැලැස්වීම ද කළ යුතුය.

(30) 28වැනි උප වගන්තියේ නියම කර ඇති ආකාරයෙන් තනා ඇති සෑම බක්කියක,භාජනයක හෝ ටැංකියකම රැස් කරනු ලබන අපද්‍රව්‍ය අවම වශයෙන් දිනකට එක් වතාවක් හෝ අවශ්‍ය වන්නේනම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කිරීමට සැළැස්වීම සභාපතිවරයාගේ කාර්යය වියයුතුය. එසේම එකී අපද්‍රව්‍ය එකී ස්ථානයෙන් ඉවත් කිරීමේදී අපද්‍රව්‍ය පැටවූ කොටස සම්පූර්ණයෙන් ආවරණය කළ වාහනයකින් ප්‍රවාහනය කරනු ලැබීමට සැළැස්විය යුතුය.

(31) පොදු වෙළඳ පොළ තුල කඩ කාමර තුල හෝ වෙළඳ මැහිවල විකිණීම හෝ ප්‍රදර්ශනය සඳහා තිබෙන වෙළඳ ද්‍රව්‍ය මහජනතාවගේ සෞඛ්‍යට හානිකර හෝ අන්තරාදායක වේද යන්න බලය ලත් නිලධාරියා යොදවා සොයා බලා එසේ නොවන බවට සහතික වීම සභාපතිවරයාගේ කාර්ය භාරය වන්නේය.

(32) පොදු වෙළඳ පොලෙහි කඩ කාමර වල ඇතුලත බිත්ති හැර සෙසු බිත්ති, සෑම වෙළඳ මැස්සකම සිමෙන්තියෙන් කපරාරු කළ කොටස්, ගැල්වනයිස් කළ යකඩයෙන් නිම කර ඇති

ඉදිකිරීම් හා කඩකාමර වල ඇතුළත සීලිම හැර සීලිමේ සෙසු කොටස් අවම වශයෙන් වර්ෂයකට එක්වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැළැස්වීම සභාව වෙනුවෙන් සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

6. සභාව විසින් පවත්වාගෙන යනු ලබන පොදු වෙළඳ පොළ සම්බන්ධයෙන් බදු කරුවෙකු ,වෙළද මැස්සක් හෝ බිමක් පාවිච්චි කිරීමට ටිකට්පතක් ලබා ඇති තැනැත්තෙකු හෝ ඔහුගේ නියෝජිතයකු හෝ පොදු මහජනතාව විසින් පහත කොන්දේසි සහ නියම පිළිපැදිය යුතුය:-

(1) එකී පොදු වෙළඳපොලෙහි -

I. ඇතුලත අසංවරව හැසිරීම හෝ කළ කෝලාහල කිරීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ හිඟමන් ඉල්ලීම,

II. දෛනික කටයුතු අවසානයේ වෙළඳපොළ වසා දැමීමෙන් අනතුරුව එහි පරිශ්‍රය ඇතුලත රැඳී සිටීම,

III. කිසියම් ගොඩනැගිල්ලකට, ඉදිකිරීමකට හෝ සවිකිරීමකට හෝ අලංකරණය පිණිස වවා ඇති හෝ තබා ඇති කිසියම් මල් පඳුරකට හෝ නාම පුවරුවකට හෝ වෙනත් ද්‍රව්‍යකට හෝ හානිකිරීම කිරීම හෝ අලාභ කිරීම හෝ විකෘති කිරීම හෝ විරූපි කිරීම,

IV. ජල සම්බන්ධතාව ලබා දීම සඳහා ගොඩනැගිල්ල තුල එලා ඇති ප්‍රධාන ජල නලයෙන් හෝ වෙනත් කිසියම් ජල නලයකින් වංචනිකව ජල සම්බන්ධතාවක් ලබා ගැනීම,

V. සභාපතිවරයා විසින් විධිමත් අකාරයෙන් අවසරයක් දී ඇත්තේ නම් මිස තම කඩ කාමරයේ නාම පුවරුව නොවන වෙනත් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකිරීම, බැනර් ඇද තැබීම හෝ වෙනත් කවර හෝ ආකාරයක ප්‍රචාරක කාර්යයක් කිරීම,

VI. විදුලිය සම්බන්ධතාව ලබා දී ඇති ප්‍රධාන යතුරු පුවරුව අසලට ලඟා වීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම හෝ ප්‍රධාන යතුරු පුවරුවට හානි කිරීම,

VII. විදුලිය සම්බන්ධතාව ලබා දීම සඳහා ගොඩනගිල්ල තුල ඇද ඇති ප්‍රධාන විදුලි රැහැනෙන් හෝ වෙනත් කිසියම් විදුලි රැහැනකින් වංචනිකව විදුලිය සම්බන්ධතාවක් ලබා ගැනීම,

VIII. පාවිච්චිය සඳහා සපයා ඇති ජලය අපිරිසිදු කිරීම හෝ අපතේ යැවීම හෝ අපතේ යාමට

ඉඩ හැරීම හෝ වෙනත් කිසියම් ආකාරයකින් නාස්ති කිරීම හෝ එකී ජලයෙන් ස්නානය කිරීම හෝ රෙදි හෝ සතුන් සේදීම, එළවළු සහ පළතුරු සේදීමට වෙන්කළ ස්ථානයේ හැර වෙනත් යම් ස්ථානයක එළවළු හෝ පළතුරු සේදීම,

IX. ගොඩනැගිල්ලේ සවිකර ඇති ගිනි නිවීමේ උපකරණ අසළට ලඟා වීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම හෝ ප්‍රධාන යතුරු පුවරුවට හානි කිරීම,

X. තත් කාර්යය සඳහා වෙන් කළ ස්ථානයක හැර කවර හෝ වර්ගයක එළවළු, මස් හෝ මාළු විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම,

XI. වෙළඳ ස්ථාන තුලට පා පැදි හෝ යතුරු පැදි රැගෙන ඒම හෝ එසේ කිරීමට ඉඩදීම,

XII. කිසියම් වෙළඳ ස්ථානයකින් ඉවත් කරන අපද්‍රව්‍ය 5වන වගන්තියේ නියමයන්ට අනුකූලව නගර සභාව විසින් සපයා දී ඇති යම් භාජනයකට,බක්කියකට හෝ ටැංකියකට හැර පොදු වෙළඳ පොළ ඇතුළත වෙනත් කවර හෝ ස්ථානයක දැමීම,

XIII. පොදු වෙළඳ පොළෙහි තබා ඇති අපද්‍රව්‍ය රැස්කරන කවර හෝ භාජනයක, බක්කියක හෝ ටැංකියක බහාලීමට වෙන්කළ වර්ගයේ අපද්‍රව්‍ය හැර වෙනත් වර්ගයක අපද්‍රව්‍ය එකී භාජනයට, බක්කියට හෝ ටැංකියට දැමීම,

කවර හෝ තැනැත්තෙකු විසින් නොකල යුතුය.

(2) 5වන වගන්තියේ (28) වන ඡේදයේ නියමයන් යටතේ ජෛවහායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනා ඇති බක්කියේ හෝ භාජනයේ හෝ ටැංකියේ අපද්‍රව්‍ය බහාලන අවස්ථාවේ හෝ අපද්‍රව්‍ය ඉන් පිටතට ගන්නා අවස්ථාවේදී හැර වෙනත් සෑම අවස්ථාවකදී ම පියන හොඳින් වසා තැබීම කළ යුතුය.

(3) 5වන වගන්තියේ සඳහන් ආකාරයට පොදු වෙළෙඳ පොළෙහි කිසියම් කඩ කාමරයක් හෝ වෙළෙඳ මැස්සක් පාවිච්චි කරන හෝ පරිහරණය කරනු ලබන සෑම තැනැත්තෙකු ම දෛනික කටයුතු ආරම්භයේ සහ අවසානයේ දී ද අවශ්‍ය වන්නේ නම් ඒ අතර තුර අවස්ථා එකකදී හෝ ඊට වැඩි වාර ගණනකදී ද එකී කඩ කාමරය ඇතුළත සහ එහි ඉදිරිපස කොරිඩෝරය හා වේදිකා බැම්මද නැතහොත් වෙළෙඳ මැස්ස මත සහ ඒ අවට ද අතුගා පිරිසිදු කිරීම සහ එසේ අතු ගෑමෙන් පසු එකතු වන අප ද්‍රව්‍ය 5වන වගන්තියේ සඳහන් ආකාරයට නගර සභාව විසින් සපයා ඇති භාජකයකට, බක්කියකට හෝ ටැංකියකට දැමීම හෝ දැමීමට සැලැස්වීමට ද වගබලාගත යුතුය.

(4) පොදු වෙළඳපොළෙහි එළවළු,පළතුරු,මස්,මාළු හෝ වෙනත් ආහාර හෝ පාන වර්ග විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කරනු ලබන සෑම කඩ කාමරයක ම හා වෙළෙඳ මැස්සකම සහ සෑම හෝටලයක්,බත් කඩයක් ,ආපන ශාලාවක් ද ඇතුළුව සෑම තේ හෝ කෝපි කඩයකම දෛනික කටයුතු අවසානයේ, එකී වෙළඳ ස්ථානයේ විකිණීම සඳහා ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන සෑම මේසයක්ම, බංකුවක්ම, භාණ්ඩ තබන ලෑල්ලක් හෝ / සහ අල්මාරියක්ම අවස්ථාවෝචිත පරිදි සෝදා හෝ සූරා පිරිසිදු කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම එකී යම් ස්ථානයක වෙළඳ කාර්යයේ නියුක්ත වන තැනැත්තාගේ කාර්යය විය යුතුය.

(5) පොදු වෙළඳ පොළ ඇතුළත පිහිටි හෝටලයක්, බත්කඩයක්, ආපනශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් නොවන වෙනත් කවර හෝ ස්ථානයක ඉවුම් පිහුම් කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

(6) පොදු වෙළඳපොළෙහි කඩ කාමරවලින් බැහැරව ඉදිකරනු ලැබූ කිසියම් වෙළඳ මැස්සක දෛනික කටයුතු අවසානයේ කිසිදු භාජනයක අපද්‍රව්‍ය රඳවා තැබීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකල යුතු ය.

(7) ගෝඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝඝාතකාගාරයකදී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස පොදු වෙළඳපොළෙහි මස් වෙළෙඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම

කවර හෝ තැනැත්තෙකු විසින් නොකල යුතු ය.

(8) කවර හෝ ගෝ ඝාතකාගාරයක් තුළ කිසියම් දිනයක දී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝඝාතක ආඥාපනතේ 17 වන වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, පොදු වෙළඳපොළ ඇතුලත පවත්වාගෙන යනු ලබන කවර හෝ මස් කඩයක වෙළඳාම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළදාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකල යුතුය.

(9) කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළ පරිශ්‍රය ඇතුලට සුනඛයෙකු හෝ බළලෙකු හෝ වෙනත් කවර හෝ සතෙකු හෝ පක්ෂියකු රැගෙන ඒම හෝ රැගෙන ඒමට ඉඩදීම හෝ නොකල යුතු ය. මේ නියමය කිසියම් පරීක්ෂණ කාර්යයක් සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් පොලිස් නිල සුනඛයෙකු පොදු වෙළඳපොළ ඇතුළට රැගෙන එනු ලැබීම වලක්වන නියමයක් ලෙස තේරුම් නොගත යුතුය.

(10) පොදු වෙළඳපොළෙහි වෙළෙඳාම් අවසන් කර පොදු වෙළඳපොළ සම්පූර්ණයෙන් ම වසා තබන අවස්ථාවක සහ පොදු වෙළඳපොළෙහි කිසියම් කඩ කාරමයක් වසා දමා බැහැරට යන අවස්ථාවක එකී කඩ කාමරයේ සියළුම විදුලි පහන්, විදුලි පංකා සහ වෙනත් විදුලි උපකරණ අක්‍රිය කර දැමිය යුතු අතර දල්වා තිබෙන කිසියම් ගිනි හා පොල් තෙල් පහන් නිවා දැමීමට සැලැස්වීම බදුකරුගේ කාර්යය වන්නේය. එසේ වුව ද ආහාර හෝ පාන වර්ග කල් තබා

ගැනීමට පාවිච්චි කරන ශීතකරණ හෝ අධිශිතකරණ මේ යටතට ඇතුලත් නොවිය යුතු ය. එසේම තව දුරටත් පොදු වෙළෙඳ පොළෙහි ආරක්ෂාවට තර්ජනයක් විය හැකි කවර හෝ ආකාරයේ ගිනි දැල්ලක් දැල්වීම හෝ දැල්වීමට සැලැස්වීම හෝ පොදු වෙළඳපොළ පරිශ්‍රය ඇතුළත කවර හෝ ස්ථානයක රතිඤ්ඤා දැල්වීම හෝ දැල්වීමට සැලැස්වීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකල යුතුය.

(11) පොදු වෙළඳපොළෙන් බැහැර ස්ථානයක තිබෙන කවර හෝ අපද්‍රව්‍යයක් එකී පොදු වෙළඳපොළෙහි ජනනය වන අපද්‍රව්‍ය බහාලීමට තනා ඇති කිසියම් බක්කියකට, භාජනයකට හෝ ටැංකියකට දැමීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකල යුතුය.

(12) කඩ කාමර වල ඇතුළත බිත්ති හැර සෙසු බිත්ති, කඩ කාමරවල ඇතුළත ගැල්වනයිස් කල යකඩයෙන් නිම කර ඇති ඉදිකිරීම් සහ කඩකාමර වල ඇතුලත සීලිම අවම වශයෙන් වර්ෂයකට එක්වරක් බැගින් තීන්ත ආලේප කිරීම එකී කඩකාමරයේ බදුකරුගේ කාර්යය විය යුතුය.

(13) පොදු වෙළඳ පොළෙහි කිසියම් වෙළඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට 4 වන වගන්තිය යටතේ ටිකට් පතක් ලබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් එකී ටිකට් පත අන්සතු කිරීම හෝ එකී ටිකට්පත නිකුත් කරනු ලැබ ඇත්තේ කිනම් වෙළඳ මැස්සක් සඳහා ද එකී වෙළෙඳ මැස්ස නොවන වෙනත් කිසියම් ස්ථානයක වෙළඳාම් කිරීම හෝ නොකල යුතු අතර කවර හෝ

තැනැත්තෙකු එසේ ක්‍රියාකර තිබෙන බවට සභාපතිවරයා හෝ බලය ලත් නිලධාරියා සෑහීමට පත්වී ඇති අවස්ථාවක ඔහු නියමිත ස්ථානයේ වෙළඳාම් සඳහා යොමු කිරීමට නැතහොත් එකී දිනයේ වෙළඳාම් කටයුතු වලින් වලක්වා පොදු වෙළඳපොළෙන් ඉවත් කිරීම හෝ ඔහු වෙත නිකුත් කරනු ලැබූ ටිකට් පත අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලය ලත් නිලධාරියාට බලය ඇත.

(14) කිසියම් පොදු වෙළෙඳ පොළක කඩකාමරයක් බද්දට ගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් හෝ කිසියම් වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණ කිරීමට ටිකට් පතක් ලබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් තමාගේ වෙළඳ කාර්යය සඳහා වෙන් කරගත් එකී කඩකාමරයේ හෝ වෙළෙඳ මැස්සේ ඉඩ කඩ හෝ ඉන් කිසියම් කොටසක් හෝ කවර හෝ භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමට හෝ වෙළෙඳාම් කිරීම සඳහා ප්‍රදර්ශණය කිරීමට හෝ වෙනත් කවර හෝ කාර්යයකට වෙනත් යම් තැනැත්තෙකුට ඉඩ දීම නොකොල යුතු ය.

(15) නගර සභාව විසින් කලින් තීරණය කර තත්කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළෙහි කිසියම් කඩ කාමරයක නිර්මිත සැලැස්ම වෙනස්කරන හෝ එකී සැලැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවි කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ කොටු කිරීමක් නොකල යුතුය.

(16) නගර සභාව විසින් කලින් තීරණය කර තත්කාර්ය සඳහා

බලය දී ඇත්තේනම් මිස කවරහෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළෙහි කිසියම් වෙළඳ මැස්සක නිර්මිත සැලැස්ම වෙනස් කරන හෝ එකී සැළැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවිකිරීමක් හෝ වෙනස් කිරීමක් කිරීම සහ පොදු වෙළඳ පෙළ ඇතුලත කවර හෝ ස්ථානයක වෙළඳ මැස්සක් ඉදිකිරීම හෝ කොටු කිරීමක් නොකල යුතුය.

(17) විකිණීම සඳහා පොදු වෙළඳ පොළ වෙත රැගෙන එනු ලබන කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් හෝ වෙළඳාම සඳහා යොදා ගන්නා කිසියම් උපකරණයක් හෝ වෙනත් යම් කවර හෝ දෙයක් එකී ද්‍රව්‍යය හෝ භාණ්ඩ වෙළඳ පොළ තුලට රැගෙන එනු ලබන අවස්ථාවක දී හෝ ඉන් බැහැරට ගෙන යනු ලබන අවස්ථාවක දී හැර වෙනත් කවර හෝ අවස්ථාවක දී කිසියම් කොරිඩෝරයක හෝ වේදිකා බැම්මක හෝ රඳවා තැබීම හෝ එසේ කිරීමට ඉඩ දීම හෝ නොකල යුතුය.

(18) පොදු වෙළඳ පොළ ඇතුළත කවර හෝ කොරිඩෝරයක මත හෝ වේදිකා බැම්මක් මත හෝ කවර හෝ ආකාරයක වෙළඳාමක් නොකල යුතු අතර එකී කොරිඩෝරය හෝ වේදිකා බැමි මතින් ගමන් ගන්නා තැනැත්තන්ට බාධාවන කවර හෝ ක්‍රියාවක් නොකල යුතුය.

(19) නගර සභාව විසින් තහනම් කරන ලද්දා වූ හෝ අපතය වූ හෝ වෙනයම් මොනම විදියකින් හෝ මහජන සෞඛ්‍යට අන්තරාදායක වූ හෝ අහිතකරවූ කිසිම ද්‍රව්‍යයක් තමාගේ

කඩ කාමරයේ හෝ වෙළඳ මැස්සේ හෝ වෙළඳාමට තැබීම හෝ ප්‍රදර්ශනයට තැබීම කිසිදු පුද්ගලයකු විසින් නොකල යුතුය.

(20) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස පොදු වෙළඳ පොළෙහි කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තකුගේ සහායකයෙකු වශයෙන් හෝ සේවයේ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩ දීම හෝ නොකල යුතුය.

(21) හොදින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළෙහි කවර හෝ ආකාරයක වෙළඳාමක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකල යුතු ය.

7. කවර හෝ පොදු වෙළඳපොළක වෙළඳාම සඳහා වෙන්කල ඉඩ ප්‍රමාණය යන්නෙන් ,-

(1) කඩ කාමරයක් වන විට, එකී කඩ කාමරයේ පිටුපස බිත්තියේ සිට 5වන වගන්තියේ (4) වන උප වගන්තියේ සඳහන් දොර සවිකර ඇති සීමාව දක්වා වන කොටස ද,

(2) වෙළඳ මැස්සක් වන විට, එකී වෙළඳ මැස්සේ මතුපිට වර්ග ප්‍රමාණය සහ වෙළඳාමේ යෙදෙන තැනැත්තාට රැඳී සිටීමට ඉඩ දී තිබෙන එකී වෙළඳ මැස්ස පිටුපස භූමි ප්‍රමාණය ද, අදහස් විය යුතුය.

8. පොදු වෙළඳ පොළහි ගොඩනැඟිල්ලේ කඩ කාමර බද්දට දීමේ දී;

(1) මස් කඩයක් නොවන කිසියම් කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට බදු කරුවෙකු තෝරා එකී කඩ කාමරය තෝරාගනු ලැබූ බදු කරුට බද්දට දීමේ කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් සිදු කිරීම නගර සභාවේ කාර්යය විය යුතුය.

(2) මෙහි (1) උප වගන්තිය යටතේ කිසියම් කඩ කාමරයක් බද්දට දීම සඳහා ටෙන්ඩර් කැඳවීමේදී එකී කඩ කාමරය සඳහා ගෙවිය යුතු මාසික බදු කුලිය තීරණය කිරීම, ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව විය යුතුය.

(3) මෙහි (1) උප වගන්තිය යටතේ බදු කරුවෙකු තෝරා ගැනීමට ටෙන්ඩර් කැඳවිය යුතු අවස්ථා වශයෙන් -

I. බදුකරු විසින් ස්වකීය කැමැත්තෙන් ම බදු ගිවිසුම් අවලංගු කරවා ගනු ලැබ ඇති අවස්ථාවක් හෝ

II. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන් කඩ කිරීම හෝ බදු ගිවිසුමේ කොන්දේසි කඩ

කිරීම හේතුවෙන් බදු ගිවිසුම් අවලංගු කර ඇති හෝ අවලංගු වී ඇතැයි සැලකෙන අවස්ථාවක් හෝ

III. කිසියම් බදු කරුවෙකුගේ කලත්‍රයා හෝ දරුවෙකු නොමැතිව සිටියදී බදුකරු මියගිය අවස්ථාවක් හෝ

සැලකිය යුතු අතර 12 වන වගන්තිය පරිදි කිසියම් බදුකරුවෙකු විසින් යම් ඉදිරි වර්ෂයක් සඳහා එකී බදු ගිවිසුම වලංගු කරවා ගනු ලැබීම ප්‍රතික්ෂේප කර ඇත්තේ නම් හෝ එකී වලංගු කරවා ගැනීම උවමනාවෙන්ම මඟහැර සිටින්නේ නම් මිස නගර සභාව සහ එකී බදුකරු එකඟ වී අත්සන් කරනු ලැබූ බදු ගිවිසුම අවලංගු වී ඇති සේ නොසැලකිය යුතුය.

9. 8වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මඟින් කිසියම් කඩ කාමරයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා තෝරා ගනු ලැබූ බදුකරු නගර සභාව සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

10. 8 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුනේ වුව ද මෙම අතුරු ව්‍යවස්ථාව බලාත්මක වන දිනය වන විට නගර සභාව සතුව තිබෙන කිසියම් පොදු වෙළඳ පොළක එක් එක් කඩකාමරය සම්බන්ධයෙන් නගර සභාව සමඟ අවසන් වරට අත්සන් කරන ලද බදු ගිවිසුමේ සඳහන්, බදුකරු එකී බලාත්මක දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 8 වන වගන්තිය යටතේ එකී කඩ කාමරය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තෝරා ගනු ලැබූ බදුකරු වශයෙන් සැලකීම නීත්‍යානුකූල වන්නේය. එසේම තවදුටත් මේ වගන්තිය අදාල වන කවර හෝ බදුකරුවෙකු මෙම අතුරු ව්‍යවස්ථාව බලාත්මක වන දිනයේ සිට

මාස තුනක කාලයක් ඇතුලත 9 වන වගන්තිය අනුව නව බදු ගිවිසුමකට ඇතුලත් විය යුතුය.

11. කිසියම් බදු ගිවිසුමක් ;

(1) 9 වන හා 10 වන වගන්ති යටතේ නගර සභාව සමඟ අත්සන් කරනු ලැබූ යම් ගිවිසුමක් වූ විට එක් වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර එකී වර්ෂයක කාලය අවසන් වීමට මාසයකට පෙර ඉදිරි වර්ෂය සඳහා නගර සභාව සමඟ අලුත් ගිවිසුමකට එළඹීමෙන් පසුව තවත් එක් වර්ෂයක කාලයක් සඳහා එකී කඩකාමරයේ බදු කාලය වලංගු කරවාගනු ලැබිය හැකිය. ඒ ආකාරයෙවන්ම යම් අනුගාමී වර්ෂයක් සඳහා එකී කඩකාමරයේ බදු කාලය වාර්ෂිකව වලංගු කරවාගෙන එකී කඩකාමරය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට එකී බදු කරුට හිමිකම තිබියුතුය.

(2) 1 වන උපවගන්තිය යටතේ කිසියම් බදු කරුවෙකු විසින් අනුගාමී වර්ෂය සඳහා අත්සන් කර බදු කාලය වලංගු කරවා ගන්නා ලද බදු ගිවිසුමක් වූ විට එම ගිවිසුම යටතේ එකී කඩකාමරය පාවිච්චි කරන හෝ පරිහරණය කරන අවස්ථාවක එකී අනුගාමී වර්ෂය තුළ ගෙවිය යුතු මාසික බදු කුලිය ප්‍රධාන තක්සේරුගේ කතක්සේරුව අනුව තීරණය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

12. කිසියම් කඩකාමරයක බදු කාලය අවසන් වන දින සිට එක් මාසයක කාලයක් ගතවීමට මත්තෙන් 11 වන වගන්තිය යටතේ ඉදිරි වර්ෂය සඳහා බදු කාලය

වලංගු කරවාගෙන ඇත්තේ නම් මිස කවර හෝ බදු කරුවෙකුට,පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට දී ඇති එකී කඩ කාමරය එකී මාසය අවසන් වන දිනෙන් පසුව පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට හිමි කමක් නොතිබිය යුතුය.

13. පොදු වෙළඳ පොළෙහි කිසියම් කඩ කාමරයක් අතුරු බදු ගැනීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකල යුතුය. කිසියම් තැනැත්තෙකු විසින් කිසියම් කඩකාමරයක් අතුරු බදු ගනු ලැබීම හේතුවෙන් එකී කඩ කාමරයේ බදුකරු සමඟ නගර සභාව එළැඹ ඇති ගිවිසුම් අවලංගු කිරීම හේතුවෙන් හා එකී කඩ කාමරය ආපසු නගර සභාවට පවරා ගැනීම හේතුවෙන් එකී අතුරු බදුකරුට සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ පාඩුවක් එකී අතුරු බදුකරු වෙතම පැවරෙන අතර නගර සභාව හෝ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලය ලත් නිලධාරියා හෝ ඒ පිළිබඳව වගකීමට යටත් නොවනු ඇත.

14. නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳ පොළක වන යම් කඩ කාමරයක් එය බදු කරු විසින් අතුරු බදු දීම හෝ කුලියට දීම හෝ නොකළ යුතු අතර යම් බදු කරුවෙකු විසින් එකී කඩ කාමරය අතුරු බදු දීමකට හෝ කුලියට දීමකට ලක්කර ඇති බවට හෝ මෙම අතුරු ව්‍යවස්ථා වේ නියමයන් හෝ එකී කාමරය බදු දීමට අදාල බදු ගිවිසුමේ සඳහන් නියමයන් හෝ කඩකර ඇති බවට සෑහීමට පත්වන තරම් ප්‍රමාණවත් කරුණු ඇතැයි සභාපතිවරයාගේ මතය වන විට අදාල බදු කරුට ඒ පිළිබඳව ලිඛිතව කරුණු දක්වමින් එකී අතුරු බදු දීම හෝ කුලියට දීම අවසන් කරන ලෙස දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

15. මෙහි 14 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තකු විසින් එකී දැන්වීමේ සඳහන් කරුණුවලට එරෙහිව යම්

විරෝධතාවක් හෝ විරෝධතා ඉදිරිපත් කිරීමට තමා වෙත කරුණු ඇත්නම් එකී දැන්වීමේ දින සිට දින 14 ක කාලයක් ඇතුලත, එකී විරෝධතාව හෝ විරෝධතා පිළිබඳව තමාට ඉදිරිපත් කිරීමට ඇති කරුණු ලිඛිතව සඳහන් කරමින් සභාපතිවරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේම එකී බදුකරු විසින් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබූ විරෝධතාව හෝ විරෝධතා ඇතුලත් කරුණු සඳහන් දැන්වීම සභාපතිවරයාට ලැබුණු දින සිට දින 14 ක කාලයක් ඇතුලත එකී වරෝධතාව හෝ විරෝධතා පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

16. මෙහි 15 වන වගන්තිය අනුව සභාපතිවරයා විසින් පවත්වනු ලැබූ විරෝධතා පරීක්ෂයකදී 14 වන වගන්තිය පරිදි සභාපතිවරයා විසින් යවනු ලැබූ ලිපියේ සඳහන් කරුණු නිවැරදි බවට තහවුරු වී ඇති අවස්ථාවක හෝ එකී විරෝධතා පරීක්ෂණ දිනය වනතෙක් ම එකී අතුරු බදු දීම හෝ කුලියට දීම නිවැරදි කිරීමට බදුකරු අපොහොසත්ව ඇති අවස්ථාවක නගර සභාව සමග එකී බදුකරු අත්සන් කරනු ලැබ ඇති බදුගිවිසුම අවලංගු වී ඇති ලෙස සැලකිය යුතුය. එසේම එකී විරෝධතා පරීක්ෂණය පැවැත්වූ දිනයේ සිට දින 7ක් ඇතුලත එකී කඩ කාමරය නගර සභාව වෙත පවරා ගැනීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය. එසේම තවදුරටත් ආපසු පවරා ගනු ලැබූ කිසියම් කඩ කාමරයක් නැවත බදුදීම සඳහා සභාපතිවරයා විසින් 8 වන වගන්තියේ නියමයන් අනුගමනය කළ යුතුය.

17. මෙහි 13 වන වගන්තිය සිට 16 වන වගන්තිය දක්වා වන වගන්ති වල කුමක් සඳහන්ව තිබුනද නගර සභාව සතු කිසියම් කඩ කාමරයක බදුකරුවෙකුගේ ඉල්ලීමක් මත හෝ බදුකරුවෙකු මිය ගිය අවස්ථාවක හෝ එකී බදුකරුගේ කලත්‍රයා හෝ දරුවෙකුට එකී කඩ කාමරයේ බදු අයිතිය පවරාදීමට එකී වගන්තිවල නියමයන් බාධාවක් නොවිය යුතුය.

18. (1) නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කවර හෝ පොදු වෙළඳපොළක කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තෝරා ගනු ලැබූ සෑම බදුකරුවෙකු විසින්ම ;

I. බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති වටිනාකමකින් යුතු හා ආපසු ගෙවනු ලැබිය හැකි ඇප තැන්පත් මුදලක්; සහ

II. මෙහි 9වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමේ සඳහන් මාසික බදු කුලිය මෙන් තුන් ගුණයකට සමාන තැන්පත් මුදලක්;

නගර සභාවේ තැන්පත් කළ යුතුය.

(2) මෙහි (1) උපවගන්තියේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්කුට නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳපොළක කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ඉඩ දීම නොකළ යුතුය.

(3) මෙහි 10 වන වගන්තියට අදාල වන කිසියම් බදු කරුවෙකු එකී වගන්තියේ සඳහන් ආකාරයෙන් නගර සභාව සමඟ ගිවිසුම් අත්සන් කළ දිනයේ සිට මාස හයක කාලයක් ගත වීමට මත්තෙන් (1) උප වගන්තියේ නියමයන් සම්පූරණ කර ඇත්තේ නම් මිස එකී මාස හයක කාලය ඉකුත් වීමෙන් අනතුරුව එකී කඩ කාමරය පාවිච්චි කිරීම හෝ පරිහරණය

කිරීම නීත්‍යානුකූල නොවන්නේය.

19. කිසියම් බදු කරුවකු විසින් ;

(1) පොදු වෙළඳපොළෙහි කිසියම් කඩ කාමරයක් සඳහා නගර සභාවට ගෙවනු ලැබිය යුතු එක් එක් මාසයේ බදු කුළිය ගෙවිය යුතු දිනය එකී කඩ කාමරය බදු දිමට අදාළ ගිවිසුමෙහි නිශ්චිතව සඳහන් කර තිබිය යුතුය. එකී දින හෝ එදිනට පෙර එකී බදු මුදල නගර සභාවට ගෙවීම ඔහුගේ කාර්යය විය යුතුය.

(2) මෙහි (1) උප වගන්තියේ නියම කර ඇති ආකාරයෙන් අත්සන් කළ ගිවිසුමට අනුව එකඟ වූ දිනයේ හෝ ඊට පෙර අදාල මාසික බදු කුළිය නගර සභාවට ගෙවීමට අපොහොසත්වන අවස්ථාවක අදාල මාසික කුලියෙන් සියයට දහයක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට ඔහු යටත් විය යුතුය. ඒ බවට වූ නියමය අදාල ගිවිසුමෙහි ඇතුළත් කර තිබිය යුතුය.

(3) නගර සභාවට ගෙවිය යුතු වන මාසික බදු කුළිය නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ බදු කුළිය මාස තුනක කාලයකට වඩා වැඩි වන යම් අවස්ථාවක, මෙහි (4) උප වගන්තියේ සඳහන් ප්‍රතිවිපාකයන්ද සඳහන් කරමින් එකී හිඟ මුදල සහ (2) උප වගන්තිය සඳහන් ප්‍රමාද ගාස්තුව ගෙවන ලෙස බදුකරුවෙකුට ලියවිල්ලකින් වන දැන්වීමක් භාර දීම නගර සභාවේ ලේකම් වරයාගේ කාර්යය විය යුතුය.

එසේම මේ දැන්වීමට අනුව හිඟ බදු මුදල හා ප්‍රමාද ගාස්තු ගෙවීම තවදුරටත් පැහැර හරින්නේ නම් කඩ කාමරය මුද්‍රා තැබීමෙන් පසුව එහි තුළ ඇති බදුකරුට අයත් කවර හෝ දේපළක් විකිණීම සදහා ක්‍රියා කරනු ලබන බවත් එසේ ක්‍රියා කරනු ලබන ඉදිරි දිනය කෙදිනකද යන්නත් එකී දැන්වීමේ සඳහන් කර තිබිය යුතුය.

(4) මෙහි (3) වන උප වගන්තිය යටතේ වන දැන්විමක් ලැබූ අවස්ථාවක තමාට ඒ දැන්වීම ලැබුණ දින සිට දින 7ක් ඇතුළත එකී හිඟ බදු මුදල සහ ප්‍රමාද ගාස්තුව නගර සභාවට ගෙවීමට අපොහොසත් වන්නේ නම් අදාල කඩ කාමරය මුද්‍රා තැබීම ලේකම්ගේ කාර්යය විය යුතුය.

20. 19 වන වගන්තියේ (4) වන උප වගන්තියේ නියමයන් යටතේ ක්‍රියාකර එක් දිනක් ඉකුත් වීමෙන් පසුව හා දින 7ක් නිකුත්වීමට මත්තෙන් අදාල බදුකරු හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය පවරන ලද වෙනත් කිසියම් අනුයෝජිතයෙකු එකී ස්ථානයට පැමිණ සිටී නම් ඔහු ඉදිරියේ දී බදු කරු හෝ ඔහුගේ අනුයෝජිතයා පැමිණ නැත්නම් නගර සභාවේ වෙනත් යම් නිලධරයන් දෙදෙනෙකු ඉදිරි පිටදී එකී කඩ කාමරයේ දොරට හෝ දොරවල් වලට තබනු ලැබූ මුද්‍රා කඩා දොරවල් විවෘත කර එකී කඩ කාමරය ඇතුළත වූ බදුකරුට අයත් යම් දේපළක් ප්‍රසිද්ධියේ විකුණා එකී හිඟ බදු මුදල, ප්‍රමාද ගාස්තුව සහ කඩ කාමරය මුද්‍රා තැබීමට හා බදු කරුට අයත් යම් දේපළක් විකිනීමට වැයවූ කිසියම් මුදලක් අය කර ගෙන නගර සභාවේ අරමුදලට බැර කිරීමට ලේකම්වරයාට බලය තිබිය යුතුවාත් හැර එසේ කිරීම නීත්‍යානුකූල වන්නේය.

21. මෙහි 19 (4) උප වගන්තිය සහ 20 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණද,

එකී වගන්තිවල සඳහන් ආකාරයෙන් ක්‍රියා කිරීමට සූදානම්වන කිසියම් අවස්ථාවකදී හෝ ඒ අවස්ථා දෙක අතරට යෙදෙන කවර හෝ අවස්ථාවකදී එකී හිඟ බදු මුදල, ප්‍රමාද ගාස්තුව හා එසේ ක්‍රියා කිරීමට යාම නිසා ඒ වන විට නගර සභාවට දරන්නට සිදු වූ යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදලද නගර සභාවට ගෙවා දැමීමෙන් 19 (4) උප වගන්තිය හෝ 20 වගන්තියේ සඳහන් යම් ආකාරයකින් ක්‍රියා කිරීම නතර කර ගැනීමට බදුකරුට හිමිකම තිබිය යුතුවාත් හැර එකී මුදල් සම්පූර්ණයෙන් අය කර ගැනීමෙන් පසුව එසේ ක්‍රියා කිරිමෙන් වැළකී සිටීම ලේකම්වරයාගේ කාර්යය විය යුතුය.

22. මෙහි 19 (3) උප වගන්තිය සහ 20, 21 වගන්ති යටතේ හෝ ඉන් කීපයක් යටතේ හෝ ඒ වගන්ති සියල්ලම යටතේ හෝ ක්‍රියා කිරීම හේතුවෙන් එකී කඩ කාමරය බදු දීමට අදාලව අත්සන්කළ ගිවිසුම අවලංගු වීම සිදු වී ඇති ලෙස තේරුම් නොගත යුතුය.

23. මෙහි 21 උප වගන්තියේ කුමක් සඳහන්ව තිබුනද, කිසියම් බදුකරුවෙකු විසින් යම් කඩකාමරයක බදු මුදල් ගෙවීම පැහැර හරිනු ලැබීම හේතුවෙන් එක් වර්ෂයක් තුලදී 19 (4) උප වගන්තියේ නියම කළ ආකාරයෙන් එකී කඩ කාමරය මුද්‍රා තැබීම් අවස්ථා දෙකකට පසුව තවදුරටත් බදු මුදල් ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම් , ලේකම්වරයා විසින් ඒ පිළිබඳව එකී බදුකරුට ලියවිල්ලකින් දන්වා යැවීම කළ යුතුවාත් හැර එකී දැන්වීම බදු කරුට ලැබුණ දිනයේ සිට නගර සභාව සමඟ එකී බදු කරු විසින් අත්සන් කරනු ලැබූ ගිවිසුම අවලංගු විය යුතුය.

24. පොදු වෙළඳපොළ ඇතුලත සෑම කඩ කාමරයක් වෙනුවෙන්ම ලබා ගෙන ඇති ජල සම්බන්ධතාව සහ විදුලිය සම්බන්ධතාව මගින් කිසියම් බදු කරුවෙකු විසින් පරිභෝජනය කරනු ලබන ජල ඒකක ප්‍රමාණය සහ විදුලි ඒකක ප්‍රමාණය වෙනුවෙන් මාසිකව ගෙවිය යුතු බිල්පත්වල වියදම එකී බදු කරු

විසින් දැරිය යුතුය.

25. පොදු වෙළඳ පොළ පරිශ්‍රයෙහි පොදු පරිභෝජනය සඳහා යොදවා ඇති කිසියම් විදුලි පරිපථයකින් හෝ පොදු ජල කරාමයකින් කවර හෝ කඩ කාමරයකට විදුලිය සැපයුමක් හෝ ජල සැපයුමක් ලබා ගැනීම හෝ එසේ ලබාගැනීමට ඉඩදීම හෝ නොකල යුතුය.

26. පොදු වෙළඳපොළෙහි වෙළඳ මැහි හෝ බිම පාවිච්චි කිරීම සඳහා ටිකට් පත් නිකුත් කිරීම සහ ගාස්තු එකතු කිරීමේ දී ;

(1) මෙහි 4 වන වගන්තිය යටතේ පොදු වෙළඳ පොළෙහි ගොඩනැගිල්ලේ කඩ කාමර වලින් යුතු කොටසෙන් බැහැරව තනා ඇති වෙළඳ මැහි සඳහා නගර සභාවට ගෙවිය යුතු ගාස්තුව මෙහි දෙවන උප ලේඛනයේ සඳහන් වගුවේ ආකාරයට නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට නියම කළ හැකිය.ඒ ආකාරයට ම එකී ගාස්තු ප්‍රමාණයන් නගර සභාව විසින් කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම ද කරනු ලැබිය හැකිය.

(2) පොදු වෙළඳ පොළෙහි කඩ කාමර හැර වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවශ්‍ය කරන යම් තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීමට හා එකී ටිකට් පත් සඳහා මුදල් අය කිරීමටත් ලේකම්වරයාගෙන් බලයලත් යම් නිලධාරියෙකු යොදවනු ලැබිය හැකිය.

I. එසේම යම් බලයලත් නිලධාරියෙකු විසින් එකී ටිකට් පත් නිකුත් කිරීමෙන් දිනපතා එකතු

කරනු ලබන මුදල් එදින පස්වරු 3.00 ට පෙර නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීමට සැලැස්වීම එකී බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතුය.

II. කිසියම් දිනයක එකී බලයලත් නිලධාරියා විසින් එකතු කරනු ලැබූ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීමෙන් පසුව, පොදු වෙළඳ පොලෙහි ටිකට් පත් නිකුත් කිරීමෙන් එකතු කරනු ලැබූ යම් මුදලක් වේ නම් එය අනුගාමී වැඩ කරන දිනයේ නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීම කළ යුතු ය.

(3) පොදු වෙළඳ පොළෙහි කඩ කාමර හැර වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට යම් තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීම සහ ඒ සඳහා මුදල් එකතු කිරීමට මෙහි 2වන උප වගන්තියේ නියම කර ඇති ආකාරයෙන් ලේකම්වරයාගෙන් බලයලත් යම් නිලධාරියෙකු යෙදවීමට නොහැකි වන්නේ නම් එකී කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගනු ලබන (මෙහි මින්මතු "ගාස්තු එකතු කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැන්තෙකුට පැවරීමට නගර සභාවට බලය තිබිය යුතු ය.

(4) මෙහි 3වන උප වගන්තිය යටතේ තෝරා ගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නෙකුට එකී කාර්යය පැවරීම එක් වර්ෂයක් සඳහා වලංගු විය යුතු අතර අනුගාමී වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් මගින් ගාස්තු එකතු කරන්නෙකු තෝරා ගත යුතු ය. එසේ වුව ද කලින් වර්ෂය සඳහා තෝරා

ගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නෙකුට අනුගාමී වර්ෂය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කිරීමටත් සහ එකී ටෙන්ඩර් අයදුම්පත්‍රය පිළිගැනීමට සභාව තීරණය කරන්නේ නම් ඔහු අනුගාමී වර්ෂය සඳහා ගාස්තු එකතු කරන්නා වශයෙන් තෝරා ගැනීමටත් මෙම උප වගන්තියේ නියමයන් මගින් වළක්වා ඇති ලෙස තේරුම් නොගත යුතුය.

(5) මෙහි 3 වන උප වගන්තියේ නියමයන් යටතේ ගාස්තු එකතු කරන්නෙකු තෝරා ගනු ලැබූ විට ඔහු විසින්-

I. එකී තෝරාගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති වටිනාකමකින් යුතු හා ආපසු ගෙවනු ලැබිය හැකි ඇප තැන්පත් මුදලක් නගර සභාවේ තැන්පත් කිරීමට;

II. එකී ටිකට් පත් නිකුත් කිරීම හා ගාස්තු එකතු කිරීම පිළිබඳව නගර සභාව සමග ගිවිසුමකට එළඹීමට;

III. මෙහි II වන ඡේදයේ නියමය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමෙන් එකඟ වී ඇති වාර්ෂික ගාස්තුවෙන් තුනෙන් එකකට සමාන හෝ ඊට වැඩි තැන්පත් මුදලක් නගර සභාවේ තැන්පත් කිරීමට;

ක්‍රියා කළ යුතු ය.

IV. මෙහි ඉහත ඡේද වල සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකුට නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳ පොළක වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට, හෝ පරිහරණය කිරීමට තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීමට හා ඒ ටිකට් පත් වෙනුවෙන් මුදල් එකතු කිරීමට ඉඩ දීම නොකල යුතු ය.

(6) මෙහි (1) වන උප වගන්තිය යටතේ කිසියම් පොදු වෙළඳ පොළක වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති ගාස්තුව ඉක්ම වූ ප්‍රමාණයක ගාස්තුවක් හෝ ගාස්තු අයකිරීම කවර හෝ ගාස්තු එකතු කරන්නෙකු විසින් නොකල යුතුය.

(7) මෙහි (5) වන උප වගන්තියේ නියමයට අනුව කිසියම් ගාස්තු එකතු කරන්නෙක් සමග නගර සභාව අත්සන් කරනු ලබන ගිවිසුමෙහි -

I. වෙළෙඳ මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා ටිකට් පත් නිකුත් කල යුතු ආකාරය;

II. එකී ටිකට් පත් සඳහා මුදල් අයකරන ආකාරය සහ අය කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය;

III. ගාස්තු එකතු කරන්නා විසින්, ගිවිසගන්නා

වර්ෂය වෙනුවෙන් නගර සභාවට ගෙවිය යුතු සම්පූර්ණ මුදල;

IV. එකී වාර්ෂික මුදල සමාන වාරික දොළහකින් නගර සභාවට ගෙවිය යුතු බව සහ එකී වාරිකයක වටිනාකම;

V. එක් එක් මාසය වෙනුවෙන් ගෙවිය යුතු මුදල නගර සභාවට ගෙවිය යුතු දිනය;

VI. නියමිත දිනයේ දී මාසික මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එකී මුදලේ ප්‍රමාණයෙන් සියයට දහයක ප්‍රමාණයකට සමාන මුදලක් ප්‍රමාද ගාස්තුවක් වශයෙන් නගර සභාවට ගෙවීමට ගාස්තු එකතු කරන්නා යටත් වන බව;

VII. නගර සභාවට ගෙවිය යුතු ගාස්තුව මාස තුනකට වඩා වැඩි කාලයක් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් 8 වන උප වගන්තියේ නියමයන් අනුව ගිවිසුම අවලංගු කිරීමට යටත් වන බව සහ එකී ගිවිසුම අවලංගු කරන ලද බව ලේකම්වරයගෙන් ලියවිල්ලකින් යුතු දැන්වීමක් ලැබුණු දිනයේ සිට එකී වෙළෙඳ පොළෙහි වෙළෙඳ මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීමට තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීම සහ ඒ ටිකට් පත් වෙනුවෙන් මුදල්

අය කරගැනීමට ගාස්තු එකතු කරන්නාට පැවරී තිබුණු බලය අවසන් වන බව;
ගිවිසගත් කොන්දේසි වශයෙන් ඇතුළත් කිරීම නගර සභාවේ කාර්යය වන්නේය.

(8) ගාස්තු එකතු කරන්නා විසින් නගර සභාවට ගෙවිය යුතු වන මාසික ගාස්තුව නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ ගාස්තුව මාස තුනක ගාස්තුවට වඩා වැඩි වන යම් අවස්ථාවක, එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තු ගෙවන ලෙස ගාස්තු එකතු කරන්නාට ලියවිල්ලකින් වන දැන්වීමක් භාරදීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(9) 8 උප වගන්තිය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ ගාස්තු එකතු කරන්නෙකු විසින් තමාට ඒ දැන්වීම ලැබුණ දින සිට දින හතක් ඇතුලත එකතු කරන්නා සමග නගර සභාව අත්සන් කළ ගිවිසුම අවලංගු විය යුතුවාත් හැර ඒ අවලංගු වීම නීත්‍යානුකූල වන්නේය. එසේම එකී ගිවිසුම අවලංගු වූ ලෙස සැලකෙන දිනයේම එකී ගාස්තු එකතු කරන්නා වෙත ඒ බව ලියවිල්ලකින් දන්වා යැවීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(10) 8 උප වගන්තියේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව කවර හෝ අවස්ථාවක එකී ගිවිසුමේ පාර්ශවකරුවකු වන ගාස්තු එකතු කරන්නා විසින් එකී පොදු වෙළෙඳ පොළෙහි වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට කවර හෝ තැනැත්තෙකුට ටිකට් පතක් නිකුත් කරනු ලැබීම නොකළ

යුතු ය.

(11) 9 උප වගන්තිය යටතේ වන නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව එළඹෙන දිනයේ සිට එකී පොදු වෙළෙඳ පොළෙහි වෙළෙඳ මැහි පිවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටිකට් පත් නිකුත් කරනු ලැබීමට සහ එකී ටිකට් පත් වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීමටත් නගර සභාවේ කිසියම් බලයලත් නිලධාරියෙකු යෙදවීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය. එසේම බලයලත් නිලධාරියෙකු ලවා එකී කාර්යය තව දුරටත් කරගෙන යාමට නොහැකි වන බව ලේකම්වරයාගේ මතය වන විට 3 වන උප වගන්තියේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම සඳහා තමාගේ මතය සභාපතිවරයා මගින් නගර සභාවට ඉදිරිපත් කළ යුතු ය. ඒ ආකාරයෙන් ලේකම්වරයාගේ මතය නගර සභාව වෙත වාර්තා වී ඇති අවස්ථාවක දී 3 වන උප වගන්තිය අනුව ක්‍රියා කිරීමට නගර සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය.

(12) 11 උප වගන්තියේ සඳහන් ආකාරයෙන් 3 වන උප වගන්තිය අනුව ක්‍රියා කිරීමට නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති යම් අවස්ථාවක, එකී ටෙන්ඩර් කැඳවීමට අනුව ටෙන්ඩර් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට අවලංගු වී ඇති ගිවිසුමේ පාර්ශවකරු වූ ගාස්තු එකතු කරන්නාට හිමිකම තිබිය යුතුය.

27. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන්

විය යුතුය.

28. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් කිසියම් පොදු වෙළඳ පොළක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ගබඩා කර ඇති කිසියම් ආහාර ද්‍රව්‍යයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ තැනැත්තකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

29. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට "පරීක්ෂාකිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට" කිසියම් පොදු වෙළඳ පොළක් වෙළඳාම් කටයුතු සඳහා විවෘත කර තබනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

30. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

' කලත්‍රයා' යන්නෙන් කිසියම් බදු කරුවකුගේ නීත්‍යානුකූල භාර්යාව හෝ ස්වාමිපුරුෂයාද,

' පොදු වෙළඳ පොළ ' යන්නෙන් වෙළඳාමක නියුක්ත වීම සඳහා ඉදිකල කඩකාමර හෝ තමතමන්ගේ ගෙවත්තේ හෝ නිවසෙහි නිෂ්පාදනය කරනු ලබන එළවළු හෝ පළතුරුද ඇතුළු වෙනත් ද්‍රව්‍ය හෝ භාණ්ඩ විකිණීමට ස්ථාන ඇතිකර තිබෙන්නා වූ නගර සභාවවිසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් අදහස්වන අතර කිසියම් නිෂ්පාදනයක් තොග වශයෙන් මිලදී ගැනීම හෝ විකිණීම කරනු ලබන ස්ථානයක් ද ,

'ප්‍රධාන තක්සේරුකරු'යන්නෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු අදහස්වන අතර නගර.සභාව අයත්වන

පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් එකී දෙපාර්තමේන්තුව විසින් පත්කරනු ලැබ ඇති යම් නිලධාරියකු ද,

'බදුකරු'යන්නෙන් නගර සභාවසමඟ ඇතිකරගත් ගිවිසුමක් සහිතව කිසියම් පොදු වෙළඳ පොළක යම් කඩකාමරයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තකු ද,

'වෙළඳ මැස්ස'යන්නෙන් කිසියම් පොදු වෙළඳ පොළක කඩ කාමර වලින් වෙන් වූ හා එකී පොදු වෙළඳ පොළ ඇතුලත එදිනෙදා වෙළඳාම් කිරීම සඳහා ඉදිකරනු ලැබ ඇති කිසියම් බන්කුවක් හෝ ලෑල්ලක් හෝ පෙට්ටියක් අදහස් වන අතර එකී පොදු වෙළඳ පොලෙහි පොළව මත ඉරි සළකුණු ඇඳීමෙන් වෙළඳාම් කටයුතු සඳහා වෙන් කරනු ලැබ ඇති කවර හෝ ස්ථානයක් ද,

සභාපති" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තා ද;

"බලයලත් නිලධාරියා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු ද;

අදහස් වේ.

පළමුවන උප ලේඛණය

**.................. සභාව ..............පොදු වෙළදපොළ වෙළද/**

**මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සදහා වන**

**ටිකට් පත්‍රය**

ටිකට් පත හිමියාගේ නම .......................................................................

ජාතික හැදුනුම් පත්‍රයේ අංකය ................................................................

වෙන්කල වෙළද මැස්සේ/ ඉරි ඇදි කොටසේ අංකය.................................

වෙන්කර දුන් කාලය 20......................දින සිට20......................දින දක්වා

වෙන්කල දින ගණන: දින 01 / දින 07/ මාස 01යි

අයකර ගනු ලැබු ගාස්තුව: රුපියල්..........................................................

නිකුත් කළ දිනය:............................ .......................................

* **අනවශ්‍ය වචන කපා හරින්න** ගාස්තු එකතුකරන්නාගේ අත්සන

දෙවන උප ලේඛණය

## පොදු වෙළද පොළක වෙළද මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට

## අයකරනු ලබන ගාස්තු චක්‍රය

| වෙළද මැස්සේ ස්වභාවය | දින 01 ක ගාස්තුව | දින 07ක ගාස්තුව | මාසයක ගාස්තුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පොළොවෙන් ඉහළට ඉදිකල වෙළද මැස්ස | ..................... | .................... | ..................... |
| පොළොව මත ඉරි සලකුණු යොදා වෙන්කල කොටස | ..................... | .................. | .................... |

## XIV.නගර සභා බල ප්‍රදේශය තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (14 අ) උප වගන්ති යටතේ මෙම අතුරු ව්‍යවස්ථා සෑදීමට නගර සභාවලට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය ඇතුලත මෝටර් වාහන නතර කර තැබීම සඳහා ස්ථාන සැපයීම ඒ ස්ථානවල මෝටර් වාහන නවතා තැබීම සඳහා ගාස්තු පැනවීම අයකිරීම සහ එමගින් බල ප්‍රදේශයතුල මෝටර් වාහන නවතා තැබීම පාලනය කිරීම උදෙසා පැනවෙන අතුරු ව්‍යවස්ථාවකි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා සීමාව තුල වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. මෙහි මින්මතු සභාපතිවරයා වශයෙන් හඳුන්වනු ලබන නගර සභාවේ සභාපතිවරයා බල ප්‍රදේශය ඇතුලත වාහන නතර කර තැබීම සඳහා වෙන් කරන ලද යම් වීදීයක, වීදියක කොටසක හෝ යම් ස්ථානයක 'වාහන නතර කිරීමේ ස්ථානය' යැයි සඳහන් කරන දැන්වීමක් ඒ වීදියෙහි නැතහොත් වීදියෙහි කොටසක හෝ අදාල වෙනත් යම් ස්ථානයක ප්‍රකට ස්ථානයක සිට පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයෙහි ඇත්නම් මිස කිසියම් තැනැත්තෙකු විසින් වාහන නතර කර තැබීම සඳහා වෙන් කර ඇති ස්ථානයක වාහනක් නවතා තැබීම නොකල යුතුය.

6. සභාපතිවරයා විසින් බල ප්‍රදේශය තුල යම් වීදියක හෝ වීදියක කොටසක වාහන නතර කර තැබීම තහනම් කරන හෝ සීමා කරන නැතහොත් පාලනය කරන දැනිවීමක් ඒ වීදීයේ කොටසක ප්‍රකට ස්ථානයක සිට පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කළ හැකි අතර එවන් දැන්වීමක් මඟින් නතර කිරීම තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක වාහනයක රියදුරු විසින් ;

(1) කිසියම් නිලධාරියෙකු හෝ බලධාරියෙකු විසින් ඒ වීදියෙහි හෝ වීදියෙහි කොටසෙහි ඉදි කරනු ලැබ ඇති හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති කිසියම් වාහන සංඥාවකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීමේ හෝ ;

(2) ඒ වීදියෙහි කොටසෙහි ඒ අවස්ථාවේ පවත්නා කිසියම් වාහන ගමනාගමනයකට පිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීමේ හෝ ;

(3) කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයට ගොඩවීමට ඉඩ දීමේ හෝ ;

(4) එම වාහනයට බඩු පැටවීමේ හෝ එම වාහනයෙන් බඩු බෑමේ හෝ කාර්යය සඳහා අවශ්‍ය කාලයක් හැර ;

එම වාහනය එම වීදියෙහි හෝ වීදියෙහි කොටසෙහි නතර කර

තැබීම නොකළ යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාවේ 05 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන එක් එක් අවසර පත්‍රය සඳහා සභාව විසින් යෝජනා සම්මයක් මඟින් තීරණය කොට ගැසට් පත්‍රයෙහි පල කරනු ලබන ගාස්තු ප්‍රමාණයක් අය කරනු ලැබිය යුතුය.

8. ඉහත 4 වන වගන්තිය යටතේ වූ දැන්වීමක් මඟින් වාහන නතර කර තැබීම සඳහා වෙන් කරනු ලබන ස්ථාන සභාව විසින් කලින් කල තීරණය කර ප්‍රකාශයට පත් කල යුතුය.

9. රජයේ දෙපාර්තමේන්තුවක් සංස්ථාවක් සංස්ථාගත නොවූ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ සභාවක් විසින් කලින් කලට නියම කරනු ලබන මාසික ගාස්තු හෝ වාර්ෂික ගාස්තු සභාව වෙත ගෙවනු ලැබීමෙන් අවස්ථාවෝචිත පරිදි ඒ දෙපාර්තමේන්තුවට හෝ පුද්ගල මණ්ඩලයට හෝ පුද්ගලයෙකුට අයත් මෝටර් වාහන සඳහා මාසික හෝ වාර්ෂික අවසර පත්‍රයක් ලබා ගත යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම එය නිකුත් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් වෙනුවෙන් නම් ඒ බව තහවුරු වන පරිදි එම මෝටර් වාහනය හැදින්වීමේ අංකය සඳහන් විය යුතු අතර, ඒ අවසර පත්‍රයේ සඳහන් කාල සීමාව සඳහා පමණක් වලංගු විය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම තැනැත්තෙක් විසින්ම එම අවසර පත්‍රය වාහනයෙන් පිටතට පෙනෙන පරිදි

වාහනය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කල යුතුය.

12. පොලිස් නිලධාරියෙකු හෝ රථ වාහන පාලකයෙකු විසින් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක නතර කර ඇති යම් මොටර් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියදුරුගෙන් එම මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති වාහන නවතා තැබීමේ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුවද ඒ අවසර පත්‍රය එම වාහනයේ අයිතිකරු හෝ රියදුරු විසින් වහාම ඉදිරිපත් කල යුතුය.

13. කිසියම් වාහන නතර කර තැබිමේ පොදු ස්ථානයක් කිසියම් නිශ්චිත පංතියක හෝ වර්ගයකට හෝ මෝටර් වාහන සඳහා වෙන් කර තබා ඇති අවස්ථාවක කිසියම් තැනැත්තෙකු විසින් එම පංතියට හෝ වර්ගයට අයත් නොවන මෝටර් වාහනයක් එකී ස්ථානයේ නතර කර තැබීම නොකල යුතුය.

14. වාහන නතර කර තබන පොදු ස්ථානයකට ඇතුලු වන හෝ ඉන් පිටව යන හෝ වෙනත් මෝටර් වාහනයකට බාධා වන ආකාරයකට, කිසිම තැනැත්තෙක් විසින් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කරනු නොලැබිය යුතුය.

15. වාහන නතර කර තැබීම සඳහා වෙන් කර ඇති පොදු ස්ථානයක ඇතුලු වීම හා පිටත්වීම සඳහා වෙනම මාර්ග සලසා ඒ බව දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මඟින් දක්වා ඇති අවස්ථාවක නියමිත මාර්ගයෙන් හැර කිසිම මෝටර් වාහනයක් එම ස්ථානයට ඇතුලු වීම හෝ පිටවීම නොකල යුතුය.

16. දම්වැල් හෝ කුළුණු හෝ දම්වැල් කුළුණු යන දෙවර්ගයම මගින් වෙන් කොට

ඇති පොදු නැවතුම්පොළක නතර කරන මෝටර් වාහන සියල්ලම ඒවා පැමිණි අනුපිළිවෙල අනුව එකිනෙක පිටුපසින් හෝ පසෙකින් එකම පැත්තට මුහුණලා නතර කර තැබිය යුතුය.

17. මෝටර් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනය නතර කර තිබිය දී කිසිම තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම/ සේදීමට සැලැස්වීම නොකල යුතුය.

18. කිසිම තැනැත්තෙකු විසින් වාහනය නතර කර තැබීමේ පොදු ස්ථානයකින් වාහනය ඉවත් කර ගැනීමේ කාර්යය සඳහා අලුත්වැඩියාවක් කිරීමක් අත්‍යාවශ්‍ය වන්නේ නම් මිස වාහනය නතර කර තැබිමේ පොදු ස්ථානයක නතර කර තබා ඇති මෝටර් වාහනයක කිසිම ආකාරයකට අලුත්වැඩියාවක් කරනු නොලැබිය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එසේ වරද කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වු දඩුවමකට යටත් විය යුතුය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස,

"සභාපති" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තා ; ද

“පොලිස් නිලධාරියා ” යන්නෙන් පොලිස් පරීක්ෂක නිලයට පහල නිලයක් දරන ශ්‍රී ලංකා පොලිස් සේවයේ නිලධාරියෙකු ; ද

“රථ වාහන පාලක ” යන්නෙන් පොදු නතර කිරීමේ ස්ථානයක මෝටර් වාහන නතර කර තැබීම සඳහා සභාපතිවරයා වෙනුවෙන් අවසරපත්‍ර නිකුත් කිරීමට සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයෙකු; ද

“මෝටර් වාහන ” යන්නෙන් මාර්ගවල පාවිච්චි කිරීම සඳහා සකස් කරන ලද යාන්ත්‍රිකව බලය සපයන යම් වාහනයක්; ද

“වාහන නවතා තැබීමේ පොදු ස්ථානය ” යන්නෙන් නගර සභාවේ යෝජනා සම්මුතියක් මගින් වෙන් කරනු ලබන ස්ථානයක් ද

අදහස් වේ.

## XV.සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 වන වගන්තියෙහි (9) (ට) ඡේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට නගර සභා වලට බලය ලැබී ඇත.

2. සිසිල් බීම කර්මාන්ත ශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හදුන්වනු ලැබේ.

4. සභාපතිවරයා විසින් තත්කාලය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක්

ලබා ගෙන ඇත්තේ නම් මිස කිසිදු තැනැත්තෙකු විසින් සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම නොකල යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වන තෙක් වලංගු විය යුතුය.

6. මෙහි පහත නියමයන් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ සිසිල් බීම කර්මාන්ත ශාලාවකට බලපත්‍රයක් නිකුත් නොකල යුතුය.

(1) කර්මාන්ත ශාලා ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(2) කර්මාන්ත ශාලාවේ සෑම ගොඩනැගිල්ලකම ඇති කාමරවල බිත්ති වල අවම උස මීටර 2.14ට නොඅඩු විය යුතු අතර එම බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලින් හෝ කබොක් ගලින් බැඳ බදාම කපරාරු කර ඇතුල් පැත්තේ තීන්ත ආලේප කර තිබිය යුතුය. බිත්ති නිම කර ඇත්තේ ඇලුමිනියම් හෝ වෙනත් ලෝහ ද්‍රව්‍යයක් සමඟ ලෑලි යෙදීමෙන් වන අවස්ථාවක ලෑලි මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතුය.

(3) වහලය ස්ථිර ද්‍රව්‍ය යොදා සකස් කර සෙවිලි කර තිබිය යුතු අතර පියසි කෙලවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2 ක උසින් තිබිය යුතුය. අගු වාසිය අවම වශයෙන් මීටර 1ක් විය යුතුය.

(4) වහලයට යොදා ඇති යකඩ, වෙනත් වානේ හෝ ලී මතුපිට තෙල් සායම් හෝ තීන්ත ආලේප කර පිරිසිදු තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතුය.

(5) ගෙබිම සිමෙන්ති දමා මැද තිබීම හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(6) කර්මාන්ත ශාලාවේ සෑම ගොඩනැල්ලක්ම මනා වාතාශ්‍රයක් සහ ආලෝකයක් ලැබෙන ආකාරයෙන් ගොඩනංවා තිබිය යුතුය. සෑම කාමරයකම විවෘත කල හැකි ජනේල සවි කර

තිබිය යුතු අතර විවෘත කල විට ඒවායේ වර්ග ප්‍රමාණය ඒ කාමරයේ මතුපිට බිම් ප්‍රදේශයේ වර්ග ඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතුය.

(7) සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා කාමරවලින් බැහැර කරන අප ජලය, හිස් බෝතල් සේදීම සඳහා යොදා ගන්නා ස්ථාන වලින් බැහැර කරන අප ජලය සහ සේවකයින්ගේ නාන කාමරවලින් බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලායාමට හැකිවන ජලාපවාහන ක්‍රමයක් සකස් කර තිබිය යුතුය.

(8) සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සිරප් වර්ග සහ වෙනත් රසායනික ද්‍රව්‍ය, සිසිල් බීම ඇසිරීම සඳහා යොදා ගන්නා බෝතල් හෝ වෙනත් ඇසිරුම් ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා අවශ්‍යතාවය පරිදි වෙනම කාමර සපයා තිබිය යුතු අතර එකී කාමරවලට මීයන්ට සහ වෙනත් කෘමී සතුන්ට ඇතුල් විය නොහැකි පරිදි ආරක්ෂිත විධිවිධාන සලසා තිබිය යුතුය.

(9) සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයෙන් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබා තිබිය යුතු අතර අවම වශයෙන් මාස 06ට වරක් වත් මෙම තත්ත්ව සහතිකය ලබා ගැනීම කල යුතුය. ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නේ නම් එම ජලය සඳහා එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතුය.

(10) සිසිල් බීම කර්මාන්තයට සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට යොදා ගන්නා ජලය යම් ස්ථානයක ගබඩා කර තබන්නේ නම් ඒවා අපවිත්‍ර වීම වලක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතුය.

(11) හිස් බෝතල සේදීම සඳහා වන ස්ථානය සිසිල් බීම නිෂ්පාදනය කරන කාමර වලින් වෙන්ව ස්ථාන ගත කර තිබිය යුතු අතර ඉහත (9) ඡේදයේ සඳහන් ආකාරයෙන් තත්ත්ව සහතිකයක් ලබා ගන්නා ලද ජලය පමණක් ඒ සඳහා යොදා ගත යුතුය.

(12) සිසිල් බීම කර්මාන්තශාලාවේ කාර්යයන් හේතුවෙන් ජනනය වන අපද්‍රව්‍ය 16 වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර බැහැර කල හැකි ආකාරයෙන් වෙන් කල භාජන හෝ ටැංකි කර්මාන්තශාලාව තුල තබා තිබිය යුතුය.

(13) සිසිල් බීම කර්මාන්ත ශාලාවේ සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වනසේ වැසිකිලි සකස් කර තිබිය යුතු අතර කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම වැසිකිලි තිබිය යුතුය. එසේම එකී වැසිකිලි සිසිල් බීම නිෂ්පාදන කාමර සහ බෝතල් පිරිසිදු කිරීමේ ස්ථාන වල සිට අවම වශයෙන් මීටර් 15 ක් දුරින් ස්ථාන ගතකර තිබිය යුතුය.

(14) සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ස්ථානයේ සිට මීටර් 18 කට අඩු දුරකින් කසළ වලක් හෝ පොහොර වලක් හෝ අළු වලක් හෝ ස්ථාන ගත කර නොතිබිය යුතුය.

7. බලපත්‍රලාභියා විසින්;

(1) 6 වන වගන්තියේ (2) වන සහ (4) වන උප වගන්තිවල දැක්වෙන ආකාරයෙන් තීන්ත ආලේප කිරීමට නියම කර ඇති කොටස්වල අවම වශයෙන් සෑම වර්ෂයකටම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම,

(2) සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සෑම කාමරයකම ගෙබිම, යටත් පිරිසෙයින් සෑම දිනකටම එක් වරක්වත් සේදීමට සහ

(3) සිසිල් බීම නිෂ්පාදනය කරන සෑම කාමරයක්ම සහ එහි වටා පිටාවද, කාණු, ලීබඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගැනීමට;

වගබලාගත යුතුය.

8. බලපත්‍රලාභියා විසින්, සිසිල් බීම කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරන සිසිල් බීම වර්ග ඇසිරීමට යොදා ගන්නා බෝතල් පිරිසිදු කිරීමේදී;

(01) එකී බෝතල් වල කලින් අලවා තිබෙන ලේබල් ඉවත් කිරීමට

හා මූලික වටයේ පිරිසිදු කිරීමට එක් ටැංකියක්ද;

(02) එකී බෝතල්වල අවසාන පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක්ද;

වශයෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිත කල යුතු අතර අවසාන පිරිසිදු කිරීම ගලා යන ජලය මගින් සිදු කිරීමට වගබලා ගත යුතුය.

9. සිසිල් බීම ඇසිරීම සඳහා වීදුරුවලින් නිපදවන ලද බෝතල් හැර වෙනත් කිසියම් ඇසුරුම් වර්ගයක් හෝ ඇසුරුම් වර්ග යොදා ගනු ලබන අවස්ථාවක, එකී ඇසුරුම් එක් වරක් පමණක් භාවිතයට ගනු ලැබිය යුතු අතර ඒවා සෞඛ්‍යාරක්ෂිත ද්‍රව්‍ය වලින් නිපදවා ඇති ඇසුරුම් බවට තහවුරු කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය. මේ කාර්යයේදී එකී ඇසුරුම් ද්‍රව්‍ය සෞඛ්‍යාරක්ෂිත ද්‍රව්‍ය වලින් නිපදවා ඇති බවට නිෂ්පාදකයා විසින් හෝ සභාපතිවරයා විසින් දෙනු ලබන ලිඛිත සහතිකයක් වලංගු සහතිකයක් ලෙස සැලකිය යුතුය.

10. සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදාගන්නා සිරප් වර්ග සහ වෙනත් රසායනික ද්‍රව්‍ය කල් ඉකුත්වීමේ දිනය ප්‍රමාණවත් කාලයක් ඉදිරියට පවතින්නේ නම් මිස කිසිදු අවස්ථාවක එම ද්‍රව්‍ය සිසිල් බීම නිෂ්පාදන කටයුතු සඳහා යොදා නොගත යුතුය.

11. බලපත්‍රලාභියා විසින්;

(1) කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙලෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙලෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත්වී ඇත්තේ නම් මිස කවර හෝ සිසිල් බීම කර්මාන්ත ශාලාවක සේවයේ නියුක්ත වීම හෝ එසේ සේවයේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකල යුතුය.

(2) හොඳින් සෝදා පිරිසිදු කල ඇඳුම් හැඳ ඇත්තේනම් මිස කවර

හෝ තැනැත්තෙකු සිසිල් බීම කර්මාන්ත ශාලාවක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකල යුතුය.

(3) සිසිල් බීම කර්මාන්ත ශාලාවේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීමට වගබලා ගත යුතුය.

14. සිසිල් බීම නිෂ්පාදනයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා  අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැලදුම් සපයා තිබීමත් , එකී සේවකයන් සිසිල් බීම නිෂ්පාදන කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළදුම් පැළද සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

15. සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සිරප් සහ අනෙකුත් රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා අපාරගම්‍ය හා පහසුවෙන් පිරිසිදු කළ හැකි භාජන යොදා ගත යුතු අතර,එකී ද්‍රව්‍ය සිසිල් බීම නිෂ්පාදනය සඳහා, සිසිල් බීම නිෂ්පාදන කාමරයේ තබා ගන්නා අවස්ථාවල හැර ගබඩා ස්ථානයෙන් පිටත තබා ගැනීම නොකළ යුතුය.

16. (1) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය;

I. ජෛවහායන අපද්‍රව්‍ය;
II. වීදුරු;
III. කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය;
IV. පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;
V. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
VI. නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;
VII. අන්තරායකර අප ද්‍රව්‍ය;

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති

වෙන් වෙන් වු භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(2) ඉහත (1) උප වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කිරීම සිදු නොකරන අවස්ථාවක සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කල යුතුය.

17. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

18. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් සිසිල් බීම නිෂ්පාදන කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් සිසිල් බීම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතු අතර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකල යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යනු ලබන ස්ථානය 6 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ වෙනත් කිසියම් වගන්තියක නියමයන්ට පටහැනි වන අවස්ථාවක නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

20. 17 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුනු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කල යුතුය. එසේ ක්‍රියා කිරීමට නොහැකිවුවහොත් ඒ සම්බන්ධව පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද ඒ

ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතරකට නොවැඩි විය යුතුය.

21. 19වන වගන්තියේ සඳහන් අකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ;

"සභාපති" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තා ද;

"බලයලත් නිලධාරියා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු ද;

"සිසිල් බීම" යන්නෙන්, පළතුරු, එසන්ස්, සිරප් යන සියල්ලම හෝ එක් වර්ගයක් උපයෝගී කරගෙන නිෂ්පාදනය කරනු ලබන හා බෝතල්වල හෝ වෙනත් යම් ආකාරයක ඇසුරුමක අසුරනු ලබන බීම සහ සෝඩා බීමද;

අදහස් වේ.

## XVI. ගෙවල් සහ වාසස්ථාන ශුද්ධ පවිත්‍ර කිරීම සහ ඒවාට නිසි වාතාශ්‍රය ලැබීමට සැලැස්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ

කියවිය යුතු, එකී ආඥා පනතේ 157 වන වගන්තිය (9) (ද) උප වගන්තිය යටතේ මෙම අතුරු වස්ථාව සෑදීමට නගර සභාවට බලය ලැබී ඇත.

2. නගරසභා බල ප්‍රදේශය තුල පිහිටි ගෙවල්වල්, ගොඩනැගිලි හා වාසස්ථාන ශුද්ධ පවිත්‍ර කරනු ලැබීම සහ ඒවාට වාතාශ්‍රය ලැබීමට සලස්වීම තුලින් වාසයට සුදුසු ස්ථානයක් බවට පත් කිරීම සඳහා එම කටයුතු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ ඊට පිළියම් යෙදීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ගෙවල් සහ වාසස්ථාන ශුද්ධපවිත්‍ර කිරීම සහ ඒවාට නිසි වාතාශ්‍රය ලැබීමට සැලැස්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හදුන්වනු ලැබේ.

4. නගරසභා බල ප්‍රදේශය තුල කිසියම් ගොඩනැගිල්ලක වාසය කළ හැකි පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ නියමයක් කිරීමේ බලය නගරසභාවක සභාපතිවරයා සතු විය යුතුය.

5. සභාපතිවරයා විසින් ඉහත සඳහන් නියමය කිරීමේදී එකී ගොඩනැගිල්ලේ -

(1) වර්ග ප්‍රමාණය;

(2) ගොඩනැගිල්ලේ උස;

(3) ගොඩනැගිල්ලට වාතාශ්‍රය ලැබිය හැකි මාර්ග;

(4) ගොඩනැගිල්ලට ආලෝකය ලැබිය හැකි මාර්ග;

(5) ගොඩනැගිල්ල තුළ සහ ගොඩනැගිල්ල අවට වාසයට සුදුසු පිරිසිදු පරිසරයක් පැවතීම;

(6) සපයා ඇති ජල පහසුකම් පරිමාව; සහ

(7) සපයා ඇති සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණය ද,

පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

6. නගර සභා බල ප්‍රදේශය තුල යම් ගොඩනැගිල්ලක් එහි වාසයකරන්නන්ගේ හෝ ඒ අවට වෙසෙන්නන්ගේ සෞඛ්‍යයට හානිකර අන්දමෙන් අපිරිසිදු ලෙස ප්‍රමාණවත් වාතාශ්‍රය නොලැබෙන අයුරින් සහ අධික වාසයෙන් යුක්තව පවත්වාගෙන යන අවස්ථාවක එහි වාසය කරන්නන්ගේ සෞඛ්‍යයට හානි කර ලෙස එය බවත්වාගෙන යන බවට සභාපතිවරයාට හැඟී යන අවස්ථාවක සභාපතිවරයා විසින් එය පිරිසිදු කර මනා පරිදි පවත්වාගෙන යන ලෙස හෝ ගොඩනැගිල්ලේ වාසය කළ හැකි සංඛ්‍යාව ඉක්මවා සිටින පුද්ගලයින්ට එම ගොඩනැගිල්ලෙන් ඉවත් විය යුතු බවට හෝ නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

7. ඉහත 6 වන වගන්තිය පරිදි නියමයක් කිරීමෙන් පසු යම් අවස්ථාවක එම ගොඩනැගිල්ල නිසි පරිදි වාසයට සුදුසු වනසේ පිරිසිදු නොකරන ලද්දේ නම් හෝ ගොඩනැගිල්ලේ වාසය කරන පුද්ගලයින් සංඛ්‍යාව සභාපතිවරයා නියම කර ඇති පුද්ගල සංඛ්‍යාව ඉක්මවා යන්නේ නම් එවන් අවස්ථාවක එම ගොඩනැගිල්ලේ අයිතිකරු වරදකට වරදකරු වන්නේය.

8. වාසය සඳහා ප්‍රයෝජනයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක්, නිසි පරිදි පිරිසිදු කර නොමැති බවට හෝ එහි වාසය කරන්නන්ගේ සෞඛ්‍යයට අනතුරුදායක වන තරමට අධික වාසයකින් යුක්ත වන බවට හෝ යන අවස්ථාවක යම් පුද්ගලයෙකු එවන් වරදකට වරදකරු වීමෙන් පසු එම වරද තවදුරටත් කරගෙන යනු ලබන බව සභාපතිවරයාට පෙනී ගියහොත් සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන කරුණු වාර්තාවක් මත මහේස්ත්‍රාත්වරයා විසින් සමාප්ති ආඥාවක් නිකුත්කළ හැකිය.

9. යම් ගොඩනැගිල්ලක බදුකරු එය අතුරු බදු දී තිබේ නම් එහි නවාතැන්කරුවන්, කුලී නිවැසියන් හෝ වෙනත් නේවාසිකයන් වෙනුවෙන් එම

අතුරු බදුකරු ඉහත කී 8 වන වගන්තියේ කාර්යය සඳහා ගොඩනැගිල්ලේ අයිතිකරු ලෙස සලකනු ලැබිය හැකිය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලද ආඥාවක් අනුව අයිතිකරු විසින් හෝ බදුකරු විසින් ගොඩනැගිල්ලෙන් ඉවත්වන ලෙස නියම කරනු ලැබූ විට, සෑම නවාතැන්කරුවෙකුම හෝ වෙනත් නේවාසිකයෙකුම එම ගොඩනැගිල්ලෙන් ඉවත්ව යා යුතුය.

11. යම් තැනැත්තෙකු විසින් මෙම අතුරු වස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු නගර සභා ආඥා පනතේ 153 වගන්තිය යටතේ වූ දඬුවමකට ඔහු යටත් විය යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අදහස් වන්නේ නම් මිස;

‘‘සභාපතිවරයා’’ යනුවෙන් තත් කාලයෙහි සභාවේ සභාපතිධුරය දරන තැනැත්තාද;

“ගොඩනැගිලි” යනුවෙන් පුද්ගලවාසය සඳහා යොදාගනු ලබන ගෙවල් ගොඩනැගිලි සහ ගෙපත්ද කුලී පදනම මත නවාතැන් සපයනු ලබන, ගෙවල්, ගොඩනැගිලි සහ ගෙපත්ද; සහ

"බලය ලත් නිලධාරියා’’ යනුවෙන් සභාපතිවරයා විසින් බලය දෙනු ලබන නගරසභාවේ නිලධාරියෙකු ද;

අදහස් වේ.

# XVII. නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. නගරසභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (7) (ඉ) ඡේදය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමට නගර සභාවට බලය ලැබී ඇත.

2. නගර සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතක සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම හා පාලනය කිරීම සහ එසේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම හා පාලනය කිරීම සහ එසේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයාගෙන් ලබාගත් බලපත්‍රයක් යටතේ මිස කවර හෝ තැනැත්තෙකු විසින් මංමාවතක සිට පෙනෙන පරිදි හෝ විදහා පා ඇති පරිදි ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව සඳහා වලංගු විය යුතුය.

6. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය කරන සෑම තැනැත්තෙකුම විසින් අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට වැඩ කරන දින 02 කට පෙර මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කර ගත් ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කල යුතුය.

7. ඉහත 5 වන වගන්තිය සමඟ මිලි මිටර 2014 x මිලි මීටර 297 ප්‍රමාණයේ කඩදාසියක 1: 1000 පරිමානයට අනුව පිළියෙළ කල දැන්වීමේ ආදර්ශයක්

සහ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානයේ හෝ ස්ථානවල මිලි මීටර 210 x මිලි මීටර 297 ප්‍රමාණයේ කඩදාසියක 1 : 1000 පරිමාණයට අඳින ලද භූමි සැළැස්මක් / සැලසුම් ඉදිරිපත් කර තිබිය යුතු අතර ප්‍රචාරක දැන්වීමේ නියම දිග හා පළල එහි සටහන් කර තිබිය යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටෙක ඒ බව සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතුය.ඉල්ලුම්කරුට එකී දැන්වීම ලැබීමෙන් අනතුරුව ඔහු විසින් මෙහි 22 වන වගන්තියේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුව සහ 17 (1) වන වගන්තියේ සඳහන් ඇප මුදල නගර සභාව වෙත ගෙවනු ලැබීමෙන් පසුව අදාළ බලපත්රය නිකුත් කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

9. ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක් සඳහාම නිකුත් කල බලපත්‍රයේ අංකය ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර එක් එක් දැන්වීමේ දකුණු පස පහළ කෙළවරේ සටහන් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කල ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන අවසාන දිනයෙන් පසුව පැය හතළිස් අටක් ගත වීමට මත්තෙන් එකී ප්‍රචාරක දැන්වීම් හා ඊට යොදාගත් වෙනත් සියලුම ද්‍රව්‍ය කොටස් ඒ ස්ථානයෙන් හෝ ස්ථානවලින් ඉවත් කරවීමට සැළැස්වීම එකී බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

11. කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය, ලිපිනය සමඟ වෙනත් කිසියම් වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, ඒ ප්‍රචාරක දැන්වීම හෝ දැන්වීම් මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානයන්ට යටත් විය යුතුය. මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් බලපත්‍ර ලබා ගත යුතු තැනැත්තා ලෙස එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු, කළමණාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතුය.

12. බලපත්‍ර ලත් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානය හැර වෙනත් කවර හෝ ස්ථානයක හෝ

ස්ථානවල ප්‍රදර්ශය කිරීම හෝ එසේ කිරීමට සැළැස්වීම හෝ නොකල යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිර වීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකල යුතුය. එසේම වාහන පදවාගෙන යනු ලබන කිසියම් රියදුරෙකුගේ අවධානය වෙනස් කරන ආකාරයෙන් විදුලි ආලෝක ධාරා සවි කිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම නොකල යුතුය.

(1) දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා බලපත්‍රයක් නිකුත් කර ඇත්තේනම් එසේ සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තෙකුට කලින් නිකුත් කළ බලපත්‍රයක වලංගු කාල සීමාව අවසන් වී තිබිය යුතුය; එසේ වුව ද කලින් නිකුත් කළ හා තවදුරටත් වලංගු බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු බලන කිසියම් දැන්වීම් පුවරුවක සඳහන් දැන්වීම දර්ශනය වීමට බාධාවක් නොවන පරිදි ඊට ආසන්නයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් නිකුත් කිරීමට මේ විධිවිධානය බාධවක් නොවිය යුතුය.

(2) ප්‍රදර්ශන බලපත්‍රය ඉල්ලා සිටින දැන්වීම අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට හානිකර හෝ කවර හෝ ආගමකට හෝ ජන වර්ගයකට හෝ ජන කොට්ඨාසයකට හානිවන හෝ එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන ආකාරයේ දර්ශන හෝ වදන් හෝ ඇතුළත් වන ආකාරයේ දැන්වීමක් නොවිය යුතුය.

(3) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාව විසින් ඉදි කරනු ලැබ ඇති දැකුම් පැළැල්ලක ප්‍රචාරක දැන්වීමක් හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ඉල්ලා ඇති අවස්ථාවක එකී දැකුම් පැළැල්ලේ ඒ ප්‍රචාරක දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමණවත් ඉඩකඩක් තිබිය යුතුවාක් හැර ඒ අවස්ථාව වන විටත් කලින් නිකුත් කළ කිසියම් බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක

දැන්වීම් සඳහා වෙන් කළ කාලය ඉකුත් වී තිබිය යුතුය.

(4) ප්‍රදර්ශන බලපත්‍රය ඉල්ලා සිටින දැන්වීම කවර හෝ ලිඛිත නීතියකින් තහනම්කර හෝ සීමා කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීමක් නොවිය යුතුය.

14. ප්‍රචාරක දැන්වීම අසලින් ගමන් ගන්නා කවර හෝ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිරවීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකළ යුතුය. එසේම කිසිදු ප්‍රචාරක දැන්වීමක් වාහන පදවාගෙන යනු ලබන කිසියම් රියදුරෙකුගේ අවධානය වෙනස්කරන ආකාරයෙන් හෝ ඔහුගේ දර්ශනය අවහිර වන ආකාරයෙන් විදුලි ආලෝක ධාරා සවිකිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම නොකල යුතුය.

15. ප්‍රදර්ශනය සඳහා වලංගු බලපත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමක සිදුවන යම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් නගර සභාව කවර ආකාරයක හෝ වගකීමකට යටත් නොවිය යුතුය.

16. කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්විමක් පොදු ස්ථානයක තිබෙන හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක හෝ වෙනත් කිසියම් කොටසකට හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධ කර සවි කිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම කවරෙකු විසින් හෝ නොකල යුතුය.

17. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන කවර හෝ ප්‍රදේශයක, නගර සභාව සතු කිසියම් ඉඩමක හෝ නගර සභාව විසින් ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව ලබාගන්නා වෙනත් කිසියම් තැනැත්තෙකු සතු ඉඩමක හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කල හැකි දැකුම් පැළලි ඉදිකර පවත්වාගෙන යාමට නගර සභාවට බලය තිබිය යුතුය.

(2) (1) ඡේදය යටතේ නගර සභාව විසින් ඉදිකරනු ලැබ ඇති

කිසියම් දැකුම් පැළැල්ලක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රදර්ශකයින්ගෙන් අය කර ගැනීම නීත්‍යානුකූල වන්නේය.

18. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක, නගර සභාව විසින් කලින් කල තීරණය කර ප්‍රකාශයට පත් කර ඇති පරිදි ගණනය කරනු ලබන ඇප මුදලක් නගර සභාවේ තැන්පත් කරනු ලබන තෙක් සභාපතිවරයා විසින් එකී ඉල්ලුම් පත්‍රයට බලපත්‍රයක් නිකුත් කිරීම නොකල යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ 09 වන වගන්තියෙහි සඳහන් ආකාරයෙන් බලපත්‍රලාභියා විසින් ක්‍රියා කිරීමෙන් අනතුරුව සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත අදාල ඇප මුදල නිදහස් කර ගැනීමට ලබපත්‍රලාභීයාට හිමිකම ඇත්තේය.

20. ඇප මුදල නිදහස් කර ගැනීම සඳහා සභාපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු එකී ඇප මුදල බලපත්‍රලාභිය වෙත නිදහස්කිරීමට පෙර සභාපතිවරයා විසින් ;

(1) මෙම අතුරු ව්‍යවස්ථාවේ 09 වන වගන්තියේ සඳහන් නියමයන් බලපත්‍රලාභියා විසින් නිසියාකාරයෙන් ඉටු කර තිබේද යන බව ;

(2) දැන්වීම ප්‍රදර්ශනය කරනු ලැබ ඇත්තේ නගර සභාව විසින් ඉදිකරන ලද දැකුම් පැළැල්ලක වන අවස්ථාවක, ඒ දැන්වීම් ඉවත් කිරීමේ දී හෝ බලපත්‍රලාභියා විසින් වගකිව යුතු කිසියම් කාර්යයක් හේතුවෙන් හෝ එකී දැකුම් පැළැල්ලට කිසියම් හානියක් වී නොමැති බව;

තහවුරු කර ගත යුතුය.

21. කිසියම් බලපත්‍රලාභියෙකු විසින් 09 වන වගන්තියේ සඳහන් ආකාරයට ක්‍රියා

කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ නගර සභාවේ දැකුම් පැළැල්ලක හානියක් සිදු වී ඇති විටෙක, අවස්ථාවෝචිත පරිදි ඒ කාර්යය කිරීම හෝ දැකුම් පැළැල්ලක් අලුත්වැඩියා කිරීම හෝ ඒ කාර්යයන් දෙකම සඳහා නගර සභාවට දරන්නට සිදුවන වියදම් ඇප මුදලින් අඩුකර ගත යුතු අතර ඉතිරි වන යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල පමණක් බලපත්‍රලාභියාට ආපසු ගෙවිය හැකිය.

22. 20 වන වගන්තියේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීමේ දී නගර සභාවට අයකර ගත යුතු මුදල තැන්පත් කරනු ලැබූ ඇප මුදලට වඩා වැඩිවන අවස්ථාවක, එසේ වැඩිදුරටත් අයවිය යුතු මුදල බලපත්‍රලාභීයා විසින් නගර සභාවට ගෙවිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ යම් ප්‍රචාරක දැන්වීමක් වෙනුවෙන් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම, බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ ලිත් වර්ෂයක කිසියම් නිශ්චිත කාල සීමාවක් සඳහා නොවන්නේ නම් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි කඩ කිරීම මත අවලංගු කරනු නොලැබුවහොත් එම ලිත් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින අවසන් වන්නේය.

24. නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය හෝ පෙන්නුම්කෙරෙන දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම, ගෘහ නාම පුවරු සහ කිසියම් දේපළක් බදුදීමට හෝ විකිණීමට හෝ කුළියටදීමට හෝ එකී දේපළ මත ප්‍රදර්ශනය කරනු ලබන “බදුදීමට තිබේ” හෝ ” විකිණීමට තිබේ” හෝ ” කුළියට දීමට තිබේ” යනුවෙන් සඳහන් වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා මෙම අතුරු ව්‍යවස්ථවේ විධිවිධාන අදාළ නොවිය යුතුය.එසේ වුවද ඒ ආකාරයෙන් දැන්වීම් පුවරු එකකට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන යම් අවස්ථාවක එසේ වැඩිවන සෑම දැන්වීම් පුවරුවක් ම සඳහා මෙම අතුරු ව්‍යවස්ථවේ විධිවිධාන බලපැවැත්විය යුතුය.

25. රජය හෝ පළාත් සභාව හෝ නගර සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ

නොවිය යුතුය.

26. කිසියම් ප්‍රචාරක දැන්විමක් ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයේ කාලය අවසන් වීමෙන් අනතුරුව අනුගාමී වර්ෂය සඳහා එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නව බලපත්‍රයක් ලබා ගත යුතුය.

27. (1) කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදා ගනු ලබන කවර හෝ අන්දමේ හෝ දැකුම් පැළැල්ලක්, අධාරකයක්, ඉදිකිරීමක් හෝ සවි කිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තෙකුගේ දේපලකට අන්තරාදායක වන හෝ හානිවන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්ත්වයට පත්කරන ලෙස බලපත්‍රලාභියාට යොමු කරන දැන්වීමක් මඟින් නියම කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතුය.

(2) (1) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ සඳහන් කාලය තුල ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක දී සභාපතිවරයා විසින් එකී ප්‍රචාරක දැන්වීම සහා නිකුත් කල බලපත්‍රය අවලංගු කිරිම සහ ඒ ප්‍රචාරක දැන්වීම ගලවා ඉවත් කල යුතුය.

(3) ඉහත (2 ) ඡේදයේ විධිවිධාන යටතේ කිසියම් බලපත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා නගර සභාවේ තැන්පත් කරනු ලැබ ඇති ඇප මුදල නගර සභාව සතුවිය යුතුවාත් හැර ඒ ඇප මුදල ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

28. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ඉදි කිරීම සඳහා පාවිච්චි කරන කවර හෝ ඉදි කිරීමක අධාරකයක්, සවි කිරීමක් හෝ ඒ සඳහා පාවිච්චි කරන වෙනත් යම් කිසිවක් නිසා හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් ප්‍රකාශිත අර්ථය හෝ ගම්‍ය වන අනයාර්ථයක් හේතුවෙන් කිසියම් පාර්ශවයකට සිදුවන හෝ සිදුවීමට ඉඩ

ඇති කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා වගකීමට යටත්විය යුතුය.

29. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සදහා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් මඟින් එකී ප්‍රචාරක දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලැබූ නීතිමය අවසරයක් ඇතුළත් වූ ලෙස නොසැළකිය යුතු අතර එලෙස තේරුම් ගැනීමද නොකළ යුතුය.

30. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව නගර සභාවේ සභාපති, ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කල හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසදුම් ලබා දිය යුතුය.

31. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ පසුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස,

"සභාපතිවරයා" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපතිධුරය දරන තැනැත්තාද;

"බලයලත් නිලධාරියා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු ද;

"ලේකම්වරයා" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ ලේකම්ධුරය දරන තැනැත්තාද;

" දැකුම් පැළැල්ල" යන්නෙන්, ජනතාවගේ දැන ගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ රදවා තැබීම පිණිස ඉදි කරනු ලබන

කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක්ද;

“ ප්‍රචාරක දැන්වීම” යන්නෙන්, කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ඉහළින් හෝ ඒ මත සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනයකරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරන කාර්යය සඳහා යොදා ගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් සකස් කල කිසියම් රාමුවක අලවන හෝ සවිකරන ලද කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ වෙළඳ දැන්වීමක්ද ;
අදහස් වේ.

## පළමුවන උප ලේඛනය

......................නගර සභාව

දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

................................සභාපතිතුමා වෙතටයි

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :- ..................................................................
   ජාතික හැඳුනුම්පත් අංකය :- ..................................................................
   දුරකතන අංකය :- ..................................................................

2. ඉල්ලුම්කරු නොපැමිණෙන්නේනම් :-
   නියෝජිතයාගේ නම සහ
   ලිපිනය :- ..................................................................
   ..................................................................

ජාතික හැඳුනුම්පත් අංකය :- ...................................................................
දුරකතන අංකය :- ...................................................................

3. දැන්වීම් සම්බන්ධ විස්තර :-

| | ප්‍රදර්ශනය කරන ප්‍රමාණය , ස්ථානය, (මුළු) | දිග, පළල, (අඩි) | වර්ග අඩි ප්‍රමාණය | ප්‍රදර්ශනය වන පැති ගණන | දැන්වීම් වර්ග ගණන |
|---|---|---|---|---|---|
| i | ....................... | ................. | ................. | ....................... | ................. |
| Ii | ....................... | ................. | ................. | ....................... | ................. |
| Iii | ....................... | ................. | ................. | ...................... | .................. |
| Iv | ....................... | ................. | ................. | ...................... | .................. |
| v | ....................... | ................. | ................. | ...................... | .................. |

.

4. ප්‍රදර්ශනය කරන්නට යෙදෙන දැන්වීමේ විස්තරය:-

..................................................................................................................
..................................................................................................................
(දැන්වීමේ පිටපතක් අමුණා එවිය යුතුය)

5. දැන්වීම ප්‍රදර්ශනය කරන කාලය ............................... සිට .........................දක්වා

.......................................... නගර සභාවේ අතුරු ව්‍යවස්ථාවන්ට එකඟව දැන්වීම ප්‍රදර්ශනය කිරීමට නියමිත දිනට දැන්වීම ඉවත් කර ගැනීමටත් මේ හා සම්බන්ධයෙන් නගර සභාව විසින් නිකුත් කරනු ලබන නිගමනයන් හා උපදේශනයන් පිළිපැදීමටත් මම මෙයින් පොරොන්දු වෙමි. එම කොන්දේසි කඩකලහොත් ඇප මුදල් නගර සභාව සතුවන බව දනිමි.

තවද මෙහි සඳහන් විස්තර නිවැරදි බවටත් සත්‍ය බවටත් සහතික කරමි.

යම් හෙයකින් මෙහි සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව හෙළිවුවහොත් මා විසින් ඉදිරිපත් කර ඇති සියලුම බැනර් නගර

සභාව සතු කිරීමටත් ප්‍රදර්ශනය කිරීමෙන් පසු හෙළිවුවහොත් ඒ සියල්ල කපා ඉවත් කර සභාව සතු කිරීමටත් යටත් වන බවට එකඟ වෙමි.

දිනය....................................... .................................
අයදුම්කරුගේ
අත්සන

## XVIII. පීඩාකාරී, අන්තරාදායක, පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. නගර සභා ආඥා පනතේ 157 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ (9) (ග) ඡේදය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමට නගර සභාවට බලය ලැබී ඇත.

2. මෙහි පීඩාකාරී , අන්තරාදායක, පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාර යන්න සභාවේ යෝජනා සම්මුතියකින් නිශ්චිතව සඳහන් කර ඇති මෙම අතුරු ව්‍යවස්ථාවේ උප ලේඛනගත පීඩාකාරී හෝ අන්තරාදායක සහ පීඩාකාරී අන්තරාදායක ව්‍යාපාර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම උදෙසා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව පීඩාකාරී, අන්තරාදායක, පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නේ නම් මිස කිසිම තැනැත්තෙකු ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල පීඩාකාරී, අන්තරාදායක හෝ පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාරයක්

(මෙහි මින්මතු ව්‍යාපාරය යනුවෙන් හඳුන්වනු ලබන )පවත්වාගෙන යාම නොකල යුතුය.

5. ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන පරිශ්‍රය, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් ඒ සඳහා සුදුසු බවට නිර්දේශ කරන ලද්දේ නම් මිස, කිසිදු තැනැත්තෙක් පීඩාකාරී , අන්තරාදායක, පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකමක් නොලබන්නේය.

6. ව්‍යාපාරය එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වන විට දී එම ගොඩනැගිල්ල, පහත සඳහන් කොන්දේසි වලට අනුකූලවන්නේනම් මිස, කිසිදු තැනැත්තෙක් පීඩාකාරී , අන්තරාදායක, පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකමක් නොලබන්නේය:-

    (1) ගොඩනැගිල්ල මනා තත්වයකින් නඩත්තුකර පවත්වා ගත යුතු අතර, මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතුය. සෑම කාමරයකම, විවෘත කළ විට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

    (2) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14ට නොඅඩු විය යුතු අතර ගඩොල්,කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාරු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස කපරාරු කොට තීන්ත ආලේප කර තිබිය යුතුය.

(3) සෑම පියසි කෙළවරක්ම ගෙබිමේ සිට මීටර් 2ට වැඩි උසකින් තිබිය යුතුය.

(4) වහළය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(5) දැවමයකොටස් සියල්ල තෙල් සායම් ගා හෝ තීන්ත ආලේප කර තබිය යුතුය.

(6) සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් හෝ ජලය කාන්දු නොවන ද්‍රව්‍යයකින් තනවා තිබිය යුතුය.

(7) සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැළැස්මකට අනුව කරනු ලැබූ ඉදි කිරීමක් විය යුතුය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම පරිශ්‍රයක් සඳහාම ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සපයා තිබිය යුතු අතර නිසි පරිදි ජලප්‍රවාහනය සඳහා කාණු පද්ධතියක් පවත්වා ගත යුතුය.

08. පරිශ්‍රයේ ගොඩනැගිලි ඇතුළත විදුලි පහසුකම් සම්බන්ධව විදුලි අධිකාරවරයෙකු හෝ ඒ පිළිබඳ වෘත්තීය පුහුණුවක් ලත් කාර්මික නිළධාරියෙකු හෝ සභාපති විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් අනුමත කර තිබිය යුතුය.

09. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අදාල වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් විය යුතුය. එසේ වුවද, මෙම අතුරු ව්‍යවස්ථාවේ ව්‍යාපාරය පවත්වාගෙන යාමට පනවා ඇති කවර කොන්දේසියක් හෝ උල්ලංඝනය කරන ලද්දේ නම් බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට හිමිකම ඇත්තේය. මෙම හිමිකම භාවිතා කිරීමට පෙර අදාළ බලපත්‍රධාරියාට එකී කාරණය සම්බන්ධව කොන්දේසිය නියමානුකූල කිරීමට ප්‍රමාණවත් අවස්ථාවක් ලබාදිය යුතුය.

(1) සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියලු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩා කර තිබිය යුතුය.

(2) පීඩා ඇතිවීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවතක් ඔස්සේ රැගෙන යාමේදී මහජනතාවට කිසිදු පීඩාවක් ඇතිවීම වැළැක්විය හැකිවන සේ ආවරණය කරන ලද, උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතුය.

(3) යම් කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී වාෂ්ප හෝ වායු, ඒවා විහිදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ ඝණීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

(4) තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළයුතු අතර,ඒවා දිනපතා සේදීම කළ යුතුය.

(5) තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම ජලය කාන්දු නොවන යම් ද්‍රව්‍යයකින් ඉදිකර තිබිය යුතු අතර, හොඳින් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

(6) ව්‍යාපාර කරගෙන යනු ලබන ගොඩනැගිලිවල බිත්ති අපවිත්‍ර දෑ උරාගැනීමෙන් ආරක්ෂා වන පරිදි යහපත් තත්වයකින් තබාගත යුතු අතර, වාර්ෂිකව ඒවායේ තීන්ත ආලේප කළ යුතුය.

(7) ව්‍යාපාරික කටයුතු වලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියල්ල පිරිසිදුව තැබිය යුතු අතර, දිනපතා පිරිසිදු කළ යුතුය.

(8) ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්,රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තව දුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම යොදවන්නේ නම් මිස, ආවරණය කරන ලද

භාජනවල බහා දිනපතා ඉවත් කළ යුතුය.

(9) හම් හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙගවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍යවන පරිදි හිස් කර පවිත්‍ර කළ යුතුය.

(10) යම් ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක්, මුහුද හෝ යම් විවෘත ජල ප්‍රදේශයක් තුළට යම් අපවිත්‍ර,දුගඳ හමන හෝ අප්‍රසන්න ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලා යාමට සැලැස්වීමෙන් හෝ අප්‍රසන්න ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දියපාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, මුහුද හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

10. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් හෝ බලය පවරන ලද ප්‍රාදේශිය සභාවේ යම් නිලධරයෙකු විසින් සියළු සාධාරණ වේලාවන් තුළදී, පීඩාකාරී, අන්තරාදායක, පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාරයක් ව්‍යාපාරයක් හෝ කරගෙන යනු ලබන පරිශ්‍රයකට ඇතුළු වී පරීක්ෂා කර බැලීම නීත්‍යනුකූල වන්නේය. තවද, බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා හෝ එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

11. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කලයුතු කාර්යයන් නියමිත කාලයක් ඇතුළතදී ඉටුකරන ලෙස බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත. තවද, එම නිවේදනය ලද වහාම යථෝක්ත දැන්වීමේ විධි විධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ , පීඩාකාරී, අන්තරාදායක, පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාර ලෙස හැඳින්වෙන ව්‍යාපාර පිළිවෙළින් අ, ආ, ඇ දරන උප ලේඛනවල ඇතුළත් කරනු ලැබ ඇත.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30ක් ඇතුළත බලපත්‍රය නිකුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් හේතු සහිතව ඒ බව ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ වගකීම වන්නේය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ පසුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"සභාපතිවරයා" යන්නෙන් තත් කාලයෙහි ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය දරන තැනැත්තා ද;

"බලයලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියකු ද;

"තැනැත්තා" යන්නෙන් සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද,

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු ද;

අදහස් වේ.

"අ" <u>උපලේඛනය * පීඩාකාරී ව්‍යාපාර</u>

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම

පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම

සම් පදම් කිරීම

සම් විකිණීමට තබා ගැනීම

සත්ව පාලනය (මස්,කිරි හෝ බිත්තර සදහා)

උම්බලකඩ නිෂ්පාදනය කිරීම

රබර් නිෂ්පාදනය හෝ රබර් රොටි තබා ගැනීම

පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම

තොග වශයෙන් විකිණීම සදහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම

කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම

පොල්කටු අගුරු හෝ දැව අගුරු නිපදවීම

දුම්කොළ වියළීම

සත්ව ආහාර නිපදවීම

පුන්නක්කු නිපදවීම

සත්ව මාංශ හෝ ලේ පැසවීම

සබන් නිෂ්පාදනය කිරීම

සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම

ට්‍රන්ක් පෙට්ටි සෑදීම

අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම

ලෝහ සුන්බුන් තබා ගැනීම

ගෘහ භාණ්ඩ නිපදවීම

වේවැල් භාණ්ඩ නිපදවීම

වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම

සිරප් හෝ පළතුරු බීම නිපදවීම

රසකැවිලි නිපදවීම

පොල් ලෙලි පෙගවීම (පොල් පල් කිරීම)

බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)

දත් බුරුසු වර්ග නිපදවීම

රා එකතු කිරීම

විනාකිරි නිපදවීම

දැව ඉරීම

පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම

සෝඩා නිපදවීම

කෙදි සායම් කිරීම

සම් භාණ්ඩ නිපදවීම

පළතුරු,මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම

කෝපි,ධාන්‍ය වර්ග පිටි කිරීම

බේකින් පවුඩර් නිපදවීම

ගෑස් මැන්ටල් නිපදවීම

පොටි නිපදවීම

ඉටිපන්දම් නිපදවීම

කපුරු නිපදවීම

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම

රෙදි සෝදන නිල් නිපදවීම

ලාකඩ නිපදවීම

සුවද විලවුන් නිපදවීම

පාසල් රටහුණු නිපදවීම

ටයර් හෝ ටියුබ් නිපදවීම

ටයර් නැවත පිරවීම

ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම

සිමෙන්ති නිපදවීම

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම

වැලි කඩදාසි නිපදවීම

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම

ගඩොල් පිළිස්සීම

යන්ත්‍රානුසාරයෙන් රෙදි විවිම

අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම

උළු නිපදවීම

පොහොර,හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම

යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම

"ආ" - උපලේඛනය * අන්තරාදායක ව්‍යාපාර

කළුගල් කැණීම, කැඩීම හෝ කුඩු කිරීම

සිසිල් බීම නිෂ්පාදනය

අයිස් නිෂ්පාදනය

එළවළු තෙල් නිෂ්පාදනය

පොල්තෙල් නිෂ්පාදනය

ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම

මෙතිලේටට් ස්ප්‍රීතු නිෂ්පාදනය

තේ පෙට්ටි නිපදවීම

කොහු හෝ වෙනත් කෙදි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය

පිදුරු තබාගැනීම

පාවිච්චි කළ ඇදුම් ගබඩා කිරීම

ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම

යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම

හිරිගල් හෝ හුණුගල් කැණීම

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම

හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම

ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය රැස් කිරීම හෝ ගබඩා කිරීම

පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීම

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම

විසිරි පින්තාරු කිරීම

ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම

ලෝහ සංස්කාර්ය කර්මාන්ත (යන්ත්‍රෝපකරණ,ආයුධ,උපකරණ නිපදවීම)

"ඈ" - උප ලේඛනය * පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර

තලාතු මිණිරන් සුද්ද කිරීම

රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුදු, කරදමුංගු, එනසාල් හෝ කෙදි වර්ග සකස් කිරීම

ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම

රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම

විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම

තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම

හුණුගල් හෝ සත්ත්ව මේද නිපදවීම

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම

මෝරතෙල් සකස් කිරීම

බෝට්ටු තැනීම

බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම

ලෝහ වර්ග පෑස්සවීම

මෝටර් වාහන අළුත්වැඩියා කිරීම

මෝටර් වාහන සේවා කිරීම

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම

වාත්තු මඩුවක් පවත්වාගෙන යාම

බෙළෙක් වැඩපලක් පවත්වාගෙන යාම

මෝටර් වාහන බොඩි තැනීම

කෘමිනාශක, දිලීරනාශක, පැළෑටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම

විෂබීජනාශක නිපදවීම

මදුරුනාශක දඟර / දියර නිපදවීම

රූපලාවන්‍ය කටයුතු කිරීම

බාබර් සාප්පු

# XIX. කොණ්ඩා කපන ස්ථාන හා බාබර් සාප්පු පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 වන වගන්තියේ (9) (එ) ඡේදය අනුව මෙම අතුරු අතුරු ව්‍යවස්ථාව පැනවීමට නගර සභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බලප්‍රදේශය තුළ කොණ්ඩා කපන ස්ථාන හා බාබර් සාප්පු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම උදෙසා පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව කොණ්ඩා කපන ස්ථාන හා බාබර් සාප්පු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ.

4. සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරණ ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් නගර සභා ප්‍රදේශය තුළ කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම නොකල යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

   (1) මේ වගන්තියේ (2) සහ (3) ඡේදවල සඳහන් නියමයන් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

(2) කොණ්ඩා කපන ස්ථානය හෝ බාබර් සාප්පුව පවත්ගෙන යාමට අදහස් කරන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස-

I. ශක්තිමත්ව නිමාකර තිබිය යුතු අතර එක් ගණුදෙනුකරුවෙකුට සේවා සැපයීම සඳහා වෙන්කරන ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 1.5 කට නොඅඩු වනසේ එකවර සේවා සපයන ගනුදෙනුකරුවන් සංඛ්‍යාවට අනුරූපීව ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතුය;

II. සේවා සපයා ගැනීමට බලාපොරොත්තුවෙන් පැමිණෙන කිසියම් ගනුදෙනුකරුවෙකුට, සේවා ලබාගන්නා ගනුදෙනුකරු ස්ථානගත කර ඇති ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 1.5 ක් දුරින් වන සේ පහසුවෙන් අසුන්ගෙන රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතුය;

III. ඇතුලත බිත්ති ශක්තිමත් ද්‍රව්‍යවලින් තනා තිබිය යුතු අතර තීන්ත ආලේපකර තිබිය යුතුය;

IV. වහළය ලී හෝ වෙනත් ශක්තිමත් ද්‍රව්‍යකින් තනා තිබිය යුතුවාත් හැර අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.25 ක් උස සිවිලිමකින් යුක්ත වියයුතුය; තවද සිවිලිම සුදුපාටින් පින්තාරු කර තිබිය යුතුය;

V. ඇතුලත පොළොව සිමෙන්තියෙන් මැද හෝ පිඟාන් ගඩොල් අල්ලා තිබිය යුතුය යුතු අතර බිත්තිය සහ පොළොව සම්බන්ධවන ස්ථානය පිරිසිදු කිරීමට පහසු වන සේ වටකුරු හැඩයට සකස් කර තිබිය යුතුය;

VI. ඇතුලත වායු සමීකරණය කර නොමැති ගොඩනැගිල්ලක් වන විට එහි භූමියේ වර්ග

ප්‍රමාණයෙන් පහලොවෙන් එකකට නොඅඩු වා කවුලු සවිකර තිබිය යුතු අතර ප්‍රමාණවත් ආලෝකය ලැබීමට සලස්වා තිබිය යුතුය;

VII. ඇතුලත වායුසමීකරණය කර ඇති ගොඩනැගිල්ලක් වන විට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා තිබිය යුතුය;

VIII. ගනුදෙනුකරුවන්ට සේවා සැපයීමේදී සේදීම සඳහා ජලය භාවිත කරන්නේ නම් සෝදන බේසම් සවිකර තිබිය යුතු අතර පාවිච්චි කල අප ජලය ගලායාමට ප්‍රමාණවත් නළ සවිකර තිබිය යුතුය;

IX. ඇතුලත භාවිත කර බැහැර කරණ අපජලය උරා ගැනීමේ වලකට ගලායාමට සලස්වා තිබිය යුතු අතර පොදු ජල මාර්ගයකට ගලායාමට සැලැස්වීම නොකල යුතුය;

X. පාරිභෝගිකයින් සඳහා ප්‍රමාණවත් ජල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සපයා තිබිය යුතුය;

XI. පරිශ්‍රය පදිංචිය සඳහා වන නිවසක කොටසක් වන විට දී ව්‍යාපාරික ස්ථානය පදිංචිය සඳහා වන කොටසින් වෙන්කර තිබිය යුතුය;

XII. භාවිතා කරන උපකරණ සහ මෙවලම් ජීවානුහරණය සඳහා ප්‍රමාණවත් වන ජලය උතුරවන ක්‍රමයක් හෝ ජීවානුහරණ ක්‍රමයක් සහ ජීවානුහරණය සඳහා භාවිත කෙරෙන බඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබිය යතුය;

XIII. ඇතුලත සේවා සපයන්නන්ට ඔවුන්ගේ වැඩ කරගෙන යාමේදී අත් සෝදා ගැනීමේ පහසුකම් සහිත බේසම් සහ සබන් හෝ සබන් දියර තබා තිබිය යුතුය;

XIV. ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සුදු පැහැයෙන් හෝ වෙනත් ලා පාටකින් යුක්ත වන එහෙත් තද පාටින් යුක්ත නොවන තුවා සහ උඩුකය ආවරණ වැස්ම ප්‍රමාණවත් සංඛ්‍යාවක තිබිය යුතුය;

XV. ඇතුලත දී කපන ලද කෙස් සහ වෙනත් අප ද්‍රව්‍ය දැමීම සඳහා හොඳින් වැසෙන පියනකින් යුත් එහා මෙහා ගෙන යා හැකි භාජන තබා තිබිය යුතුය;

XVI. ඇතුලත විදුලියෙන් ක්‍රියාත්මක කරණ උපකරණ යොදා ගන්නේ නම් එක් ගනුදෙනු කරුවෙකුගේ මේසයට අවම වශයෙන් එකක් බැගින් වනසේ ආරක්ෂිත විදුලි ජේනු එකක් බැගින් සපයා තිබිය යුතුය;

XVII. ප්‍රමාණවත් ප්‍රථමාධාර උපකරණ හා ඖෂධ සහිත ප්‍රථමාධාර පහසුකම් සපයා තිබිය යුතුය

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම ස්ථානයකම සේවයේ යොදවා ඇති සෑම තැනැත්තෙකුට ම ප්‍රථමාධාර පුහුණුවක් ලබා දී තිබිය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම පරිශ්‍රයක්ම අවම වශයෙන් වසරකට එක් වතාවක් හෝ තීන්ත ආලේප කර මනා නඩත්තුවක් යටතේ පවත්වා ගෙන යා යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකුම විසින් බලපත්‍රලත් ස්ථානයේ ගෙබිම දෛනිකව විෂබීජ නාශක යොදා සෝදා හැරීම කල යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුලත දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ නිදාගන්නා හෝ ආහාර ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි නොකල යුතු අතර වෙනත් යම් තැනැත්තෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුලත ආහාර පිසීම හෝ ආහාර විකිණීම හෝ විකිණීම සඳහා ආහාර ප්‍රදර්ශනය කිරීම හෝ නොකල යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රලත් ස්ථානයක;

(1) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ ආකාරයක කාර්යයක නිරතවීමට හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකල යුතුය.

(2) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් එම ස්ථානයේ කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකල යුතුය.

(3) සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතුය.

12. කවර හෝ ආකාරයක ආසාදන හෝ ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන නැතහොත් එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තෙකුට මෑතකදී උපස්ථාන කළ කිසියම් ගනුදෙනුකරුවෙකුට සේවා සැපයීමෙන් අනතුරුව -

(1) එකී සේවා සැපයීම කළ තැනැත්තා යම් විෂබීජ නාශක ද්‍රව්‍යයක් යොදා තමාගේ දෑත් පිරිසිදු කරගෙන ඇත්තේ නම් මිස වෙනත් යම් ගනුදෙනුකරුවෙකුට සේවය කිරීම හෝ සේවය කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(2) එකී ගනුදෙනුකරුවා සඳහා පාවිච්චි කළ කවර හෝ

උපකරණයක් ජීවානුහරණය කර ඇත්තේ නම් මිස සහ පාවිච්චි කළ තුවා සහ උඩුකය ආවරණ වැස්ම විෂබීජ නාශක සහ සබන් යොදා සෝදා ඇත්තේ නම් මිස වෙනත් යම් ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් පාවිච්චි කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකල යුතුය.

13. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සෑම සේවකයෙකු ම

(1) දිනපතා දිය නෑමෙන් හෝ ඇග සෝදා ගැනීමෙන් අනතුරුව පමණක් සේවයේ නියුක්ත වන බවට.

(2) අදින ඇඳුම් හා පැළඳුම් පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂක තත්වයෙන් වන බවට

(3) නියපොතු කොටට කපා කුණුවලින් තොරව තබා ගන්නා බවට,සහ

(4) එක් එක් ගනුදෙනුකරු සදහා සේවය කිරීමට පෙරාතුව සබන් ගා අත් සෝදා ගන්නා බවට; සහතික වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

14. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා -

(1) උපකරණ පාවිච්චි කරන එක් එක් වතාවට පසුව ජීවානුහරණය කිරීම,

(2) බුරුසු සහ පනා සෑම දිනයක ම පාවිච්චියට ගැනීමට පෙර හොදින් සෝදා පිරිසිදු කර ජීවානුහරණය කිරීම,

(3) සියලුම පුකුරු, කෝප්ප සහ සබන් බුරුසු ඒවා ප්‍රයෝජනයට ගන්නා එක් එක් වතාවෙන් පසුව උණුවතුරෙහි ගිල්වා සෝදා හැරීම සිදු කරන බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

15. බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබා ගන්නා එක් එක් ගනුදෙනුකරුගේ -

(1) කොණ්ඩය හෝ රැවුල කැපීමෙන් ඉවත් කරන කෙස් කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය අතු ගෑමෙන් හෝ විදුලි බලයෙන්

ක්‍රියාකරන උරා ගන්නා යන්ත්‍රයක් මගින් හෝ එකතු කර, ඒ සදහා වෙන්කළ භාජනයට දැමීම කරන බවට; සහ,

(2) කොණ්ඩය හෝ රැවුල කැපීමට උපයෝගී කරගන්නා තල මාරු කල හැකි දැළි පිහියේ තල මාරු කළ හැකි දැළි පිහියේ තලය මාරුකරන බවට,
බලපත්‍රලාභියා සහතික විය යුතුය.

16. බලපත්‍රලත් සෑම පරිශ්‍රයකම -

(1) දෛනික කටයුතු අවසානයේ හෝ අවශ්‍ය වන්නේ නම් දිනකට කිහිප වතාවක් බැගින් ඉවත් කරන කෙස් කැබලි ඇතුළත් බදුනේ ඇති අප ද්‍රව්‍ය අවම වශයෙන් පොළොවෙන් මීටර් එකකට නොඅඩු ගැඹුරකින් වළදැමීමට සැලැස්වීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම,

(2) ඉවත දමන කෙස් කැබලි හෝ වෙනත් අප ද්‍රව්‍ය සුළගේ ගසාගෙන යාම හෝ පරිශ්‍රය තුළ යම් පොදු ස්ථානයක විසිරී යාම වැළැක්වීමට ක්‍රියා මාර්ග ගැනීම,

(3) බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

17. බලපත්‍රලත් ස්ථානයේ රැස්කරන කෙස් කැබලි සහ වෙනත් අප ද්‍රව්‍ය 16 වන වගන්තියේ සදහන් ආකාරයට බැහැර කිරීමට නොහැකි වන අවස්ථාවකදී නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ නියම කරනු ලබන ආකාරයෙන් නගර සභාවේ කසළ රැස්කිරීමේ වාහනයට භාර දීමට ක්‍රියා කළ යුතුය.

18. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා අප ද්‍රව්‍ය රැස්කිරීමේ භාජන හිස් කිරීමෙන් පසු පිරිසිදු කර විෂබීජ නාශක යෙදීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

19. සෑම බලපත්‍රයක් ස්ථානයකම පාරිභෝගිකයින් සදහා සේවාව අවසානයේ අනුමත විෂබීජනාශක හා අවශ්‍ය වන්නේනම් අනුමත ලේ නවත්වන ද්‍රව්‍ය පමණක් භාවිතා කල යුතුය.

20. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බලපත්‍රලාභියා විසින් පිරිසිදු තත්ත්වයෙන් නොමැති උඩු කය ආවරණ වැස්මක් හෝ සෝදනු ලැබීමෙන් පසු පළමුවරට

පාවිච්චි කරන තුවායක් නොවන කිසියම් තුවායක් හෝ කවර හෝ ගණුදෙනුකරුවෙකුගේ ප්‍රයෝජනය සදහා යොදා ගැනීම නොකළ යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් අනුකූලව කටයුතු සිදු වන්නේද යන්න පරීක්ෂා කිරීම සදහා සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට, පරිශ්‍රයෙහි සේවාවන් සිදු කරනු ලබන ඕනෑම අවස්ථාවක එම පරිශ්‍රයට ඇතුල්වීමට බලය ඇත්තේය.

22. මෙම අතුරු ව්‍යවස්ථාවේ යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පරිශ්‍රයක මෙම අතුරු ව්‍යවස්ථාවේ සදහන් විධිවිධානයන්ට පටහැනිව කටයුතු සිදුවන බවට සභාපතිවරයා සෑහීමට පත්වන ඕනෑම අවස්ථාවක නිශ්චිත කාලයක් කල් දෙමින් සභාපතිවරයා විසින් එකී කටයුතු නිවැරදි කරගන්නා ලෙස දැන්වීමක් බලපත්‍රලාභියාට භාර දෙනු ලැබිය යුතුය.

23. 22වන වගන්තියේ සදහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සදහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළයුතුය. බලපත්‍රලාභියා විසින් පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සදහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය.එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

24. 23 වන වගන්තියේ සදහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ පසුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 අ වන වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු

ව්‍යවස්ථාවල -

"සභාපතිවරයා" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ සභාපති ධුරයදරන තැනැත්තා ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද ඕනෑම නිලධාරියකු ද,

අදහස් වේ.

## XX. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. නගර සභා ආඥා පනතේ 157 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ (9) (ග) ඡේදය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමට නගර සභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. නගර සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මස් විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මස් වෙළඳ ස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(1) මස් විකිණීම සඳහා ම ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැදෙන ලෝහ

තහඩු හෝ යොදා තිබිය යුතුය.

(2) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(3) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු සාදා තිබිය යුතුය.

(4) (3) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අප ජලය උරා ගන්නා වලකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතුය.

(5) අප ජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතුය.

(6) මස් වෙළඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවභායන අප ද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අප ද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5 ක් ගැඹුරෙන් වළ දැමීම හෝ නගර සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව බැහැර කිරීම කළ යුතුය.

(7) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

5. ගෝ ඝාතක ආඥා පනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝ ඝාතකාගාරයේදී මරණු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය

කිරීම හෝ කවර තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

6. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මස් කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණද, මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතුය.

8. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මස් අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුනේ නම් මිස ශේෂවන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතුය.

9. කවර හෝ ගෝ ඝාතකාගාරයක් තුළ කිසියම් දිනයක දී හෝ කාල වකවානුවක මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, කවර හෝ මස් කඩයක වෙළඳාම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතුය.

10. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමින් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතුය.

11. බලපත්‍රලත් ස්ථානයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්න පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ පාවිච්චියට ගැනීම සඳහා බිමට සුදුසු ජලය ප්‍රමාණවත් ප්‍රමාණයක් තබා ගැනීම කළ යුතුය.

13. (1) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(2) හොඳින් සෝදා පිරිසුදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(3) මස් වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතුය.

14. මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහ සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය

විය යුතුය.

15. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

16. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මස් වෙළඳ ස්ථානයක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මස් වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නිත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

17. (1) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

I. ජෛවහායන අපද්‍රව්‍ය;
II. වීදුරු;
III. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;
IV. පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;
V. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
VI. නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයෙදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;
VII. අන්තරායකර අපද්‍රව්‍ය;

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට

සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(2) ඉහත (1) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතුය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මස් වෙළඳ ස්ථානයේ මස් වෙළඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මස් විකිණීමේ ස්ථානයක් පවත්වගෙන යනු ලබන ස්ථානය 4 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූලව තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

20. 19 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලැබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

21. 20 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති

අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ පසුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා ප්‍රදේශය" යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.

## XXI. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. නගරසභා ආඥා පනතේ 157 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ (9) (ග) ඡේදය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීම නගරසභාවට බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ අතුරු

ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. නගර සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මාළු විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මාළු විකිණීමේ වෙළඳ ස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(1) මාළු විකිණීම සඳහාම ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැදෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතුය.

(2) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(3) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතුය.

(4) (3) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අප ජලය උරා ගන්නා වළකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතුය.

(5) අප ජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතුය.

(6) මාළු වෙළඳ ස්ථානයෙන්, බැහැර කරනු ලබන ජෛවභායන අප ද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අප ද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5 ක් ගැඹුරෙන් වළ දැමීම හෝ නගර සභාව විසින් කලින් කළ තීරණය කර ක්‍රියාත්මක කරන ආකාරයට බැහැර ලීම් කළ යුතුය.

5. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මාළු කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණද, මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මාළු ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මාළු වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුනේ නම් මිස ශේෂවන කවර හෝ මාළු ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතුය.

8. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක් බල්ලන්, බළලුන්, මීයන්, කෘමින් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතුය.

9. බලපත්‍රලත් ස්ථානයෙහි මාළු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට

පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතුය.

10. (1) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දි එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදි සාත්තු කිරීමෙහි යෙදි සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(2) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(3) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතුය.

11. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම විසින් ප්‍රයෝජනයට

ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මාළු වෙළඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මාළු වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නිත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

14. (1) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

I. ජෛවහායන අපද්‍රව්‍ය;
II. වීදුරු;
III. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;
IV. පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;
V. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
VI. නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයෙදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;
VII. අන්තරායකර අප ද්‍රව්‍ය;

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(2) ඉහත (1) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ

ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මාළු වෙළඳ ස්ථානයේ මාළු වෙළඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

17. 16 වන අතුරු වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලැබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

18. 19 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබු දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබු බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ පසුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් නගර සභාව අදහස් වේ.
"සභාපති" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"නගර සභා ප්‍රදේශය" යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය
අදහස් වේ.

## XXII. ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (9) (ප) ඡේදය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට නගර සභාවට බලය ලැබී ඇත.

2. නගර සභා බල ප්‍රදේශය තුල ලොන්ඩරි පිහිටුවීම, නඩත්තු කිරීම සහ විධිමත් කිරීම සඳහාද ඒ සම්බන්ධයෙන් ගාස්තු පනවා අයකිරීම සඳහා ද විධිවිධාන සැලසීම ද පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව "ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. සභාපති විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය ඇතුළත කවර හෝ ස්ථානයක ලොන්ඩරියක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

5. බලපත්‍රය ලබා ගැනීමට අදහස් කරන්නේ යම් ස්ථානයක් සඳහාද, ඒ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් ලොන්ඩරියක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

(1) ලොන්ඩරිය සඳහා භාවිතා කරන ගොඩනැගිල්ලේ සෑම කාමරයකට ම විවෘත කල හැකි කවුළු සවිකර තිබිය යුතු අතර එකී කවුළු, එක් එක් කාමරයේ ගෙබිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය.

(2) සෑම කාමරයක ම බිත්තිවල උස ප්‍රමාණය මීටර් 2.75 කට නොඅඩු විය යුතුය.

(3) කිළුටි රෙදි සහ සේදූ රෙදි සඳහා වෙන වෙනම කාමර සපයා තිබිය යුතුය.

(4) ලොන්ඩරියෙහි සේවයෙහි නියුක්තව සිටින තැනැත්තන් සෑම දස දෙනෙකුට ම, යටත් පිරිසෙයින් එක් වැසිකිළියක් බැගින් වන වැසිකිළි සංඛ්‍යාවක් ඉදිකර තිබිය යුතුය.

(5) සභාපතිවරයා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමිතියකට අනුව පවිත්‍රකරණය කිරීමක් කරන්නේ නම් මිස රෙදි

සේදීමෙන් පසු බැහැර කරන අප ජලය පොදු ජල මාර්ගයකට මුදා හැරීම නොකළ යුතුය.

(6) රෙදි සේදීමෙන් පසු බැහැර කරන අපජලය පවිත්‍රකරණයට ලක් කිරීමට නොහැකි වන අවස්ථාවක, එකී අපඩලය, උරා ගන්නා වළකට ගලා යාමට සැලැස්විය යුතුය.එසේම එකී උරා ගන්නා වල වාතයට නිරාවරණය කර නොතිබිය යුතු අතර ආසන්නයේ ඉදිකර ඇති ළිදක සිට මීටර් පහලොවකට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතුය.

(7) ලොන්ඩරිය සඳහා භාවිතා කරන ගොඩනැගිල්ල ඇතුළත හා පිටත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතුය.

6. බලපත්‍රලත් සෑම ලොන්ඩරියක් සඳහාම භාවිත කරන ස්ථානය ඇතුළත -

(1) මනා අලුත්වැඩියාවෙන් යුතුව පවත්වාගෙන යායුතුය.

(2) කවර හෝ අවස්ථාවක ගෘහ කාර්යය සඳහා භාවිත නොකළ යුතුය.

(3) කවර හෝ සතෙකු තබා ගැනීම හෝ එසේ කිරීමට ඉඩදීම නොකළ යුතුය.

(4) කිළිටි රෙදි සහ සේදූ රෙදි එකට තැබීම හෝ තබන්නට සැලැස්වීම නොකළ යුතුය.

(5) රෙදි මැදීමේ කාර්යය සඳහා අඟුරු භාවිත කරනු ලබන්නේ නම් බැහැර කරනු ලබන ශේෂ කොටස් ජලය යොදා නිවා දැමීමෙන් අනතුරුව වෙනම භාජනයක තැබීමට සැලැස්විය යුතු අතර බලපත්‍ර ලත් ස්ථානය ඇතුළත අඟුරු කැට නිපදවීම සඳහා පොල් කටු හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් පිළිස්සීම නොකළ යුතුය.

(6) දෛනික කටයුතු අවසානයේ ලොන්ඩරියේ දල්වන ලද ගින්දර නිවා දැමීමට ක්‍රියා කල යුතුය.

7. කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

8. කිසියම් ලොන්ඩරියක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තියේ සඳහන් පරිදි වාර්ෂික බල පත්‍රයක් සඳහා බලපත්‍ර ගාස්තුවක් පනවා අයකර ගැනීමට සභාවට බලය ඇත්තේය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන නියාමනය කිරීම සම්බන්ධයෙන් සභාවේ සභාපතිවරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට බලය පැවරීම නීත්‍යානුකූල වන්නේය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් විය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට "පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට" ලොන්ඩරියේ කටයුතු පවත්වා ගෙන යනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

12. නියමයක් යටතේ බල පත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට පරීක්ෂා කිරීම සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීම අරමුණු කරගෙන පරීක්ෂා කිරීමට බාධාකිරීමක් නොකල යුතුය.

13. යම්කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචික නගර සභාවේ සභාපති, ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසදුම් ලබා දිය යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවධානයක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බළය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ පසුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 අ වන වගන්තිය යටතේ වූ දඩුවවමකට යටත් විය යුතුය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ -

"සභාපතිවරයා" යන්නෙන් තත් කාලයෙහි නගර සභාවේ

සභාපතිධූරය දරන තැනැත්තාද;

“ලේකම්වරයා” යන්නෙන් තත්කාලයෙහි නගර සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා ද;

“ලොන්ඩරිය” යන්නෙන්, රෙදි ශෝධකයෙකු ලෙස ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙකු විසින් රෙදි සේදීම, වියලීම, වියලීම මගින් පිරිසිදු කිරීම හෝ මැදීම හෝ යන කිසියම් කාර්යයක් හෝ කාර්යයන් කිහිපයක් සඳහා පාවිච්චි කරන කවර හෝ වර්ගයක ගොඩනැගිල්ලක් ද එවැනි තැනැත්තෙකු විසින් හෝ ඔහුගේ ව්‍යාපාරයේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ළිඳක්, ටැංකියක් හෝ ජලය ලබා ගන්නා වෙනත් ප්‍රභවයක් ද ඊට ඇතුළත් විය යුතුය.

“බලපත්‍රලාභියා” යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ බල පත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකුද

“බලයලත් නිලධාරියා” යන්නෙන් තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද සභාවේ ඕනෑම නිලධාරියෙකු ද;

පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නෙන් එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක්ද;

අදහස් වේ.

## XXIII. අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. නගර සභා ආඥා පනතේ 157 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ (9) (ට) ඡේදය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමට නගර සභාවට බලය ලැබී ඇත.

02. නගර සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන අයිස් කර්මාන්ත ශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා විධිවිධාන සැලස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව අයිස් කර්මාන්ත ශාලා පිළිබ අතුරු ව්‍යවස්ථාව යුනවෙන් හදුන්වනු ලැබේ.

04. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ උප ලේඛන 1 හි සදහන් අයදුම් පත්‍රය මගින් නියමිත වර්ෂය බලපත්‍රයක් ඉල්ලුම් කිරීම බලපත්‍ර ලාභියාගේ කාර්යය හා වගකීම වන්නේය.

05. මෙම වගන්තියේ පහත සදහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් කවර හෝ අයිස් කර්මාන්ත ශාලාවකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකල යුතු ය:-

(1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පැවතිය යුතු ය;

(2) කර්මාන්ත ශාලාවේ සෑම සංවෘත ගොඩනැගිල්ලකම විවෘත කළ හැකි ජනේල සවි කර තිබිය යුතු අතර එකී ජනෙල

විවෘත කළ වට ජනෙල් වල ක්ෂේත්‍රඵලය කාමරයේ මතුපිට බිම් ප්‍රමාණයන් පහලොවෙන් එක් පංගුවකට නොඅඩු විය යුතු ය.

(3) කර්මාන්ත ශාලාවේ අයිස් නිෂ්පාදන යන්ත්‍ර සවිකර ඇති සෑම කාමරයකම බිත්ති උසින් මීටර් තුනකට නො අඩු විය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් තනා ඇති ඇතුල්පැත්තේ කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතුය; නැතහොත් ශක්තිමත් තහඩු යොදා තීන්ත ආලේප කර තිබිය යුතු ය;

(4) පියසි කෙලවරවල් පොලොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 2.8 ක් උසින් තිබිය යුතුය.

(5) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය;

(6) ලී වලින් තැනූ කොටස්වල තෙල් සායම් ආලේප කර හෝ ඔප දමා තිබිය යුතුය;

(7) ගෙබිම සෑම තැනම සිමෙන්ති දමා හෝ පිගන් ගඩොල් අල්ලා තිබිය යුතුය;

(8) අයිස් නිෂ්පාදනය සඳහා වෙන්කර ඇති කාමරය වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම නොකළ යුතුය;

(9) අයිස් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලාපවහන

මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය;

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය අයිස් නිෂ්පාදනය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතුය.

(10) අයිස් කර්මාන්තයට සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වලක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය;

(11) බලපත්‍රලත් ස්ථානයේ ජනනය වන කසළ බැහැර කිරීම සඳහා 9 වන වගන්තියේ සඳහන් නියමයන්ට අනුව බැහැර කිරීමට හැකි වන ආකාරයෙන් ක්‍රියාකර තිබිය යුතු ය;

(12) කර්මාන්ත ශාලාව තුළ ජනනය වන අප ජලය බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් උරාගන්නා වලක් සකස් කර තිබිය යුතු ය;

(13) බලපත්‍රලත් ස්ථානයේ ඉදිකර තිබෙන කිසියම් වැසිකිළික්, කසල වලක් හෝ විවෘත කසල කාණුවක් හෝ උරාගන්නා වලක්, අයිස් නිෂ්පාදනය කරන කාමරය සහ නිපදවන ලද අයිස් බැහැරට නිකුත් කරන ස්ථානයට යටත් පිරිසෙයින් මීටර් 16 කට නො අඩු දුරකින් ඉදිකිරීම නොකළ යුතු ය;

(14) ඉන්ධන ගබඩා කිරීම සඳහා වෙනම කාරමයක් හෝ ස්ථානයක් තිබිය යුතු අතර, අයිස් ගබඩා කරන හෝ අයිස් බැහැරට නිකුත් කරන කාමර ඇතුළතින් ඉන්ධන රැගෙන යාම නොකළ යුතු ය;

(15) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සහ විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

06. තීන්ත ආලේපකර තිබිය යුතු යයි 5 වන වගන්තියේ සඳහන් සෑම කොටසකම යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වතාවක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්විය යුතු ය.

07. බලපත්‍රලත් ස්ථානයෙහි :-

(1) අයිස් නිෂ්පාදනය කරන කොටස සහ අයිස් බැහැරට නිකුත් කරන ස්ථානය අවම වශයෙන් දිනකට වරක් බැගින් ජලයෙන් සෝදා හැරීමට සැලැස්විය යුතු ය.

(2) භාවිතා කරන උපකරණ සහ ස්ථානය දිනපතා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු අතර මනා අලුත්වැඩියා තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතු ය.

(3) සේවයේ යොදවා ඇති සියයලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

08. අයිස් නිෂ්පාදනයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව

වැසුම්,අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්,එකී සේවකයන් අයිස් නිෂ්පාදන කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

09. බලපත්‍රලත් ස්ථානයේ අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී:-

(1) ජනනය වන සියලුම අපද්‍රව්‍ය:-

I. ජෛවහායන අපද්‍රව්‍ය;
II. වීදුරු;
III. කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය;
IV. පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;
V. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
VI. නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;
VII. අන්තරායක අපද්‍රව්‍ය ;

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(2)බැහැර කරන අපජලය උරාගන්නා වලට බාධාවකින් තොරව

ගලා යාමට සැලැස්විය යුතු ය.

(3)ඉහත (1) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කිරීමට නොහැකිවන අවස්ථාවකදී සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

10. සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා ප්‍රදේශය තුළ අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

11. බලපත්‍ර ලත් ස්ථානයක :-

(1) කිසියම් ආසාදන,ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුත්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකල යුතුය.

(2) හොදින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කවර හෝ ආකාරයක කාර්යයක නියුත්ක වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

12. අයිස් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා අපාරගම්‍ය හා පහසුවෙන් පිරිසිදු කළ හැකි භාජන යොදා ගත යුතු අතර එකී ද්‍රව්‍ය අයිස් නිෂ්පාදනය සඳහා,අයිස් නිෂ්පාදන කාමරයේ තබා ගන්නේ නම් මිස ඒවා ගබඩා ස්ථානයෙන් පිටත තබා ගැනීම නොකළ යුතුය.

13. සභාපතිවරයා හෝ බලපත්‍රලත් නිලධාරියෙකු විසින් කිසියම් අයිස් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් අයිස් කැටයක ජල සාම්පලයක් ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී සාම්පල ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම හෝ නොකළ යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 5වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවැතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ වෙනත් කිසියම් වගන්තියක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයන්ට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

15. කිසියම් අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම සඳහා නගර සභා ආඥා පනතේ 164 වගන්තියේ සඳහන් පරිදි වාර්ශික බලපත්‍රයක් සඳහා බලපත්‍ර ගාස්තුවක් පනවා අයකර ගැනීමට සභාවට බලය ඇත්තේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාල කටයුතු නියාමනය කිරීම,අධීක්ෂණය කිරීම හා පාලනය කිරිම සම්බන්ධයෙන් සභාපතිවරයා වෙත පැවරී ඇති බලය

සභාපතිවරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානු කූල වන්නේය.

17. මෙම අතුරු ව්‍යවස්තාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත්මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතුය.

18. ඉහත 15 වන වගන්තියෙ හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයට ලිඛිතව කරුණු ඉදිරිපත් කිරිමක් කර ඇති අවස්ථාවක;
එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ අයිස් නිෂ්පාදන කටයුතු කරනු ලබන හෝ අයිස් බැහැරට නිකුත් කරන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

20. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව නගර සභාවේ සභාපති ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු

ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ පසුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 අ වන වගන්තිය යටතේ වු දඩුවමකට යටත් විය යුතුය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ-

"සභාපති යන්නෙන් තත්කාළයෙහි නගර සභාවේ සභාපති ධූරය දරණ තැනැත්තාද;

"බලයලත් නිලධාරියා යන්නෙන් තත්කාර්යය සඳහා නගර සභාවේ සභාපති වරයා විසින් බලය පවරා ඇති නගර සභාවේ නිලධාරියෙකුද;

සභාව යන්නෙන් අදාල නගර සභාවද;

"බලපත්‍ර ලාභියා යන්නෙන්" මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් කරන අතර,එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු දතත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හී පාලනය භාරව සිටින තැනැත්තෙකු ද;

"බලපත්‍රලත් ස්ථානය යන්නෙන්" මෙහි කවර වගන්තියක හෝ නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද,එකී ස්ථානය ද;

"අයිස් කර්මාන්ත ශාලාව" යන්නෙන්,වාණිජමය පදනමෙන් පරිභෝජනය සඳහා යාන්ත්‍රික ක්‍රමයට ජලය මිදීමට සලස්වනු ලබන කර්මාන්ත ශාලාවක් ද;

අදහස් වේ.

**උපලේඛන1**

**............................................... නගර සභාව**

**වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය "20..............**

1. කර්මාන්තය/ වෙළඳාම හිමි කරුගේ නම:

   ..................................................................................................................................

2. පෞද්ගලික ලිපිනය: ...............................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය:...........................................................................................................

4. දුරකථන අංකය:............................ජංගම:.......................................

5. කර්මාන්තයේ / වෙළඳ ව්‍යාපාරයේ නම

.........................................................................................

6. කර්මාන්තයේ / වෙළඳාමේ ස්වභාවය:.............................................................................................

කර්මාන්තය / වෙළඳාම කරන ස්ථානයේ -

(අ) ලිපිනය:........................................................................................

(ආ) වීථියේ / පාරේ නම:..................................................................

(ඇ) වරිපනම් අංකය: .....................................................................

(ඉ) දුරකථන අංකය:.........................................................................

7. කර්මාන්තය / වෙළඳාම කරගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරී

කොට්ඨාශයේ අංකය:...................................................................

කොට්ඨාශයේ නම:......................................................................

8. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු

අංකය:................................................

9. කර්මාන්තය / වෙළඳාම කරගෙන යන ස්ථානයේ කළමණාකරුගේ/

නියෝජිතයාගේ

නම:..............................................................................................................................

10. ජාතික හැඳුනුම්පත් අංකය:...........................................................

11. දුරකථන අංක: ජංගම...............................................................

නිවස.............................................................

සභාපති,

.....................................

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය / වෙළඳාම පවත්වාගෙන යන ස්ථාන සඳහා 20.............. වර්ෂය වෙනුවෙන් කර්මාන්ත වෙළඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

දිනය : 20............................

.................................................

ඉල්ලුම්කරුගේ අත්සන

## XXIV. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. නගර සභා ආඥා පනතේ 153 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 157 (9) (උ) ඡේදය අනුව මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමට නගර සභාවට බලය ලැබී ඇත.

2. නගර සභා බල ප්‍රදේශය තුල පවත්වා ගෙන යනු ලබන බේකරි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. මෙම වගන්තියේ පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ බේකරියකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

(1) බේකරිය මනා අළුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතුය.

(2) බේකරියේ සෑම කාමරයකම පිටතට විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර විවෘත කළ විට ජනේල කවුළුවල වර්ගඵලය කාමරයේ භූමියේ වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතුය.

(3) සෑම කාමරයකම සිවිලිමක් සවිකර තිබිය යුතු අතර සුදු පාටින් තීන්ත ආලේපකර තිබිය යුතුය.

(4) සෑම කාමරයකම බිම සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(5) බේකරියේ උදුන ස්ථානගත කරනු ලබන කාමරය පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 3 ක් උසට තිබිය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් බැඳ බිත්තිය දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේපකර තිබිය යුතුය.

(6) බේකරියේ උදුන ස්ථානගත කළ කාමරය හැර සෙසු සෑම කාමරයක්ම පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 2.75 ක් උසට තිබිය යුතු අතර

ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ ඇලුමිනියම් සහ ලීයෙන් හෝ බැඳ දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේපකර තිබිය යුතුය.

(7) බේකරිය තුළ ලීයෙන් කළ සියලුම සවිකිරීම් කොටස්වල තීන්ත ආලේප කර තිබිය යුතුය.

(8) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යකින් තනා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1 විය යුතුය.

(9) නිශ්පාදන කාර්යය සඳහා පානය කිරීමට සුදුසු තත්ත්වයේ ජලය පාවිච්චි කිරීමට විධිවිධාන සලසා තිබිය යුතුය.

(10) නිශ්පාදන කාර්යය සඳහා ජලය පාවිච්චි කරන සෑම කාමරයකටම ආරක්ෂිත ජල සැපයුමක් නළ මඟින් සපයා තිබිය යුතු අතර බැහැර කරන අපවිත්‍ර ජලය ගලායාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් සකස් කර තිබිය යුතුය.

(11) බැහැර කෙරෙන අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතුය.

(12) මෙම අතුරු ව්‍යවස්ථාවේ 9 වන වගන්තියෙන් නියම කර ඇති ආකාරයට අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩ පිළිවෙල ඇතිකර තිබිය යුතුය.

(13) බේකරියට ගිණි නිවීමේ උපකරණ සවිකර තිබිය යුතු අතර විදුලි බලයෙන් ක්‍රියාකරන බේකරියක් වන විට ඒ

සඳහා අමතර විදුලි ගිනි නිවීමේ උපකරණ සවිකර තිබිය යුතුය.

(14) බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය දර පාවිච්චි කරන බේකරියක් වන විට -

I. බේකරියේ උදුනේ දුම් කවුළුවේ ඉහළ කෙලවර අවම වශයෙන් පොළොව මට්ටමෙන් මීටර් 7.5 ක් උසට බැඳ තිබිය යුතුය.
II. පිටි අනන සියලුම මේස මතුපිට පළුදු නොතිබෙන සේ සුමට කර තිබිය යුතු අතර ලී පිරිද්දුම් අතර හිඩැස් නොමැති වනසේ පුරුද්දා තිබිය යුතුය. නැත්‍තහොත් මල නොබැඳෙන ලෝහ තහඩුවකින් පිරිද්දුම් වලින් තොරව ආවරණය කර තිබිය යුතුය.
III. බේකරි උදුනෙන් ඉවත් කරන දැවී ගිය අළු සහ ශේෂ දැව කොටස් ඉවත් කිරීමට ප්‍රමාණවත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් සපයා තිබිය යුතුය.
IV. බේකරි උදුනේ පිටත තීන්ත හෝ හුණු ගා තිබිය යුතුය.

(15) බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය විදුලි බලයෙන් ක්‍රියා කරන බේකරියක් වන විට

I. බේකරි උපකරණ වලට විදුලිය සම්බන්ධ කරන විදුලි ජේනු ආරක්ෂිත තත්ත්වයේ පැවතිය යුතු අතර අධි වෝල්ටීයතාව ඇති වන අවස්ථාවකදී හෝ විදුලිය කාන්දු වීමකදී විදුලිය ස්වයංක්‍රීයව විසන්ධි කෙරෙන උපකරණ සවිකර තිබිය යුතුය.

II. බේකරි පරිශ්‍රය තුළ සවිකර ඇති විදුලි

පරිපථවල විදුලි රැහැන් පිටතට විදුලිය කාන්දුවීම්වලින් තොර බට හෝ පෙට්ටි ඇතුළතින් ඇද තිබිය යුතු අතර පිටතට නිරාවරණය වූ විදුලි රැහැන් කෙළවරවල් නොතිබිය යුතුය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 4 වන වගන්තියේ නියකර ඇති සෑම කොටසකටම අවම වශයෙන් සෑම වර්ෂයකටම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතුය.

6. පිටි ඇනීම සඳහා යොදා ගන්නා සෑම කාමරයකම ගෙබිම, යටත් පිරිසෙයින් සෑම දිනයකම එක් වරක් වත් සේදීමට සැලැස්විය යුතුය.

7. බේකරිය සහ එහි වටපිටාවද, කාණු, ලී බඩු හා උපකරණද පිරිසිදුව හා මනා නඩත්තුවකින් හා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතුය.

8. බලපත්‍ර ලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතුය.

9. බේකරියේ සේවයේ යෙදෙන සෑම සේවකයකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් බේකරියේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවටත් බේකරියේ කාර්යයන්හි නියුක්ත වීමට පෙර හොඳින් ඇඟ සෝදා පිරිසිදු වී සිටින බවටත් සහතික වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. (1) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය -

I. ජෛවහායන අපද්‍රව්‍ය,

II. වීදුරු,

III. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,

IV. පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,

V. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,

VI. නිශ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍ය වලින් ඉතිරිවන කොටස් හෝ නිශ්පාදනයේදී ලැබෙන හා අතුරු නිශ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,

VII. අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(2) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතුය.

11. බේකරියේ පාවිච්චිය සඳහා තබා ගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය ගබඩා කිරීමට ඒ සඳහා ම වෙන්වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිත වූ ද මැස්සන්ට හෝ වෙනත් කෘමි සතුන් සහ මීයන්ට ඇතුල්විය නොහැකි වූද ලෙස ද ආර්ෂා කර තිබිය යුතුය.

12. 11 වන වගන්තියේ සඳහන් ගබඩා කාමරයේ පිටි ගබඩා කිරීමේදී, අවම වශයෙන් පොළොව මට්ටමෙන් සෙන්ටි මීටර් 20 ක් උස පාද මත තැනූ ලෑලි තට්ටුවක් යොදා ගත යුතු අතර එකී ලෑලි තට්ටුව හිස්ව තිබෙන විට එය පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි ආකාරයෙන් නිම කර තිබිය යුතුය.

එසේම එකී ලෑලි තට්ටුව යටින් මීයන්ට සහ කවර හෝ වර්ගයක කෘමීන්ට රැඳී සිටිය නොහැකි වන සේ ආවරණය කර තිබිය යුතුවාත් හැර අවම වශයෙන් බිත්තියෙන් සෙන්ටි මීටර් 23 ක් ඈතින් තබා තිබිය යුතුය.

13. 12 වන වගන්තියේ සඳහන් ලෑලි තට්ටුව අවම වශයෙන් මාසයකට දෙවරක් බැඟින් කාමරයෙන් පිටතට ගෙන පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

14. බේකරියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැඟින් වනසේ වැසිකිළි සකස් කර තිබිය යුතුවාත් හැර කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම වැසිකිළි තිබිය යුතුය. එසේම එකී වැසිකිළි බේකරියේ කාමරවල සිට අවම වශයෙන් මීටර් 15 ක් දුරින් ස්ථානගත කර තිබිය යුතුය.

15. බේකරියේ සේවයේ නියුක්ත සෑම සේවකයකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතුය.

16. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් සෑම ස්ථානයක ම හොඳින් පෙනෙන තැනක සම්මත පඩි සහිත තරාදියක් හෝ වෙනත් කිසියම් වර්ගයක සම්මත තරාදියක් තැබීමට සැලැස්වීම සහ කිසියම් ගණුදෙණුකරුවකු විසින් ඉල්ලා සිටි විට විකුණන හෝ විකිණීමට ප්‍රදර්ශණය කර ඇති යම් බේකරි නිශ්පාදනයක බර කිරා බැලීමට හෝ බර කිරා පෙන්වීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

17. කිසියම් බේකරියක නිශ්පාදනය කරන බේකරි නිශ්පාදන බලපත්‍රලාභියා විසින්ම ප්‍රවාහනය කිරීම කරනු ලබන්නේ නම් ඒ සඳහා දූවිලි හෝ වෙනත් අපද්‍රව්‍ය හෝ ජලය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ පෙට්ටි යොදා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

18. උපලේඛන 1 හි අයදුම්පත්‍රය මගින් කරන ලද ඉල්ලීමක් මත තත් කාර්ය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ බේකරියක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

19. බේකරි නිශ්පාදන සඳහා යොදා ගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය කල් ඉකුත් වීමේ දිනය ප්‍රමාණවත් කාලයක් ඉදිරියට පවතින්නේ නම් මිස කවර හෝ අවස්ථාවක එකී ද්‍රව්‍ය බේකරි නිශ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම නොකළ යුතුය.

20. (1) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ වෙනත් චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමේදී යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාධන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(2) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැතෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

21. බේකරි නිශ්පාදන සඳහා මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ජලය යොදා ගැනීම නොකළ යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර බේකරියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතුය. එසේ වුවද බේකරියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් මෙයට ඇතුළත් නොවිය යුතුය.

23. බේකරියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18 කට අඩු දුරකින් කසළ වලක්, හෝ පොහෙර වලක්, වැසිකිළි වලක් හෝ අළු වලක් හෝ ස්ථානගත කර නොතිබිය යුතුය.

24. කවර හෝ තැනැත්තෙකු විසින් බේකරිය ඇතුළත දුම්බීම හෝ බුලත් සැපීම හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යක් සැපීම හෝ ආහාර ගැනීම හෝ නොකළ යුතුය.

25. කිසියම් බේකරියක් පවත්වාගෙන යාම සඳහා නගර සභා පනතේ 164 වගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේය.

26. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාල කටයුතු නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා පැවරී ඇති බලය සභාපතිවරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිසා නීත්‍යානුකූල වන්නේය.

27. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් විය යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිළධාරියෙකුට, පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට බේකරියේ නිශ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

29. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බේකරියක නිශ්පාදනය කොරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

30. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිළධාරියෙකුට බලය තිබිය යුතු අතර, කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්ෂා කිරීම් සඳහා සහභාගිවීම බලපත්‍ර ලාභියාගේ කාර්යය විය යුතුය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු වන්නේය.

31. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බේකරියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන වගන්තියේ සඳහන් කවරහෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ අතුරු ව්‍යවස්ථාවේ වෙනත් කිසියම් වගන්තියක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියළු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

32. 31 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

33. 32 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

34. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව නගර සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දිය යුතුය.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

36. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විදිවිධානයක් උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපති විසින් කරනු ලබන නියමයන්ට අනුකූල නොවී කටයුතු කිරීම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් වන අතර, එකී වරදක් කරනු ලබන සෑම තැනැත්තෙක්ම එම වරද සම්බන්ධයෙන් නිසි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු

ලැබූ පසු 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 153 අ වන වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"සභාපති" යන්නෙන් තත්කාලයෙහි නගර සභාවේ සභාපති ධූරය දරණ තැනැත්තාද,

"ලේකම්" යන්නෙන් නගර සභාවේ ලේකම් ධූරය දරණ තැනැත්තාද

"බලයලත් නිලධාරියා යන්නෙන් තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරා ඇති නගර සභාවේ නිලධාරියෙකුද"

"සභාව" යන්නෙන් අදාල නගර සභාවද

"බේකරි නිශ්පාදන" යන්නෙන් විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත කිසියම් බේකරියක නිපදවන පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ කිසියම් රස කැවිලිද,

"බේකරිය" යන්නෙන් විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ කිසියම් රස කැවිලි සාදන යම් ස්ථානයක් අදහස් වන අතර එවැනි ආහාර පිළියෙල කරනු ලබන හෝ එවැනි ආහාර පිළියෙළ කිරීම සඳහා ද්‍රව්‍ය ගබඩා කර තබන කිසියම් ස්ථානයක්ද,

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ බලපත්‍රයක් ලබා ගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් කරන අතර, එකී බලපත්‍ර ලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින තැනැත්තෙකුද

"බලපත්‍ර ලත් ස්ථානය" යන්නෙන්මෙහි කවර වගන්තියක හෝ නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමටද, එකී ස්ථානයද, අදහස් වේ.

උපලේඛණ අංක 1

**------------------------ නගර සභාව**

**වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන අවදුම්පත්‍රය - 20....... වර්ෂය**

1. කර්මාන්තය / වෙළඳාම හිමිකරුගේ නම

2. පෞද්ගලික ලිපිනය :

3. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

4. දුරකථන අංකය :
   ජංගම:
   නිවාස:

5. කර්මාන්තයේ / වෙළඳ ව්‍යාපාරයේ නම :

6. කර්මාන්තයේ / යවළඳාමේ ස්වභාවය :

   කර්මාන්තය /වෙළඳාම කරන ස්ථානයේ -
   (1) ලිපිනය

   (2)වීථියේ / පාරේ නම

   (3) දුරකථන අංකය

7. කර්මාන්තය / වෙළඳාම කරගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ අංකය :

කොට්ඨාශයේ නම :

8. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබා ගෙන ඇත්නම් එහි යොමු අංකය :
9.
10. කර්මාන්තය / වෙළඳාම කරගෙන යන ස්ථානයේ කළසනාකරුගේ / නියෝජිතයාගේ නම :

11. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

12. දුරකථන අංක :

ජංගම : ...............................................
නිවාස :...............................................

සභාපති

---------------------------

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය / වෙළඳාම පවත්වාගෙන යන ස්ථාන සඳහා 20..... වර්ෂය වෙනුවෙන් කර්මාන්ත / වෙළඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීති රීති වලට මම එකඟ වෙමි.

දිනය : 20.............................

..................................
ඉල්ලුම්කරුගේ අත්සන